## 2026.07.14 දින පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ පවත්වන ලද මහාසභා රැස්වීමේ රැස්වීම් වාර්තාව

### රැස්වීම සඳහා සහභාගිවූ ගරු මන්ත්‍රීවරුන්

1. ගරු ප්‍රාදේශීය සභා සභාපති යහලවෙල ගෙදර සංජීව කරුණාසාගර මහතා
2. ගරු ප්‍රාදේශීය සභා උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මැණිකාමාර දූරයලාගේ මනෝ කුමාර එදිරිසිංහ මහතා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අලහකෝන් පතිරන්නැලාගේ තරංග වම්පික අලහකෝන් මහතා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි දෙලංකාගේ නිමාලි දිල්හානි මෙනෙවිය
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කඩුකාර මුදියන්සේලාගේ නන්දසිරි මහතා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දසනායක ගුණරත්න බස්නායක මුදියන්සේලාගේ චාමින්ද දසනායක මහතා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහමායාගොඩගේ විරාජ් මලින්ද ඩයස් මහතා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හේරත් මුදියන්සේලාගේ ප්‍රදීප් සුජීව හේරත් මහතා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඉදිරිප්පුලිගේ සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි මුතුගල නිශාන්ති ගුණතිලක මහත්මිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පනම්බර මුදියන්සේලාගේ කුමාරසේන ජයලත් මහතා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අගාරේ ගෙදර දූරයාලගේ රංජිත් ප්‍රේමලාල් මහතා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි නිමල්කා කොටඹගේ මහත්මිය
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හේරත් මුදියන්සේලාගේ නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්පටිදේවගේ ලාලිත ඉඳුනිල් මහතා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කුරුප්පු මුදියන්සේලාගේ අජිත් තිලකසිරි මහතා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හේරත් මුදියන්සේලාගේ සමරසිංහ කීර්ති බංඩාර හේරත් මහතා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජේන්ද්‍ර ගල්අද්දලාගේ අජිත් ලක්ෂ්මන් මහතා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අකුරන් ජේඩි දූරයලාගේ ඉෂාන් මධුශංක පීරිස් මහතා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසේ හේවගේ මාලක අරුණ කුමාර මහතා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එදිරිසිංහ ආරච්චිලාගේ ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රහ්මචාරිගේ සුදත් උදය කුමාර මහතා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයසිංහ මුදියන්සේලාගේ දිලිප් ජයසිංහ මහතා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රත්නායක මුදියන්සේලාගේ උපුල් නිශාන්ත මහතා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විස්කම් නන්දන වඩු ආචාරිගේ රංජිත් නවරත්න මහතා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මාපා අශෝක හේරත් මහතා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රාධිපතියලාගේ රංජිත් අබේපාල මහතා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්හොටි හලුවන්නැහැලාගේ රංජිත් උපාලි මහතා
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහම්මදු තාහීර් මොහමඩ් තස්ලිම් මහතා
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රාජගුරු දිසානායක මුදියන්සේලාගේ ජයන්ත දිසානායක මහතා
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි වීරරත්න තෙන්නකෝන් මුදියන්සේලාගේ චාන්දනී දීපිකා රත්නායක මහත්මිය
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි රාජකරුණානායක මුදියන්සේලාගේ නිලන්ති විජේසිංහ මහත්මිය
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහමඩ් කබීර් රිෆාක් හුසේයින් මහතා
35. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දොලවත්තගේ දොන් සිරන්ත පද්මලාල් මහතා
36. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මල්ලව ආරච්චිලාගේ මංජුල ප්‍රසන්න මල්ලව ආරච්චි මහතා

## රැස්වීම සඳහා සහභාගි නොවූ ගරු මන්ත්‍රීවරුන්

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි සේනානායක මුදියන්සේලාගේ සජිනා සුරංගි මහත්මිය
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බන්නැහැක මුදියන්සේලාගේ ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය

## ආගම සිහි කිරීම.

ප්‍රථමයෙන් ජාතික ගීය වාදනය කිරීමෙන් , ආගම සිහිකිරීමෙන් අනතුරුව මිය ගිය රණවිරුවන් සිහිකර ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 10.00 ට පමණ ගරු සභාවේ කටයුතු න්‍යාය පත්‍රානුකූල ආරම්භ කරන ලදී. 2026 ජුලි මස මහා සභා රැස්වීමට සහභාගි වන ගරු උප සභාපති තුමා , ප්‍රාදේශීය සභා මන්ත්‍රී මණ්ඩලය ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරී ඇතුළු කාර්යමණ්ඩල නිලධාරීන් , මාධ්‍යවේදීන් ඇතුළු සහභාගි වී සිටින සියළුදෙනාට ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරන ලද අතර සියළුදෙනාම ගෞරවයෙන් පිළිගන්නා ලදී.

## 06 (අ). 1.පසුගිය මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම .

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

2026.06.09 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව සම්මත කරගන්නා ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු උපසභාපති බන්දුල සමරවික්‍රම මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා ගරු මන්ත්‍රි තුමන්ලා තුමියන්ලා ගෙන් වගේම කාර්ය මණ්ඩලයේ සියළු දෙනාගෙන් අවසරයි.පසුගිය සභා වාර්තාව සංශෝධන සහිතව ඇත්නම් ඒවාද සහිතව සම්මත කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ඒ.රංජිත් නවරත්න මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. කාර්ය මණ්ඩලයේ සියළු දෙනාගෙන් අවසරයි. ගරු උප සභාපතිතුමා විසින් සිදු කරනු ලැබූ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)**

ගරු සභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි.මේකෙ 7 වෙනි පිටුවෙ.සභාපතිතුමා විසින් ප්‍රකාශ කරනවා කියලා සඳහන් වෙලා තියනවා. මේක සභාපතිතුමා විසින් කියපු ප්‍රකාශයක්ද?මේ අභ්‍යන්තර විගණන වාර්තාව වැරදියි. අපි මේ වාර්තාව සම්මත කරා කියලා පිලිගත්තා කියන එක වැරදියි. ඒ ප්‍රකාශය කරන්නෙ කව්ද කියන එක පැහැදිලි කරන්න.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

ඒක ඔබතුමා විසින් කල,ප්‍රකාශයක්.ඒක සංශෝධනය වෙනවා.මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)**

ඊළගට වාචික ප්‍රශ්න වල 9 වෙනි ප්‍රශ්නෙ.7 පිටුවෙ ගෑස් ප්‍රමාණය හරිද කියලා.9.එය නිවැරදිද නම්, 2025 වර්ෂය සඳහා ගෑස් සිලින්ඩර 210 භාවිතයට ගෙන ඇත.ඒකක ප්‍රමාණය කි. කි.ග්‍රෑම් 37.5 ලෙස සඳහන් වේ.මුළු ගෑස් කි.ග්‍රෑම් ප්‍රමාණය (37.5*210) 7875. ලෙස පිලිගන්නේද?
පිලිතුර නැත කියලා තියෙන්නෙ .ඒක නැත වෙන්න බෑ.ඒක හරි වෙන්න ඕන.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

පිලිතුර නැත තමයි.

**ඒ අනුව පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## (ආ).සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

ඒ යටතේ හෙට්ටිපොල නීතිඥ සංගමයේ සංවිධානයෙන් අපරාධ නීතිය පිළිබඳ එක් දින වැඩමුලුවක් 2026 ජුලි මස 18 වන සෙනසුරාදා දින පෙ.ව. 8.30 සිට ප.ව. 2.00 දක්වා හෙට්ටිපොළ Olina උත්සව ශාලාවේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කරලා තියෙනවා. ලියුම ටේබල් කරලා තියෙනවා. ඒ සඳහා සම්බන්ධ වන මන්ත්‍රී මණ්ඩලයට ආරාධනා කරනවා නීතිඥ සංගමය විසින් ඒකට සම්බන්ධ වෙන්න කියලා.

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව පත්වෙලා අවුරුදු 01 ක් ගතවෙලා තියෙනවා. ගිය අවුරුද්දේ ඒ මාස 06 කට ආසන්න කාලයක් ඒ මාස 06 ට ආසන්න කාලයේ අපි සභාව විසින් 2025 අයවැයේ ඇස්තමේන්තු කල මුදලට වඩා කෝටි 05ක මුදලක් අපි අතිරික්තයක් ලබලා තියෙනවා. ඒ වගේම මේ අවුරුද්දේ අපි පලවෙනි මාස 5 ගතවෙද්දි කෝටි 05ක අතිරික්ත මුදලක් ආදායම් විදිහට ලබලා තියෙනවා .
ඊළඟට ඔබතුමාලට ආරාධනා කරනවා ලියුම ටේබල් කරලා තියෙන්නෙ. 2027 අයවැය පිළිබඳ සාකච්ඡාව සඳහා සියලුම මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා ජුලි මස 23 වන දින 11.00ට සභාවට සම්බන්ධ වෙන්න ඔබතුමාලට අයවැයට යොජනා ඉදිරිපත් කරන්න කියලා ටේබල් කර තිබුනා. ෆෝම් එකක්. නමුත් ගියවර විවාදයේදී අපේ අයවැය පරද්දන්න කටයුතු කරපු ඔබතුමාලා එහිදි ඉදිරිපත් කරපු තර්කේ තමයි අපේ යෝජනා ඉදිරිපත් කරන්න අවස්ථාවක් තිබුනේ නෑ කියලා. ගියවරත් අපි අවස්ථාවක් දීලා තිබුනා. මෙවරත් අපි අවස්ථාවක් දීලා තියෙනවා. දැන් කාලයත් ඉක්ම වෙලා තියෙන්නේ හැබැයි මන්ත්‍රීවරු කිප දෙනෙක් විතරයි අයවැයට යෝජනා ඉදිරිපත් කරලා තියෙන්නෙ. ඒක නිසා කරුණාකරලා ඉල්ලීමක් කරනවා. සියළුම පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් 23 උදේ 11.00ට මේ සාකච්ඡාවට සම්බන්ධ වෙන්න අපි එහිදි අයවැය අතරට අයවැය සංවර්ධන යෝජනා වගේම ආදායම් උත්පාදන මාර්ග පිළබඳ යෝජනා වලට ප්‍රමුඛත්වය දෙන්න කියලා ඉල්ලා සිටිනවා .

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

## (ඇ).ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සන්නිවේදන.

### 1.නිවාඩු අනුමත කිරීම

මීළඟට නිවාඩු අනුමත කිරීම සඳහා සජිතා සුරංගි මන්ත්‍රීතුමියගේ පියා අභාවප්‍රාප්ත වෙලා තියනවා.ඒ වගේම ශ්‍රියානි මානෙල් බන්නැහැක මන්ත්‍රීතුමියටත් නිවාඩු ඉල්ලලා තියනවා.

<u>ගරු උපසභාපති බන්දුල සමරවික්‍රම මහතා - (ජා.ජ.බ)</u>

නිවාඩු ඉල්ලලා තියෙන මන්ත්‍රීවරියන් දෙදෙනා සඳහා නිවාඩු ලබා දීම සුදුසු යැයි මා යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රීනී නිමල්කා කොටඹගේ මහත්මිය - (ජා.ජ.බ)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි සේනානායක මුදියන්සේලාගේ සජිනා සුරංගි මහත්මිය වෙත ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බන්නැහැක මුදියන්සේලාගේ ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය වෙත නිවාඩු අනුමත කරන ලෙසට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

### 11.2026.05.27 වන දින මුදල් හා ප්‍රතිපත්ති කමිටුව සඳහා සහභාගී නොවු මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.

2026.05.27 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුව සඳහා සහභාගී නොවු ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රිනී ඊ.ඒ.ඉරාෂි ප්‍රියදර්ශණී මහත්මිය, ගරු මන්ත්‍රි ඩී.ඩී.එස් පද්මලාල් දොලවත්ත මහතා, ගරු මන්ත්‍රී ඩබ්.ජී.අජිත් ලක්ෂ්මන් මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රි ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා, වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමනි, 2026.05.27 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුව සඳහා සහභාගී නොවු ගරු මන්ත්‍රිවරුන් හා මන්ත්‍රිවරියන්හට නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රී එස්.එච්. මාලක අරුණ කුමාර මහතා- (ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. මං ඒ යෝජනාව ස්ථිර කරනවා.

.

**ඒ අනුව 2026.05.27 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුව සඳහා සහභාගී නොවු ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රිනී ඊ.ඒ.ඉරාෂි ප්‍රියදර්ශණී මහත්මිය, ගරු මන්ත්‍රි ඩී.ඩී.එස් පද්මලාල් දොලවත්ත මහතා, ගරු මන්ත්‍රී ඩබ්.ජී.අජිත් ලක්ෂ්මන් මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රි ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා, වෙත නිවාඩු අනුමත කරන ලෙසට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

**IV. 2026.06.30 වන දින කාර්මික සේවා කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.**

2026.06.30 වන දින පැවති කාර්මික සේවා කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රිනී නිමල්කා කොටඔගේ මහත්මිය, ගරු මන්ත්‍රිනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය, ගරු මන්ත්‍රී එම්.කේ.ආර් හුසේයින් මහතා, , ගරු මන්ත්‍රී ඩී.ඩී.එස් පද්මලාල් මහතා, වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු උපසභාපති බන්දුල සමරවික්‍රම මහතා - (ජා.ජ.බ)**

2026.06.30 වන දින පැවති කාර්මික සේවා කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් හට නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රිනී රී.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය - (ජා.ජ.බ)**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව 2026.06.30 වන දින පැවති කාර්මික සේවා කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රිනී නිමල්කා කොටඔගේ මහත්මිය, ගරු මන්ත්‍රිනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය, ගරු මන්ත්‍රී එම්.කේ.ආර් හුසේයින් මහතා, ගරු මන්ත්‍රී ඩී.ඩී.එස් පද්මලාල් මහතා, වෙත නිවාඩු අනුමත කරන ලෙසට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

**V 2026.06.24 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.**

2026.06.24 වන දින පැවති පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රී ඩබ්.ජී.අජිත් ලක්ෂ්මන් මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, එම්.ටී.එම්.තස්ලිම් මහතා, ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා, වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමනි, 2026.06.24දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන්හට නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රිනී රී.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. මං ඒ යෝජනාව ස්ථිර කරනවා.

**ඒ අනුව 2026.06.24 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රී ඩබ්.ජී.අජිත් ලක්ෂ්මන් මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, එම්.ටී.එම්.තස්ලිම් මහතා, ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා, වෙත නිවාඩු අනුමත කරන ලෙසට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

**VI.2026.06.24වන දින පැවති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.**

2026.06.24 වන දින පැවති පැවති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රී ඩබ්.ජී.අජිත් ලක්ෂ්මන් මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, එම්.ටී.එම්.තස්ලිම් මහතා, ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා, වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමනි, 2026.06.24දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන්හට නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රිනී රී.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. මං ඒ යෝජනාව ස්ථිර කරනවා.

**ඒ අනුව 2026.06.24වන දින පැවති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රී ඩබ්.ජී.අජිත් ලක්ෂ්මන් මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, එම්.ටී.එම්.තස්ලිම් මහතා, ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා, වෙත නිවාඩු අනුමත කරන ලෙසට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

ගරු මන්ත්‍රිනී නිශාන්ති ගුණතිලක මහත්මිය සංදේශයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ඉල්ලලා තියනවා.ඒක ඉදිරිපත් කරන්න.

**<u>ගරු මන්ත්‍රීනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමනි ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.කාර්ය මණ්ඩලයේ සියළු දෙනාගෙන් අවසරයි.ගරු සභාපතිතුමනි ප්‍රාදේශීය සභාව අමතා සංදේශයක් බණ්ඩාර කොස්වත්ත, හිඳගොල්ල වසමේ H.M ශාන්ති චන්ද්‍රලතා ඉදිරිපත් කරලා තියනවා.අංක 35 වෙළඳ කුටිය සම්බන්ධව.එතුමිය විසින් සඳහන් කරපු සංදේශයේ සඳහන් වෙනවා.ඉහත නම සඳහන් මාගේ ස්වාමිපුරුෂයා නමින් පවත්වාගෙන ගිය අංක 35 දරණ වෙළඳ කුටිය මා හට පවත්වාගෙන යාමට නොහැකි බැවින් එය සභාව වෙත භාරදීමට කටයුතු කරන අවධියේ මෙය ආසන්නයේ රෝගීව ජීවත් වන M.P.R.ඉන්ද්‍රරත්න යන අය එය ලබා ගැනීමට හැකි දැයි මගෙන් විමසන ලදි. එහෙත් මා පැවසුයේ සභාව දැනුවත්ව ලබා ගන්නා ලෙසයි. එහෙත් පසු දිනක ඔහු එම කුටිය රැගෙන ගොස් ඇති බව මා දැනගත් අතර එය සභාව වෙත දන්වන ලදි . එහෙත් මෙම කරුණ පිළිබඳව අප කොට්ඨාශ මන්ත්‍රීතුමිය දැනුවත්ව මෙම වෙළඳකුටිය අස්ථානගත වූවායි පවසා සභාව විසින් වාරියපොල පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් දමා ඇති බව දැන ගන්නට ලැබුණි.එහෙත් මෙම අංක 35 දරණ වෙළඳ කුටිය එම ස්ථානයට රැගෙන යාම පිළිබඳව අප කොට්ඨාස මන්ත්‍රීතුමිය කිසිවක් නොදන්නා බව මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.මෙමගින් සභාව විසින් කරුණු සොයා නොබලා නීතිය ක්‍රියාත්මක කිරීම කනගාටුදායක කරුණක් බව මම මෙයින් ප්‍රකාශ කර සිටින්නෙමු.

මෙතුමියගේ සංදේශය මේක තමයි. ඉතින් සභාපතිතුමනි මෙම කුටිය රැගෙන ගිය ඉන්ද්‍රරත්න මහත්තයත් සංදේශයක් දීලා තියෙනවා. ඒක අවශ්‍ය නෑ මේ අවස්ථාවේ කියවන්න. එදා සභාව විසින් පැමිණිල්ල අස්කර ගන්නට ගිය වෙලේදි එතුමා පොලිසියට පැමිණ OIC මහත්තයා ඉදිරියේ ප්‍රකාශයක් කරලා තිබුනා මන්ත්‍රී තුමිය කිසිවක් මේ බව දන්නේ නෑ කියලා.

මේ වෙනුවෙන් මටත් සුළු දෙයක් ප්‍රකාශ කරන්න තියෙනවා. කිසිකෙනෙක් ගැන අමනාපයක් නෑ. කණගාටුවක් තියෙනවා. නීතියේ රැහැනට අහු වෙද්දි කාන්තා, පිරිමි කොට්ඨාශ දෙකට බලපාන්නේ මේක දෙයාකාරයකට.මම පසුගිය සභාවාරයෙත් වසර 05ක් කටයුතු කලා. අපි සංවර්ධනයට දායක වූවා මිසක් කවදාවත් නීතියේ රැහැනට අහුවෙන්න වැඩ කරලා නෑ. මම ඉල්ලා සිටින්නේ අපේ මන්ත්‍රිවරියන්ගෙනුත් මේ වගේ දේවල් වලට සැලෙන්න එපා කියලා.පැය 24 ක් යන්න මත්තෙන් මගෙන් මේ ගැන කරුනු නොවිමසා නීතියේ කටයුතු කිරීම ගැන මම කණගාටුවෙනවා.මගේ කිසිම අමනාපයක් නෑ.අනවබෝධයෙන් කටයුතු කලා කියලයි මං හිතන් ඉන්නෙ. සභාව විසින් මේ පැමිණිල්ල ඉවත් කරගත්ත එකත් ලොකු දෙයක්.ඒකට ස්තුතිවන්ත වෙනවා ඕඅයිසී මහත්තයා හරිම විනිවිද භාවයෙන් කටයුතු කළ ආකාරය පිලිබඳව.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

ගරු මන්ත්‍රිතුමිය, ඔබතුමිය ඔය සංදේශ 2ක් අරගෙන ඇවිල්ලා තියනවනෙ.හැබැයි ඔය ප්‍රකාශ කරපු අය ආදායම් නිලධාරිගෙ වාර්තාවෙ තියනවා.ඔබතුමිය මැදිහත් වෙලා මෙය සිදු කලා කියලා ප්‍රකාශ කලා කියලා. මමයි, ලේකම්තුමියයි අත්සන් කරලා තියනවා ඒ වාර්තාව.

**<u>ගරු මන්ත්‍රී නිමල්කා කොටඹගේ මහත්මිය - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.කාර්ය මණ්ඩලයේ සියළු දෙනාගෙන් අවසරයි.සංදේශයක් ඉදිරිපත් කරලා තියනවා.

කිරිමැටියාගම.පනාපිටිගම වත්ත,බොරළුවැව.2026.07.10.ගරු සභාපතිතුමා ප්‍රාදේශීය සභාව,පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව,ගරු සභාපතිතුමා වෙත ,ප්‍රදේශයේ සිදු කරන ලද සංවර්ධන කටයුතු පිළිබඳව ප්‍රසාදය පළ කිරීම සහ ස්තුතිය පුද කිරීම දෝතැල්ල කොට්ඨාසයේ කහටවිල ග්‍රාම නිලධාරී වසමේ කිරිමැටියාගම -පනාපිටිගම වත්ත මාර්ගය කිරිමැටියාගම ,පනාපිටිගම වත්ත ප්‍රදේශයේ ජනතාව වන අප ,ඔබ ප්‍රදේශීය සභාව මගින් අපගේ ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් දරන ලද වෙහස මහන්සිය අගය කොට සැලකීමට මෙම ස්තුති සංදේශය ඉදිරිපත් කරමු.විශේයෙන්ම,අප ප්‍රදේශයේ දීර්ඝ කාලයක් පුරා අබලන්ව පැවති කිරිමැටියාගම -පනාපිටිගම වත්ත මාර්ගය මෝටර් ග්‍රේඩරය යොදා ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සාර්ථකව සිදුකර ප්‍රදේශවාසීන්ගේ දිගුකාලීන අවශ්‍යතා ඉටු කිරීම වෙනුවෙන් පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා,ගරු උප සභාපතිතුමා,ලේකම්තුමා,තාක්ෂණික අංශය,මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර ක්‍රියාකරු ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයට

අපගේ හෘදයාංගම ස්තූතිය පුද කරමු.තවද, මෙම කාර්ය සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය සහ කැපවීමෙන් කටයුතු කළ දෝතැල්ල කොට්ඨාශ මන්ත්‍රීනියට සහ කහටවිල ප්‍රජා ශක්ති සභාවේ සභාපතිතුමාට විශේෂ ස්තූතිය හිමි වේ.මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරිම තුළින් පාසල් දරුවන් , ගොවීන් සහ ප්‍රදේශවාසීන්ට ආරක්ෂිත හා පහසු ගමනාගමනයක් උදා වී ඇති අතර , ජනතා අවශ්‍යතා හඳුනාගෙන ඒවාට කඩිනමින් ප්‍රතිචාර දක්වන සියලු පාර්ශවයන්ට නැවතත් අපගේ ගෞරවය හා කෘතඥතාව පිරිනමමු.තවද,මෙම මාර්ගයේ ඉතිරි කොටස්ද හැකි ඉක්මණින් ප්‍රතිසංස්කරණය කර අවසන් කර දෙන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමු. එමගින් කිරිමැටියාගම-පනාපිටිගම වත්ත මාර්ගය සම්පූර්ණයෙන්ම ජනතාවට ආරක්ෂිත හා පහසු ගමනාගමනය සඳහා භාවිත කළ හැකි වන අතර , ප්‍රදේශවාසීන්ගේ දිගුකාලීන අවශ්‍යතාවයක් සම්පූර්ණයෙන් ඉටු වනු ඇතැයි අප විශ්වාස කරමු.ඉදිරියටත් අප ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා මෙවැනිම සහයෝගයක් අපේක්ෂා කරන අතර ,ඔබ සභාවේ ඉදිරි කටයුතු සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමු.මීට විශ්වාසී ,කිරිමැටියාගම-පනාපිටිගම වත්ත ප්‍රදේශවාසීන්

## (ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

**1.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා විසින් සභාගත කරන වාචික ප්‍රශ්න**

**ප්‍රශ්නය**

1.2025.07.12 දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ අංක 4 යටතේ ,ජල උපකරණ සැපයීම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම යටතේ මිල ගණන් ඉදිරිපත් කර අනුමත කල බව ලිපිගන්නේද?

**පිලිතුර**

**ඔව්**

**ප්‍රශ්නය**

2.එම මිල ගණන් යටතේ කමිටුව විසින් අඩුම මිල සහ ප්‍රමිතිය අනුව ඇණවුම භාරදෙන බව පිලිගන්නේද?

**පිලිතුර**

**නැත.තාක්ෂණ ඇගයීම් කමිටුවට යොමුකර එහි නිර්දේශය ලබාගෙන ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කිරීමෙන් පසු පිලිගනී.**

**ප්‍රශ්නය**

3.ඒ අනුව කමිටුවෙන් සභාවට අනවශ්‍යය සභාවේ භාවිතයට නොගන්නා භාණ්ඩ තාක්ෂණ නිලධාරීන් හා ගබඩා භාරකරුගේ නිර්දේශය මත කමිටුවට ඉදිරිපත් කර ඇති අතර සභාපතිතුමා නිර්දේශය මත කමිටුවට ඉදිරිපත් කර ඇති අතර සභාපතිතුමා හා මිලදී ගැනීමේ නිලධාරී විසින් එය අනුමත කර මිලට ගෙන ඇති බව පිලිගන්නේද?

**පිලිතුර**

**නැත**

1.අගල්4 පී.වී.සී. බට 10 රු.6950.00 මිල ගණන් යටතේ මිලට ගැනීමට අනුමත කර ඇති බවත්

11.අගල්6 පී.වී.සී. බට 10 රු.12300 මිල ගණන් යටතේ මිලට ගැනීමට අනුමත කර ඇති බවත් , එම අනුමත කල පී.වී.සී. බට 20 ප්‍රමාණය 2025.07.18 ගබඩාවට සැපයීම කල බව පිලිගන්නේද? මුළු වටිනාකම රු.192,500.00 නොවන්නේද?

**පිලිතුර**

**ඔව්**

**ප්‍රශ්නය**

4.පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට දැන් සෘජුව ක්‍රියාත්මක වන ජල යෝජනා ක්‍රම ඇත්තේ පොල්තවාන සහ බණ්ඩාරකොස්වත්ත ජල යෝජනා ක්‍රම පමණකි.තවම මිලදී ගැනීමට අනුමැතිය ලබා දී ඇති පී.වී.සී. බට වර්තමානයේ සභාවේ භාවිතයට නොගන්නා බව පිළිගන්නේද?

**පිලිතුර**

**නැත**

**ප්‍රශ්නය**

5.මේ සඳහා මුදල් ගෙවීම් කර ඇති බව පිළිගන්නේද ?

**පිලිතුර**

**ඔව්**

**ප්‍රශ්නය**

6.මුදල් අවභාවිතය රු.220,000.00 බව සභාවට ප්‍රකාශ කිරීම නිවැරදි නොවන්නේද?

අඟල් 06 බට 10 -12,350 =123,500.00

අඟල් 04 බට 10 -6,950 = 69,500.00

192,500.00

**පිළිතුර**

**අවභාවිතයක් සිදු වී නොමැත.වර්තමානයේ අගල්6 පී.වී.සී. බටයක මිල රු.16,500.00 පමණ වේ**

**ප්‍රශ්නය**

7.මෙම අවභාවිතයට විසඳුම කුමක්ද?

**පිළිතුර**

**අඟල් 4 බට 6 ක් වැසිකිළි අධාර සඳහා ලබා දී ඇත.**

**මූණමල්දෙණිය සති පොලේ උමං ජල කාණුව අළුත්වැඩියා කිරීම සඳහා යොදා ගැනීමට නියමිතව ඇත.**

**අළුතින් නළ ළිං සෑදීම සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත ස්ථාන පරීක්ෂාවක් සඳහා ලිපියක් යොමු කර ඇත.එහිදී එම නළ ළිං ඉදි කිරීම සඳහා එම පී.වී.සී. බට භාවිතා කළ හැක.**

<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>

ඔබතුමා 2 ප්‍රශ්නෙට නැත කියන උත්තරේ තමයි දුන්නෙ.ඒක නැත වෙන්න බැනෙ. කමිටුවට දැම්මනෙ.ඒ කමිටු වාර්තාව මං ගාව තියනවා.

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

ඒ කමිටු තීරණය නැවත කාක්ෂණ ඇගයිම් කමිටුවට දාලා, ප්‍රසම්පාදන කමිටුවට දාලා ඒ කමිටුවලින් තමයි තීරණය ගන්නෙ.ඒකයි ඔය කියලා තියෙන්නෙ.

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

**11.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා විසින් සභාගත කරන වාචික ප්‍රශ්න**

**ප්‍රශ්නය**

1.නවාරා කැබ් රථයටකිලෝමීටරක් වෙනුවෙන් වැයවන ඩීසල් ප්‍රමාණය කොතෙක්ද යන්න යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් නිර්දේශ කර ඇත.එම ප්‍රමාණය කොපමණද?.

**පිළිතුර**

10 කිලෝමීටර්.

**ප්‍රශ්නය**

2.කැබ් රථයේ ධාවන සටහන් එම රියදුරු විසින් පවත්වාගෙන යනවාද?සභාපතිතුමා තනිවම ධාවනය කරන දිනවල එම දුර ප්‍රමාණයන් ධාවන සටහන් වල යොදන්නේ කවුරුන් විසින්ද?

**පිළිතුර**

**ඔව්**

**රියදුරු (ඩබ්.ටී.ලසන්ත ප්‍රදීල් අල්විස්)**

**ප්‍රශ්නය**

3. මසකට නියම කර ඇති ඩීසල් ප්‍රමාණය කොපමණද?

**පිළිතුර**

**ලීටර්500**

**ප්‍රශ්නය**

4.2025 ජනවාරි ලීටර්50

2025 පෙබරවාරි -

2025 මාර්තු - ලීටර්55

2025 අප්‍රේල් -

2025 මැයි -

යන මාසවල නවාරා කැබ්රථයට වැයකර ඇති ඉන්ධන ප්‍රමාණය ඒ ඒ මාසයට අදාලව ඉදිරිපත් කල හැකිද?ඒ ප්‍රමාණය කොපමණද?

**පිළිතුර**

**ඔව්**

5. 2026 ජනවාරි ලීටර් 221
   2026 පෙබරවාරි ලීටර් 290
   2026 මාර්තු ලීටර් 306
   2026 අප්‍රේල් ලීටර් 133
   2026 මැයි ලීටර් 203

යන මාසවලට අදාලව මාසිකව වැයකර ඇති ඩීසල් ලීටර් ප්‍රමාණය එක් එක් මාසයට අදාලව ඉදිරිපත් කලහැකිද?

**පිලිතුර**

**ඔව්**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

**111.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සී.පී.රංජිත් අබේපාල මහතා විසින් සභාගත කරන වාචික ප්‍රශ්න**

**ප්‍රශ්නය**

1.2025.09.25 දින වන විට පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවේ පොදු අරමුදල් ගිනුමේ තිබුණ මුදල් ප්‍රමාණය කොපමණද?

**පිලිතුර**

**2025.09.25 වන දිනට පොදු අරමුදල් ගිණුමේ ශේෂය රු.44,299,638.55 කි.**

**ප්‍රශ්නය**

2.2025.09.25 වල දින වන විට පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවේ ස්ථාවර තැන්පත්වල තිබුන මුදල් ප්‍රමාණය කොපමණද?

**පිලිතුර**

| | |
|---|---|
| ගි.අං.703031100201 | රු.50,000,000.00 |
| ගි.අං.703031100200 | රු.20,000,000.00 |
| ගි.අං.703031100202 | රු.3,049,663.87 |
| ගි.අං.703031100203 | රු.1,531,049.89 |
| ගි.අං.703031100204 | රු.40,000,000.00 |
| මුළු මුදල | රු.<u>114,580,713.76</u> |

3.වර්තමාන සභාපතිතුමා වැඩ භාර ගන්නා දිනයට පොදු අරමුදල් ගිණුමේ තිබුණු මුදල් ප්‍රමාණය කොපමණද? ස්ථාවර තැන්පතු දෙකේ තිබුණ මුදල් ප්‍රමාණය කොපමණද?

**පිලිතුර**

2025.06.13 දිනට පොදු අරමුදල් ගිණුමේ තිබුණු මුදල් ප්‍රමාණය කොපමණද?

රු.45,698,409.73

ස්ථාවර තැන්පතු වල තිබුණු මුදල් ප්‍රමාණය

| | |
|---|---|
| ගි.අං.703031100193 | රු.50,000,000.00 |
| ගි.අං.703031100194 | රු.20,000,000.00 |
| ගි.අං.703031100195 | රු.3,049,663.87 |
| ගි.අං.703031100199 | රු.1,531,049.89 |
| මුළු මුදල | රු.<u>74,580,713.76</u> |

**ප්‍රශ්නය**

4.2026 ජුනි මස 12 වෙනි දිනට සභාව පිහිටුවා වසරත් ගතවේ.සභාවේ පොදු අරමුදලේ හෝ ස්ථාවර තැන්පත්වලින් මුදල් ලබාගෙන විශේෂ ව්‍යාපෘතියකට මෙම වසර තුල යෙදෙව්වාද? එසේ නම් එම වයාපෘතිය කෙරෙන්නේද?

**පිලිතුර**

**ස්ථාවර තැන්පතු වලින් මුදල් ලබාගෙන නොමැත.**

**විශේෂ ව්‍යාපෘති සිදුකර නොමැත.**

**ප්‍රශ්නය**

5.මෙම ගිනුම් වලින් මුදල් ලබා ගන්නේ නම් කවර විෂයන් ක්‍රියාත්මක කිරිමටද යන්න මෙම සභාවට පැහැදිලි කිරීමක් කල හැකිද?

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියට අනුකූලව යම් අතුරු ව්‍යවස්ථාවක් හෝ රීතියක් යටතේ සිය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ එහි කාර්යයන් සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී ප්‍රාදේශීය සභාවට දැරීමට සිදුවන වියදම් සඳහා පොදු අරමුදල යොදා ගනු ලබයි.සෑම මසකම ප්‍රාදේශීය සභාව විසින් දරනු ලබන වියදම් පිලිබද ගෙවීම් මුදල් පොත වාර්ථාව සහ ප්‍රා.ස. 14 වාර්ථාව මහ සභාවේ ගරු මන්ත්‍රී මණ්ඩලය වෙත ඉදිරිපත් කරන අතර එමගින් ප්‍රාදේශීය සභාව විසින් මාසික දරන ලද සියළු වියදම් පිළිබද තොරතුරු ඇතුළත් බව කාරුණිකව දන්වා සිටිමි.**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

## (ඉ) යථා පරිදි කල්දී ඇති යෝජනා

මීළහට විශේෂ යෝජනා කිහිපයක් තියෙනවා.න්‍යාය පත්‍රයට ඇතුළත් කරගන්න. දියීවා සුළි කුනාටුවෙන් හානියට පත් පළාත් පාලන මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම -2026 පළමු අදියර යටතේ ඇමුණුමෙහි සඳහන් දෙවන වරට පලාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අනුමත වී ඇති මාර්ග 22 ටෙන්ඩර් ගතව සිදු කිරීම සුදුසු බවට යෝජනාව.එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරදෙන්න.

<u>**ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)**</u>

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු සභාපති වයි. ජී. සංජීව කරුණාසාගර මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති දියීවා සුළි කුනාටුවෙන් හානියට පත් පළාත් පාලන මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම -2026 පළමු අදියර යටතේ ඇමුණුමෙහි සඳහන් දෙවන වරට පලාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අනුමත වී ඇති මාර්ග 22 ටෙන්ඩර් ගතව සිදු කිරීම සුදුසු බවට පිලිබද යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

මීළගට . පරිපූරක ඇස්තමේන්තුව අංක -02 යෝජනාව ඉදිරිපත් කරනවා. එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරදෙන්න.

<u>**ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)**</u>

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු සභාපති වයි. ජී. සංජීව කරුණාසාගර මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලද පරිපූරක ඇස්තමේන්තු අංක 2 පිලිබද යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදි**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

මීළගට .චාමින්ද දසනායක මන්ත්‍රිතුමා විසින් ඉදිරිපත් කරන පහුගිය 05,06 දින දෙකේ මීගමුව බන්ධනාගාරය තුල සිදු වු අවසනාවන්ත සිදුවී මෙන් මිය ගිය බන්ධනාගාර නිලධාරින් හා රටේ පුරවැසියන් වන රුදවියන් වෙනුවෙන් ශෝකය පල කිරීම වෙනුවෙන් ඉදිරිපත් කරන යෝජනාව එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරදෙන්න.

<u>**ගරු මන්ත්‍රිනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)**</u>

ගරු සභාපතිතුමා, ඇතුළු වගේම ගෞරවනීය මන්ත්‍රිතුමනි,තුමියනි ලේකම්තුමිය කාර්ය මණ්ඩලය සියළු දෙනාගෙන් අවසරයි.එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු මන්ත්‍රී ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

මීළගට. ගරු මන්ත්‍රිනී ඩබ්.ටී.එම්. චාන්දනී දීපිකා රත්නායක මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති දැනට මගේ කොට්ඨාශය තුල අක්‍රියව ඇති වීදි පහන් නැවත සක්‍රිය නොකිරීම හා අත්‍යවශ්‍ය ස්ථාන කීහියපකට නව වීදී පහන් සවි

නොකිරීම සම්බන්ධ කරුනු විමසිමේ යෝජනාව. එම යෝජනාව රැස්විම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරදෙන්න.

<u>ගරු මන්ත්‍රීනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)</u>
එම යෝජනාව රැස්විම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු මන්ත්‍රීනී ඩබ්.ටී.එම්. චාන්දනී දීපිකා රත්නායක මහත්මිය ගරු සභාවට ඉදිරිපත් කර ඇති යෝජනාව රැස්විම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>
මීළගට. ගරු මන්ත්‍රී එම්.ඩී. මනෝ කුමාර එදිරිසිංහ මහතා විසින් ඉදිරිපත් කර ඇති දිලීප පිරිස් ජනාධිපති නිතිඥයා විසින් රණවිරුවන් අපහාසයට ලක් කිරීම හා ඒ වගේම සමස්ථ රණවිරුවන් ඇගයිමේ යෝජනාව රැස්විම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරදෙන්න.
<u>ගරු මන්ත්‍රී සී.පී. රංජිත් අබේපාල මහතා - (ස්වාධීන)</u>
එම යෝජනාව රැස්විම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු මන්ත්‍රී එම්.ඩී. මනෝ කුමාර එදිරිසිංහ මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති යෝජනාව රැස්විම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>
**(ඉ) I.** <u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩී.එම්.ජේ.දිසානායක මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). I දරණ යෝජනාව**</u>
ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.
<u>ගරු මන්ත්‍රී ආර්.ඩී.එම්. ජයන්ත දිසානායක මහතා - ( ස.ජ.බ)</u>
ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි. මා විසින් ගෙන ආ යොජනාව දෝතැල්ල කොට්ඨාශයේ 1326 කහටවිල ග්‍රාමසේවක වසමේ කිරිමැටියාගම පනාපිටිගම වත්ත(පන්ඩුක පුර) ග්‍රාමයේ ඇති ගමට පිවිසෙන මාර්ගය ජනතාවට ගමන් කිරීමට අපහසුවන අන්දමින් කැඩී ගොස් ඇති බැවින් එම මාර්ගය ප්‍රාදේශීය සභා සතු මාර්ගයක් නිසා ඉතා කඩිනමින් සංවර්ධන කිරීම සුදුසු යැයි සභාවට මා යෝජනා කරනවා.
<u>ගරු මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා - (සර්ව ජන බලය)</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.
<u>ගරු මන්ත්‍රී ආර්.ඩී.එම්. ජයන්ත දිසානායක මහතා - ( ස.ජ.බ)</u>
ගරු සභාපතිතුමනි දෝතැල්ල කොට්ඨාශයේ පනාපිටිගම ගම්මානය මං හිතන විදිහට පවුල් 175ක් විතර ගැවසෙන ගම්මානයක් පසුගිය දිට්වා සුළි කුණාටුව සහ ඊට පසුව ඇද හැලුන අධික වර්ෂාපතනය නිසා එම ගමට පිවිසෙන ප්‍රධාන මාර්ගය ගම මැද හරියෙන් ගමෙන් පල්ලෙහාට යන කොටස බොහොම අබලන් තත්වයට පත්වෙලා තියෙන්නේ මම යොජනා කරන්නේ ගරු සභාවට එම මාර්ගය මොටර් ග්‍රේඩර් කරලා ෂේප් කරන්නේ නැතිව එම මාර්ගය තාර හෝ කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම සුදුසු බව තමයි යෝජනා කරන්නේ. මොකද එම ප්‍රදේශයේ ජනතාවට ගිරාතලාන සිට බොරළුවැව ප්‍රධාන මාර්ගයට පිවිසීමට තියෙන එකම මාර්ගයයි .එම මාර්ගය ප්‍රධාන මාර්ගයට මීටර් 500ක් විතර මෙහායින් තාර දමා සකස් කරලා තියෙනවා එකත් සමහර තැන්වල වළවල් හැදිලා දැන් අබලන් තත්වයට පත් වෙලා තියෙන්නේ ඉතුරු ටික පල්ලෙහට යන ටික අඩුම තරමේ කිලෝමීටරයක්වත් තාර දමා සංවර්ධනය කරනවා නම් එම ජනතාවට කරන සේවයක්. මගෙ කොට්ඨාශයේ තවත් මන්ත්‍රීවරියන් දෙදෙනෙක් සිටිනවා එම මන්ත්‍රීවරියන්ටත් මට වගේම එම ප්‍රදේශයේ ජනතාව මතක් කරනවා ඇති එම මාර්ගය සකසා දෙන්න කියා මම ඒ යෝජනාව දැන ඉදිරිපත් කලේ දැනට දින 30කට ඉදිරියෙන් නමුත් ඔබ තුමාගේ අනුමැතිය ඇතිව ප්‍රදේශයේ මන්ත්‍රීවරිය ලහි ලහියේ මොටර් ග්‍රේඩරය අරන් ගිහිල්ලා පාර හූරලා දාලා තියෙනවා මොටර් ග්‍රේඩරයෙන් කපලා ස්ථිරවම මේකට විසඳුමක් ලබා දෙන්න කියලා තමයි ගරු සභාවෙන් ඉල්ලන්නේ.එම ප්‍රදේශයේ ජනතාව බොහොම අපහසුතාවයට පත්වෙලා තියෙන්නේ මෙම මාර්ගය නිසා එම මාර්ගයෙන් තමයි සියලුම පාසල් යන ළමයි අනිත් පිරිස් ප්‍රධාන මාර්ගයට යන්නේ. වහින කාලේට අඩුම තරමෙ බයිසිකලයක තියා පයින්වත් යන්න බැරි මට්ටමක්

තියෙන්නේ පල්ලෙහා හරියෙ. මම ගරු සභාවෙන් නැවතත් ඉල්ලා සිටින්නේ එම මාර්ගය කෙලවර වන තෙක් ස්ථිරවම සංවර්ධනය කර දෙන ලෙස කරන ඉල්ලීමයි.

**ගරු මන්ත්‍රී නිමල්කා කොටඹගේ මහත්මිය - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි.ඇත්තටම මම හරිම උනන්දුවෙන් අහගෙන හිටියා. අපේ මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව. මම කඩිමුඩියේ මොටර් ග්‍රේඩරය අරන් ගිහිල්ලා පාර සීරුවා කියන චෝදනාව මම කොහෙත්ම පිලිගන්නෙ නෑ.අපි මාස 4කට විතර කලින් මෙහාට ඉල්ලීම් ලිපි ඉදිරිපත් කරලා තාක්ෂණික නිලධාරීන් ගිහින් බලලා,සාකච්ජා කරලා සාකච්ජා මට්ටමින් තිබිලා.මේක පඩුවස්නුවර ආසනේ අනිත් කොට්ඨාශ සියල්ලේම ප්‍රශ්න තියෙනවා මංමාවත් වල ප්‍රමුඛස්ථානය කොහොමද දෙන්න ඕන කියලා බලලා තමයි අපිට මේ දිනය ලැබුනේ. මං ඇත්තටම දන්නේ නෑ. මේ මන්ත්‍රීතුමා දාපු යෝජනාවක් මෝටර් ග්‍රේඩරයෙන් සූරගෙන ගිහින් කියලා කියනවා. අපිට කානු හාරලා නගර සභා පාරවල් වගේ කරන්න බෑ. සභාවෙන් තාක්ෂණ නිළධාරින් අනුමත කරන විදිහට තමා පාර කරගෙන යන්නේ .දැනට පටන් අරන් අපි තියෙන්නේ .ඉස්සරහට ඉතුරු ටික කරනවා.

**ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)**

ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි. ඇත්තටම ස්තුති වන්ත වෙනවා ජයන්ත දිසානායක මන්ත්‍රීතුමාට මේ කහටවිල පනාපිටිගම වත්ත පාර හදන්න සභාවට යොජනාව ඉදිරිපත් කිරිම ගැන. මේ මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළා මීට මාස 2 ,3කට ඉස්සරලා මේ යෝජනාව ඔබ තුමාට දාලා කටයුතු කරන්න සූදානම් වුනා කියලා. මේ න්‍යාය පත්‍රය අපිට ලැබුනට පස්සේ ඔබ තුමත් එක්ක එකතු වෙල මෝටර් ග්‍රේඩරය අරන් ගිහින් කරා කියන එක පැහැදිලි.

**ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන ජයලත් මහතා - ( ස.ජ.බ)**

අපේ ජයන්ත මන්ත්‍රීතුමා කිව්වා පාර හූරලා කියලා එතකොට අර මන්ත්‍රීතුමිය කියනවා එහෙම කරන්න බෑ කානු කපලා නගර සභාව නෙමෙයි කියලා එතකොට හූරපු එකට සමානයි වගේ.

**ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා මේ සභාව අද දවසේ උදේ ඉදලා බොහෝ ව්‍යාකූල සභාවක් බවට පත්වෙලා තියෙනවා. අපි මහජන නියෝජිතයෝ ඡන්දයෙන් පත්වෙලා ආවා. සභාවේ රීති ප්‍රශ්නයක්. රුස්වීමක මූලාසනය විසින් මූලාසන අන නොතකා හෝ සභාවේ වැඩ කටයුතු වලට නැවත නැවතත් බාධා කරමින් ප්‍රාදේශීය සභාවේ රීති වලට පටහැනීව කටයුතු කිරීම ගැන තියනවා. මේක රීති ප්‍රශ්නයක්.මෙතුමාලා නැගිටිනවා කෑ ගහනවා ආයෙ ආයෙ නැගිටිනවා.

**ගරු මන්ත්‍රිනී ඩබ්.ටී.එම්. චාන්දනී දීපිකා රත්නායක මහත්මිය - ( ස.ජ.බ)**

ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි. මේ දෝතැල්ල කොට්ඨාසයේ අපි තුනදෙන්දෙනාගෙම කොට්ඨාසෙ. එතකෙට මට පැහැදිලි වුනේ ජයන්න දිසානායන මන්ත්‍රීතුමා කලින් යොජනාවක් කරලා තියෙනවා මේ පාර හදන්න.එතකොට මන්ත්‍රීතුමිය හරහා මේ පාර මෝටර් ග්‍රේඩරය අරන් ගිහින් හූරලා හෝ කපලා හෝ කුමක් හෝ වුනා නම් එහිදි සභාපතිතුමා මේ ප්‍රදේශයේ දොරකඩ ඉන්න මන්ත්‍රීතුමා සහ මම පොඩි වසමක් එහා පැත්තේ ඉන්නේ . මෙ දෙදෙනා සහ සම්බන්ධ කරලා මේ දේ කරානම් මෙතන ගැටුමක් ඇති වෙන්නේ නෑ.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

තේ පානය සඳහා සභාව අඩාලව කල් තියන්න යෝජනා සම්මත කරගන්න.

**ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)**

තේ පානය සඳහා විනාඩි 20 කට අඩාලව කල් තැබීම සුදුසුයි කියා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන ජයලත් මහතා - ( ස.ජ.බ)**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව පෙ.ව 11.05 ට පමණ තේ පානය සඳහා විනාඩි 20 ක් සඳහා සභාව කල් තබන ලදි.**

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

අඩාලව කල් තැබූ සභාව නැවත ආරම්භ කිරීම සඳහා යෝජනා සම්මත කරන්න.

**ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)**

තේ පානය සඳහා අඩාලව කල් තැබූ සභාව නැවත පවත්වා ගෙන යාම සුදුසුයි කියා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා - ( ස.ජ.බ)**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව පෙ.ව 11.25 ට පමණ තේ පානයෙන් පසු නැවත සභාව ආරම්භ කරන ලදි.**

**ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)**

මම ජයන්ත දිසානායක ගරු මන්ත්‍රීවරයාට ස්තුති වන්ත වෙනවා පනාපිටිගම වත්ත මොන ආකාරයකින් හෝ සංවර්ධනය කරන්න යෝජනාවක් සභාවට ගෙන ඒම ගැන . මම ඔබ තුමාගේ කාරුණික අවධානයට යොමු කරනවා ප්‍රාදේශීය සභාවට වසරක් ගත වෙනවා කියලා මූලාසනේ නිවේදනයක් කරා . අපේ විපක්ෂෙ මන්ත්‍රීවරුන් 21ක් ඉන්නවා.ඒ සියලු අය ඉල්ලීම් කරලා තියෙනවා.ඒ ලිඛිත ඉල්ලීම්වලට පිළිතුරු 17ක්වත් ලැබිලා නෑ.මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්නේ දැන් අයවැය සාකච්ඡාවට දෙවන වරටත් කැදවීමක් ගත්තා.මන්ත්‍රී මණ්ඩලය සෑහීමට පත්වන ආකාරයට ඔබතුමාගේ නායකත්වය යටතේ පාරවල් කපන්න යම් ක්‍රමවත් වැඩපිළිවෙලක් කෙරිලා නෑ.මම කියන්නෙ මේ පාරවල් සංවර්ධනය කරන්න 2026 අවුරුද්දත් ගත වෙන්න එද්දි මං හිතන්නෙ කාගෙවත් ස්වකීය කැමැත්තට ඉඩදීලා නෑ.2027 අවුරුද්දේවත් මේ විරෝධතාවය නැතිවෙන්න මන්ත්‍රීවරුන්ගේ පාරවල් 10ක් දුන්නොත් අඩු තරමට 7ක්වත් හදලා දෙන්න.

**ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩී.එම්.ජේ.දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන ලද දෝතැල්ල කොට්ඨාශයේ 1326 කහටවිල ග්‍රාමසේවක වසමේ කිරිමැටියාගම පනාපිටිගම වත්ත(පන්ඩුක පුර) ග්‍රාමයේ ඇති ගමට පිවිසෙන මාර්ගය ජනතාවට ගමන් කිරීමට අපහසුවන අන්දමින් කැඩී ගොස් ඇති බැවින් එම මාර්ගය ප්‍රාදේශීය සභා සතු මාර්ගයක් නිසා ඉතා කඩිනමින් සංවර්ධන කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී**

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

**(ඉ) II.** <u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා</u> <u>විසින් කරනු ලබන අංක **6.(ඉ). II** දරණ යෝජනාව</u>

මා විසින් යෝජනා කරන 6.(ඉ). II දරණ යෝජනාව. කඹුරාපොල වෙළඳ සංකීර්ණයේ K-09 කඩ කාමරය බදු කරුවන ඩබ්.එම්.තාරකා හර්ෂණී රණතුංග විසින් එම කාමරය ජාතික හැදුනුම්පත් අංක 855923807V දරණ ජයකොඩි ආරච්චිගේ අනුෂා ලක්මාලි ජයකොඩි යන අයට 2019/02 චක්‍රලේඛණය අනුව පැවරුම්කරුගේ ගිවිසුම් කාලයෙන් ඉතිරි කාලය සඳහා ගිවිසුම් ගත වීමේ හැකියාව පවතින බැවින් (2029 පෙබරවාරි මස 28 දින දක්වා) පැවරුම් ගාස්තු ලෙස මාසික කඩ කුලිය මෙන් 24 ගුණයක් අය කර ගැනීමෙන් පසුව ගිවිසුම් ගත වීම සුදුසු බව යෝජනා කරමි.(2500.00*24 = 60,000.00)

<u>**ගරු මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ඒ.රංජිත් නවරත්න මහතා - (ජා.ජ.බ)**</u>

සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් ඉදිරිපත් කරන ලද කඹුරාපොල වෙළඳ සංකීර්ණයේ K-09 කඩ කාමරය බදු කරුවන ඩබ්.එම්.තාරකා හර්ෂණී රණතුංග විසින් එම කාමරය ජාතික හැදුනුම්ත් අංක 855923807V දරණ ජයකොඩි ආරච්චිගේ අනුෂා ලක්මාලි ජයකොඩි යන අයට 2019/02 චක්‍රලේඛණය අනුව පැවරුම්කරුගේ ගිවිසුම් කාලයෙන් ඉතිරි කාලය සඳහා ගිවිසුම් ගත වීමේ හැකියාව පවතින බැවින් (2029 පෙබරවාරි මස 28 දින දක්වා)පැවරුම් ගාස්තු ලෙස මාසික කඩ කුලිය මෙන් 24 ගුණයක් අය කර ගැනීමෙන් පසුව ගිවිසුම් ගත වීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

**(ඉ) III.**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා</u> <u>විසින් කරනු ලබන අංක **6.(ඉ). III** දරණ යෝජනාව</u>

ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

<u>**ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)**</u>

රටේ ඉදිරි අනාගතය වෙනුවෙන් මතු පරපුර ආරක්ෂා කර ගැනීම අවශ්‍යය වගකීම නම් එය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍යය සහයෝගය ලබා දීම අපේ යුතුකමක් සහ වගකීමක් වන්නේය.දැනට මේ මහත් සමාජය තුල රට විනාශය කරා රැගෙන යන මත් උවදුර මැඩ පැවැත්වීමට නොහැකි තත්වයට පත්ව ඇත.ව්‍යාපාර මට්ටමින් හිස ඔසවා ඇති කුඩු ජාවාරමේ ඉහල මට්ටමේ ප්‍රධාන ජාවාරම්කරුවන් සහ පාවිච්චිකරන්නන් අත් අඩංගුවට ගෙන රදවා තබා ගැනීමෙන් රජයට ඔවුන් නඩත්තු කිරීම සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුව ඇත.නීතිය ක්‍රියාත්මක වුවද සිදුවන්නේ දිනෙන් දින සිරගෙවල් පිරීයාම පමණකි.මෙරට පාතාල නායකයින්ගේ තෝතැන්නක් බවට පත්ව ඇත.දිනෙන් දින වැඩිවන මිනීමැරුම් ප්‍රමාණය විකාගෝවට සමකල හැකි තරමය.එතරම් කුරිරු මිනිමැරුම් සිදු වුවද අල්ලා ගන්නා සියළු අය උසාවියෙන් ඇප ලබා එළියට එයි. නැවත එම ක්‍රියාවම කරයි. මෙම පුණ්‍යභූමිය තුල නැවත වතාවක් සාමය ස්ථාපිත කර බියෙන් සැකෙන් තොරව ජීවත් වීම සඳහා මෙම මිනීමරු පාතාලය විනාශකර දැමීමටත් මත්ද්‍රව්‍යය ප්‍රවාහනය විනාශ කර දැමීමටත් නැවතත් වතාවක් එල්ලුම්ගස ක්‍රියාත්මක කල යුතු යයි පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට මෙම යෝජනාව ඉදිරිපත් කරමින් මධ්‍යම රජයෙන් ඉල්ලා සිටිම සුදුසු බව යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ආර්.ඩී.එම්. ජයන්ත දිසානායක මහතා - ( ස.ජ.බ)**

ඒ යෝජනාව මා ස්ථිර කරනවා

**ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)**

ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි.මම 1991 අවුරුද්දෙ කළුබණ්ඩා රත්නායක මන්ත්‍රීතුමාගේ කාලෙදිත් ඒ යෝජනාව ගෙනාවා.අද වෙනකොට අවුරුදු 31ක් ගත වෙලා.එදත් මං බලාපොරොත්තු වුණා මොන රජය ආණ්ඩුව කෙරුවත් රටේ සමගිය හා බෙදනීය ඉරණම නැති කරගන්න මේ එල්ලුම්ගස ක්‍රියාත්මක විය යුතුයි කියලා.1991 ඉල්ලීම් කරද්දීත් අවසාන වශයෙන් 1976/07/23 තමයි අවසාන වශයෙන් එල්ලුම්ගස ක්‍රියාත්මක කිරීම ඇනහිටින්නේ. 1976/07/23 වෙනිදා තිස්සමහාරාමේ යෝධකණ්ඩියේ ජයසිංහ නොහොත් හොද පපුවා කියන එකා තමයි අවසාන වශයෙන් එල්ලා මරන්නෙ. එදා ඉදන් අද වනතෙක් මේ එල්ලුම්ගස ක්‍රියාත්මක නෑ.මෛත්‍රීපාල ජනාධිපතිතුමා එල්ලුම්ගස ක්‍රියාත්මක කල යුතුයි කියා අත්සන් කරා.අද වනවිට මේ රටේ රැදවියෙක් වෙනුවෙන් රු.1500ක් වියදම් කරනවා වේලකට. මේ වෙද්දි 75000කට අධික ප්‍රමාණයක් බන්ධනාගාර ගතවෙලා ඉන්නවා. මේකෙන් 70%ක් මත්කුඩු ව්‍යාපාරවලට සම්බන්ධ වෙච්ච හෝ පාතාල නායකයෝ සහ මත්කුඩු ජාවාරමේ ඉන්න අය තමයි. අද මත්ලෝලීන් පමණක් 26,000ක් බන්ධනාගාර ගතවෙලා ඉන්නවා.මේ මත් ජාවාරම තුරන් කරල මේ පාතාල නායකයෝ තුරන් කරලා මේ රට හදන්න බෑ කියන විශ්වාසයක් මට තියෙනවා.ඒ නිසා දයාබර මන්ත්‍රීවරුනි මරණ දණ්ඩනය නියම වුන අධික ප්‍රමාණයක් අද ඉන්නවා බන්ධනාගරයේ රිමාන්ඩ් සිරකරුවො විශාල ප්‍රමාණයක් දවසින් දවස ගොඩ ගැහෙනවා.පඩුවස්නුවර ග්‍රාම නිලධාරි වසම් 103ම කොතනකවත් නෑ කියන්න බෑ.විශාල වශයෙන් තෝරගත්ත ගම් ප්‍රමාණයක් තියෙනවා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවො ඉන්න.ආනන්තරීය පාපකර්මවලින් මේ රට පිරිලා. පළාත් පාලන ආයතන හැටියට මං කියනවා පැහැදිලිවම මේක මධ්‍යම ආණ්ඩුවට බල කරන්න යෝජනා සම්මත කරන්න ඕන.මං දන්නෑ අනුර කුමාර ජනාධිතිතුමා මේ සම්බන්ධව අත්සන් කරයිද කියලා.හැබැයි 5 දෙනෙක් සිය කැමැත්තෙන් ඉදිරිපත් වුනා අලුගෝසුවො හැටියට ස්වේච්ඡාවෙන් වැඩ කරන්න.බෙල්ජියමෙන් කඹේ ගෙනාව කඹේ ගෙනල්ලා දැන් අවුරුදු 20කටත් ආසන්නයි.නැවත වතාවක් එල්ලුම් ගස ක්‍රියාත්මක කිරීම තුළ මිණීමැරුම් සංඛ්‍යාව අඩු වෙනවා.පාතාලෙ උන් අඩුවෙයි.වෙඩි තැබීම් අඩු වෙයි.මේ තීන්දුව ගන්න ගරු සභාවේ මේ යෝජනාව සම්මත කරන්න කියලා ඉල්ලීම් කරනවා. මධ්‍යම රජයට දැනුම් දෙන්න නැවත වතාවක් එල්ලුම්ගස ක්‍රියාත්මක කරන්න කියලා පළාත් පාලන ආයතන 336 ම මේ යෝජනාව සම්මත කරලා අනුර දිසානායක ජනාධිපතිතුමාගේ අවධානයට මේක යොමු කරලා එහෙම අත්සන් කරොත් අපි අත් දෙක උස්සල මේ රටේ ඉන්න මිනිස්සු හැටියට අත් දෙකම උස්සලා සපථ කරනවා බොහොම පිංබර මිනිහෙක් කියලා. පිංබර ජනාධිපතිවරයෙක් මේ රට බේර ගන්න අත්සන් කලාය කියලා. මේ යෝජනාව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සම්මත කරගන්න.

**ගරු මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා - (සර්ව ජන බලය)**

ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. එවගේම සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි.මේ අවස්ථාවේදී අපේ හඬ කොතෙක් දුරට යනවද කියා එක පිළිබඳ අවබෝධයක් නොතිබුනත් ඔහුගේ කථාව ඇතුලේ තිබුනා සියලු ප්‍රාදේශීය සභා එකතු වෙලා මේක යෝජනාවක් හැටියට ගෙනියමු කියලා. පඩුවස්නුවර ආසනය ගත්තාම මේක බරපතල ප්‍රශ්නයක් මේ බස්නැවතුම්පලේ ඇස් පියාගෙන යනවා කරන්න කිසිවක් නැති නිසා.මේක ජාලයක්.යම් කෙනෙක් ඒකට එරෙහිව නැගී හිටියොත් ඔහුව කොටු කරනවා . මුලින්ම එතුමා ප්‍රකාශ කරන්නේ මේ නීතිය ගෙනාවොත් මිනිසුන්ගේ බයක් ඇති වෙයි කියන එක මේ මත්ද්‍රව්‍ය ජාල වලට පොදු විරෝධතාවයක් ඇති වෙන්න ඕනා.ආසනය ඇතුලේ මේවාගෙන් බේරගන්න කියන එක තමා මගෙ අදහස. පලවෙනි සටන අපි ආරම්භ කරා කියන ඉල්ලීම සදහන් කරලා රජයෙන් ඉල්ලුම් කරලා මමත් කියා සිටිනවා.

**ගරු මන්ත්‍රී එම්.ඩී. මනෝ කුමාර එදිරිසිංහ මහතා - ( ස.ජ.බ)**

ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි. අපේ හිටපු සභාපතිතුමා ගෙනාපු යෝජනාව සමබන්ධව අපේ දොළවත්ත මන්ත්‍රීතුමා කිව්වා දැකලා නොදැක්කා වගේ යනවා කියලා . ඇත්ත කතාව.පොඩි උදාහරණයක් කිව්වොත් පෙට්ටි කඩයක් කරන අම්මෙකුගෙ රෑ ගෙනාපු පුවක් 1000 ක් පහුවදා කඩේ අරින කොට නෑ. පෙට්ටි කඩේ කරන අම්මගේ පෙට්ටි කඩේ කඩලා පුවක් 1000ක් අරගෙන.අරගෙන තියෙන්නෙ පුතා. ඒ තත්වයේ මේ ආසනේ පුරාම දැන් මේ වන කොට අවුරුදු 15-18 පොඩි දරුවො තමයි හැන්ඩල් කරන්නෙ. පොලිසියෙන් මේ සියල්ලම දන්නවා. බන්ධනාගාර ගත කරනවාට වඩා හොදයි පුනරුත්ථාපනය කරන එක. 100 යක් පුනරුත්ථාපනය කරොත් 10 දෙනෙක් හරි හැදෙයි . බන්ධනාගාරෙට දැම්මට වැඩක් නෑ. ඒක ඇතුලෙ බෝවෙනවා මිසක්.

**ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි. ඇත්ත වශයෙන්ම මේවා අපේ පාලන සමයක් යටතේ මෝරපු ඒවා නෙමේ.මේ වගේ ලොකු අක්මුල් ගිය ඒවා තියෙන්නේ ඒවා තමයි වඳ කරන්න ඕනා. අපිත් කැමතියි හරි වූදිතයව එල්ලුම ගහට යවනවනම් . හැබැයි සොක්කො එල්ලුම්ගස් යද්දී ලොක්කො සුරසැප විදිනවා . ඕක තමයි පසුගිය වකවානුවේ සිද්ධ වුනේ ,සමජය වෙලා ගත් ප්‍රශ්නයක් වෙලා තියෙනවා. හෙට්ටිපොලත් තත්වය ඕකම තමයි. යනවා, එනවා. එන්නෙ ඊටත් වඩා හොඳට. ඒ සම්බන්ධව ජාල ගත වෙලා.අපි මේ දවස්වල ප්‍රතිශෝධක කාර්යාල මගින් ඉන්න පුද්ගලයන්ගෙ නඩු පැය දින ගණන් වලට සමාජයට මෙහෙවරක් වශයෙන් ඒක කරනවා.අපි දැන් මේ අසල ගමක පාසි ඉවත් කරනවා. ඒ ගොල්ලන්ව යොදාගෙන බොහොම පරිස්සමින්. අවංකවම සැබෑ වූදිතයා එල්ලනවා නම් ප්‍රශ්නයක් නෑ. නමුත් ජාවාරම්කාරයෝ ඕනෑම කෙනෙක්ව ඩැහැගන්න දන්නවා. මේ සමාජයේ ඉන්නවා ඕන තරම් මුදල් හම්බ කරගන්න අය. ඉදිරියේදී මේ වගේ දේවල්වලට වැට බැඳෙනවා.අපේ සමාජයේ තියනවා මතයක් මොනවා කරලා හරි කමක් නෑ. මුදල් හොයාගන්න ඕන කියලා. ඔන්න ඔය කතාව තමා දෙමාපියෝ දරුවන්ට දීලා තියෙන්නෙ.කුඩුවලට උනත් ඉදිරිපත් වෙන්න නීතිඥයෙක් ඉන්නවා.කිලෝ 10,12 අහුවෙච්ච අය පසුගිය කාලයේ වෙච්ච දූෂිත ක්‍රම අනුව නිදහස් වෙලා ඇවිල්ලා අරටත් වැඩිය හොදට ඒ වැඩේ කරගෙන යනව.අපිත් කැමතියි හරි කෙනා එල්ලුම්ගහට යනවට. කුඩුවලට හරිකෙනා නෙමේ යන්නෙ.හරි ක්‍රමයට නීති සම්පාදනය වෙලා රටත් යනවානම් කවුරුත් කැමතියි.

**ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන ජයලත් මහතා - ( ස.ජ.බ)**

ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි.ගරු සභාපතිතුමනි අපේ රංජිත් උපාලි මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව අපේ එල්ලුම්ගහ පිලිබඳව ඒක ඇතුලෙ තව ලියවුන කාරණා ගොඩක් තියෙනවා. මම දකින්නෙ අපි ප්‍රාදේශීය සභාවක් හැටියට උපතේ සිට මරණය දක්වා කියලනෙ මේ හැමදේම කරන්න හදන්නෙ.හැබැයි මේ උපතේ සිට මරණය දක්වා තියෙන කාලය,අපේ සභාව හරහා අපි මාතෘ සායන පවත්වලා ඒ අම්මලාට අවශ්‍ය පහසුකම් ටික දීලා යහපත් දරුවෙක් මෙලොවට බිහි කරන්න සභාවක් හැටියට අපිත් උර දෙනවා.මැද අවධි කිහිපයක් තියෙනවා. අපේ කාන්තා හෝ පිරිමි දෙගොල්ලොම මේ ව්‍යසනයට ගොදුරු වෙලා තියෙනවා.අපේ ග්‍රාමසේවක වසම් 103ක බලප්‍රදේශ ගම්මාන රාශියක් තියෙනවා. මේ හැම ගමකම මේ මත්ද්‍රව්‍ය උවදුරට සිරගත වෙලා ඉන්න කෙනෙක් ඉන්නවාමයි. මේ කාරණේ හින්දා තමයි සභාවක් හැටියට අපිට දෙන්න පුලුවන් නම් මේවට උපදෙස් මාලාවක් හොඳයි කියලා හිතනවා. අපිට මත්ද්‍රව්‍ය උවදුරට ලක්වෙන අය විතරක් නෙමෙයි මේකෙදි දැනුවත් කරන්න තියෙන්නේ. අප ආදරණීය දෙමාපියොත් එක්ක දැනුවත් කරන්න ඕන. ඔබ තුමාලා පොහොසත් රටක් ලස්සන හෙටක් යන සංකල්පයට එන්නනේ උත්සහ කරන්නේ . අපේ සභාවෙනුත් මේ දරුවන් යහ මගට ගන්න පුලුවන් වැඩපිලිවෙලක් හැදුවනම් අපේ උපතේ සිට මරණය දක්වා යන වැඩපිලිවෙල අපේ සාර්ථකයි කියලා හිතනවා. හැම හිරකරුවෙක්ම බෙල්ලේවැල දාන්න ඕනා සිරකරුවෝ නෙමෙයි සිරකරුවෝද මනුස්සයෝ කියලා බන්ධනාගාරවල ගහලා තියෙනවනේ. ඒ නිසා හරි අය තෝරලා ඒ දේ කරන්න කියලා යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රීනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)**

ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි. ඇත්තටම අපි දැකලා අහලා තියෙන්නේ සිරකරුවො මනුස්සයෝ කියන එක. නමුත් මේ මත්ද්‍රව්‍ය උවදුර කොයි තරම් දුරට ජාල ගත වෙලා තියෙනවද කියනවානම් අල්ලපු ගෙදර කෙනා කුඩු පාවිච්චි කරන තත්වයට පත්වෙලා තියෙන්නේ. කවදාවත්ම මම හිතුවේ නෑ කුඩු භාවිතා කරන අයගෙන් මගේ ගෙදරට හානියක් වෙයි කියලා අර කථාවකුත් තියෙනවනෙ මට වෙනකම් මේකේ හානිය වැඩිපුර දැනෙන්නේ නෑ කියලා. මේ පිලිබඳ කියන්න OIC මහත්තයට කතා කරද්දි කියන්න නම් පිළිබඳ පවා පොලීසිය මේ පිළිබඳ දැනුවත්. නමුත් මහජනතාව විදිහට මේ ගැටලුව විසදන්න සහයෝගය දෙන්න වෙනවා .අම්මට ,බිරිඳට කාන්තාවට මේක දැනනවා වැඩියි. එල්ලුම්ගහ නියම කරනවා කියන එකත් එක්ක මම හිතනවා වරදට බය වෙන්න මිනිස්සු පෙලබෙයි කියලා . ඉතින් ගරු සභාපතිතුමා මං මේ ගරු සභාවෙන් ඉල්ලන්නේ අපි එල්ලුම්ගහ නියම කරන්න අපි කුඩා වැඩිද කියලා මට හිතෙනවා නමුත් අපි සභාවල් 336 පළාත් පාලන ආයතන අපි හැම දෙනාම ඉල්ලීම් කරද්දි වරද කරුවන් එල්ලා දමනවා කියන එක කරන්න අමාරු ක්‍රියාවක් නමුත් එතෙන්ට එනවනම්. වැරදි කරන්න ඉන්න කෙනෙක් බය වෙන්න පුලුවන්. තියෙන අවස්ථා වලින් හරි අපේ ජනතාවට මේකෙන් මිදෙන්න මේ යෝජනාව ඉදිරිපත් කිරීම සුදුසුයි කියලා මං යොජනා කරනවා .

**<u>ගරු මන්ත්‍රිනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි. අපේ හිටපු සභාපතිතුමා මේ යෝජනව ඉදිරිපත් කරන්න ඇත්තේ රටේ මේ දිනවල අර්බුදකාරී තත්ත්වයක් ඇති වෙලා තියෙනවා.හිරගෙවල් ඇතුලෙ ජනගහනය අඩු කරගන්න තමයි එතුමා මේ යෝජනාව කරන්න ඇත්තෙ.ඇත්තටම ගරු සභාපතිතුමනි කාන්තාවෝ 52%ක් ඉන්නවා මේ රටේ. අපට මතකයි සේයාගේ කතාව ස්ත්‍රී දූෂකයන්ට දෙන දඬුවම් ක්‍රමය මීට වඩා වෙනස් උනා නම් මේවට පෙලඹෙනවා අඩුවෙන්න තිබ්බා.ඇත්තටම මේක කාලීන යෝජනාවක් කියලා මං හිතනවා.

**<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ප්‍රමුඛ ගෞරවනීය මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි.මම පුද්ගලිකවම විවාදයකට නෙමේ සංවාදයකට නැගිට්ටෙ. මොකද මේ යෝජනාවට අපේ අදහස් නොදැක්කුවහොත් අපි එකඟවූවා සේ වාර්තාගත වෙනවා.ව්‍යවසනය සම්බන්ධයෙන් තර්කයක් නෑ.ඒකෙ කතා 2ක් නෑ. මගේ දරුවා අනාරක්ෂිත සමාජයක් ඇතුලෙ ඉන්නෙ කියන බය ඇතුලෙ මමත් ඉන්නවා. නමුත් එල්ලුම්ගහ නියම කිරීම සඳහා සභාව ඇතුලෙ යෝජනාවක් සම්මත කරගමු කියන කාරණය තමයි එතුමාගේ යෝජනාව ඇතුලෙ තිබ්බෙ.මේක සංවාදයට ලක් කරමින් මේක පිලිබඳ තීරණයකට එමුයි කියන එක තමයි මගෙ පුද්ගලික අදහස මොකද මං ඔය කතාව යන අතරතුරේ තොරතුරු ටිකක් හොයලා බැලුවා.ඇයි 1976 මරණ දණ්ඩනය නියම කරන කොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එවකට හිටපු ජනාධිපතිවරයා මරණ දණ්ඩනයට අත්සන් නොකලේ ප්‍රධාන කාරණා 3ක් තියෙනවා.එකක් තමයි අපි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට අත්සන් කරපු රටක් හුදකලා රටක් විදිහට කටයුතු කරන්න බැරි බව මැද පෙරදිග යුද්දෙදි ඒක හොදටම දැනුනා.ඒකෙදි එක්සත් ජාතීන්ගේ සංවිධානය ICCPR කියන සම්මුතියකට අනුව මරණ දඬුවම යම් රටක පුද්ගලයෙකුට ලබාදුන්නොත් .ඒක සෑම පුරවැසියෙක්ටම ජීවත් වෙන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සලසලා තියෙන අයිතිය බිඳෙනවා.එතකොට අපි සම්මුතීන් කඩන තැනට එනවා.ඊළඟට ඒකෙම තියනවා එහෙම උනොත් අපි සම්බන්ධ වෙලා තියෙන ජාත්‍යන්තර සම්මුතීන්,GSP+වගේ සහනයන් සම්පූර්ණයෙන් අත්හිටවන්න පුලුවන් තත්ත්වයක් ඇති වෙනවා කියලා. මම ආණ්ඩු පක්ෂෙ පැත්තෙන් කතා කරන්නම්. කරන්න පුලුවන් සියලු කටයුතු කරමින් තියෙනවා. මානව හිමිකම් කොමිෂන් සභාව සහ මනෝවෛද්‍යවරු කියනවා දඬුවම් දීමෙන්ම අපරාද නවත්තන්න බැහැ කියලා . ඒවට අවශ්‍ය පුනරුත්ථාපන කටයුතු, සියලු උපදේශනයන් පූර්ව ළමාවිය සංවර්ධනයේ සිට අපේ රටේ දරු සම්පත වෙනම ආකල්ප සංවර්ධනයක් ඇතුලේ හදන්න වෙනවා . මේ වෙනකොට 31000kg අයිස්,හෙරොයින් ,ගන්ජා අත්අඩංගුවට අරන් තියෙනවා. දේශපාලන අධිකාරියේ තිබුන බලපෑම් නවත්තලා තියනවා. ආසන සංවිධානවරයෙක් හා හිටපු අධිකරණ ඇමතිගේ පුතෙක් පාතාලෙන් ලංකාවට කුඩු ගෙනාපු, කුඩු බෙදපු පාතාල නායකයන්ගෙන් හරක්කටා නොහොත් නදුන් චින්තකගෙන් තමන්ට නිදහසේ ඉන්න පුලුවන් විදිහට අල්ලස් ලබා ගත් අවස්ථාවන් තියනවා. මං මේ මතු කරන්නේ මොනතරම් කළු සමාජයක්ද අපි අතර තිබුනේ. ඒවා වියැකෙමින් යනවා. එහෙම අවස්ථාවක බෞද්ධ, කතෝලික ,ඉස්ලාම් ධර්මය ,හින්දු ධර්මය අදහන ඒ ධර්මයන් 4ක් තුල ඒ සංස්කෘතින් 4 ක් ඇතුලේ එකාවගේ පෝෂණය වෙච්ච සමාජයක් අපි හැමෝටම තියෙන්නේ. අපි සියලු සත්ත්වයන්ට අවිහින්සාව පතුරවන්න සහ ඔවුන්ට ජීවත් විමේ අයිතිය සුරක්ෂිත කරන්න. එතකොට හැබැයි එකගයි සම්පූර්ණයෙන්ම එකගයි. මෙ දරු පරපුර රකින්න නම් මේක විනාශ කරන්න නම් මොවුන් එල්ලා හරි මරන්න ඕනි කියන අදහස තමයි එතුමගෙ යෝජනාව තුල තිබ්බේ. හැබැයි ඒකෙදි අපි තව තවත් අපි අදහන ධර්මයන් 4ක් ඇතුලේ පෝෂණය වෙන පෙරේදා වෙනකෙට දකුණු ආසියාවේ සාමකාමීම රට ලෙස ශ්‍රේණිගත කළා ශ්‍රී ලංකාව.එවැනි රටක් අර එල්ලුම ගහ ක්‍රියාත්මක කරන්න කොහොමද , එකවර යන්නේ කියන එක කල්පනාකාරී වෙන්න වෙයි. කාරණා සියල්ල ඇත්ත . ඒත් අපි කොහොමද එකවර අර වගේ තැනකට යන්නේ . පුද්ගලිකව මම නිහඬව සිටියානම් මේ යෝජනාවට 38 දෙනාම එකතු වෙලා සම්මත කරපු යෝජනාවක් බවට පත් වෙනවා . පුද්ගලිකව මම එකග නෑ. අපි එකවර ඒ වගේ තැනකට යනවට. නැවත වරක් මම ගරු සභාවෙන් ඉල්ලනවා නැවත වරක් ඒ ගැන සංවාද කරමින් නියම තින්දුවකට එමු කියලා යෝජනා කරනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ර්.ඒ.ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය ප.ව.12.07 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ. එම්. නන්දසිරි මහතා ප.ව12.07 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

**<u>ගරු මන්ත්‍රී ඒ.පී. තරංග චම්පික අලහකෝන් මහතා - (ශ්‍රී.ල.පො.පෙ)</u>**

ඇත්තටම සභාපතිතුමනි කුඩුවලට අහුවෙන අයව බන්ධනාගාර පුරෝනවට වඩා කන්දකාඩු වගේ පුනරුත්තාපන ආයතනවලට යොමු කරලා ඒ කන්දකාඩු වගේ ආයතන 10ක් හැදුවත් ප්‍රශ්නයක් නෑ.මොකද කන්දකාඩු ගිහින් ආපුවහම චුට්ටක් බය වෙනවා. මාස 3කට පලවෙනි පාර යවන්නෙ.ඊළගට මාස 6කට යවනවා කියලා දැනගත්තොත්

අනිවාර්යයෙන් බය වෙනවා.අනිත් එක සභාපතිතුමනි කුඩුවලට අහුවෙන අය පුදුමාකාර විදියට වියදම් කරනවා සල්ලි තියෙන මිනිස්සු බිලියන ගණන් වියදම් කරලා අනිවාර්යයෙන් නිදහස් වෙනවා. කුඩු කියන එක පාන්පිටි වෙනවා.පාන්පිටි උනාට පස්සෙ ඒ පාන්පිටි ටික නැවත වෙළඳපලට එනවා. පාන්පිටි ටික දහනයට යවනවා නියම කුඩු ටික නැවත වෙළඳපලට එනවාමයි. ඒ නිසා ගරු සභාපතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා කුඩුවලට අහුවෙන අය දැඩිව පුනරුත්තාපනය කරොත් හොඳයි කියන එක

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ. එම්. නන්දසිරි මහතා ප.ව.12.09 ට පමණ ගරු සභාවට පැමිණියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඊ.ඒ.ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය මහත්මිය පෙ.ව.12.09 ට පමණ ගරුසභාවට පැමිණියා

**<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි .ගරු රංජිත් උපාලි මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට අපේ මධුශංක මන්ත්‍රීතුමත් අදහසක් දැක්වුවා. පොදුවේ අපේ මන්ත්‍රීවරු වෙනුවෙන් අපිට සාකච්ඡා කරලා එකඟතාවයකට ස්ථිරවම එන්න පුළුවන් මේ කතා පිළිබඳව. එ සියලු දෙනා වෙනුවෙන් මං හිතනවා ඉතාමත් කෙටි කාලයක් අරන් මේක කතා කරන එක හොඳයි කියලා. මේ ව්‍යවසනය සම්බන්ධව අපේ සභාවේ මන්ත්‍රීවරු ගැඹුරින් කල්පනා කරන්න ඕන . මේ ව්‍යවසනයේ ආරම්භය , ව්‍යාප්ත වීම මේ තරම් දුරට පැතිරීම මේ සියල්ලම කතා බහ කරලා තමයි අවසාන තීන්දුවකට එන්න වෙන්නේ . එල්ලුම් ගහ නියම කරලා මරලා දැමීමෙන් මේක ඉවර කරන්න පුලුවන් කියලා අපි හිතනවා නම් මං හිතන්නේ ඒක සාර්ථක තීන්දුවක් වෙයි කියලා අපට හිතන්න පුලුවන් කමක් නෑ. චීනෙ මීට වසර කිහිපයක ඉඳනුත් මේක කර කර ඉන්නවා. මේ ඊයේ පෙරෙදාත් කරා. තවත් රටවල මේක සිද්ද වෙනවා. නමුත් ඒ රටවල ඉවර නෑ. තවත් යනවා. රතු ඉන්දියානු නායක සියැටල් කියලා තියෙනවා කතාවක් එතකොට තමයි තේරෙන්නේ මිනිස්සුන්ට සල්ලි කන්න බෑ කියලා.නාසිල් කියලා තියෙනවා කතාවක් තව. මේ තරම් ගැඹුරු මාතෘකාවක් මේ තරම් ව්‍යවසනයක් පිළිබඳව මීට වඩා ඉතාමත් සංකීර්ණව මං හිතනවා කතා කළ යුතුයි කියලා. ඒක නිසා අතීතයේ ගත්ත ක්‍රියාමාර්ග ඇතුලෙ අනාගතේ මෙවැනි ව්‍යවසනයක් තමන්ගෙ ගෙදරට එනවා කියලා විශ්වාස නොකර අපිට ඕනෑම අවස්ථාවක ගැලවෙන්න පුලුවන් කියලා හිතේ තියාගෙන නටපු නාඩගම් වල සෙල්ලම් වල ප්‍රතිඵලය අද ඇවිල්ලා තියෙනවා. ඔබ තුමාලා තමන්ගේ හෘද සාක්ෂියෙන් අහලා බලන්න ඔබ සටන කරන්නේ කුමක් සඳහාද කියලා . ඒ නිසා අපි ආණ්ඩුව අරගෙන මේ සටන අපි ආරම්භ කරලා තියෙනවා . ගලවා ගැනිම් වෙනුවෙන් කිසිදු දේශපාලන මැදිහත් විමක් නෑ . ඉස්සරයි අදයි අතර වෙනස ඒක .ඒ නිසා අපි ඔබ තුමාලගෙන් අපේ රංජිත් උපාලි මන්ත්‍රිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීතුමාලගෙන් ඉල්ලිමක් කරන්නේ හෘද සාක්ෂියට එකඟව ඔබ කල්පනා කරලා බලන්න . ඔබ අප සියලු දෙනා භුක්ති විදින මේ ඉතාම කණගාටුදායක භයානක තත්වය අහෝසි කරන්න මොකක්ද කරන්න ඕනි කියලා. ඒක නිසා බීජ වපුරලා ගොඩක් කල් ගිහිල්ලා ඒ ඵලදාව අපිට ලැබෙමින් පවතිනවා. ඒ නිසා බීජ වපුරන එක නතර කලොත් මේ ලැබෙන ඵලදාව අපිට යම් කිසි කාල සීමාවකදී ඉවර කරන්න පුලුවන් . මේ වගේ බැරෑරුම් ප්‍රශ්නෙකට මේ වගේ කෙටි උත්තර හොයන්න ක්‍රමයක් නෑ . ඒ දීර්ඝ උත්තර හොයන්න නම් සත්‍ය ලෙසම සහයෝගය දෙන්න කියමින් නිහඬ වෙනවා.

**<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි.පක්ෂ විපක්ෂ හැමකෙනාගෙම අරමුණ තමයි මෙ උවදුර නැති කිරිම ඒ නිසා තමයි එතුමා යෝජනා කලේ අපි සභාවක් විදිහට පඩුවස්නුවර සියලු මන්ත්‍රීවරුන්ගේ යොජනාවක් සම්මත කරලා මධ්‍යම ආණ්ඩුවට යවමු කියලා. මත්ද්‍රව්‍ය වලට සම්බන්ධ හැම පක්ෂෙකම දේශපාලකයො ඉන්නවා ව්‍යාපාර කරන අය ඒ හින්දා එක පක්ෂෙකට ලඝු කරන්න එපා . මේක රටම වෙලා ගත්ත ව්‍යවසනයක් . පඩුවස්නුවර ආසනේ මේක නතර කරන්න අපිට කරන්න පුලුවන් දේ තමයි සභාවක් විදිහට අපි මෙතන කතා කරන්න ඕන. ඒ නිසා රංජිත් උපාලි මන්ත්‍රිතුමා ගෙනාපු යෝජනාව සියලු දෙනාගේම එකගතාවයක් පල කරලා සභාවක් විදිහට දෙන්න පුලුවන් සහයෝගය ක්‍රියාවෙනුත් හැම දෙනාම එකතු වෙලා සහය දෙමු.

**<u>ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි.මුලින්ම ස්තුති වන්ත වෙනවා රංජිත් උපාලි මන්ත්‍රිතුමා ගෙනාපු යෝජනාව සම්බන්ධව .මත්ද්‍රව්‍ය, අරක්කු මේ ජාවාරම්වල ඉන්න මිනිස්සු ඔබ අපි කවුරුත් දන්නවා. පොලිසියෙන් ගිහින් අල්ලපු ගමන් 54 ගහලා බන්ධනාගාර ගත කරනවා. මම ලබපු අත්දැකීමක් තමයි ගරු සභාපතිතුමනි වසර පහහමාරක විදේශ රැකියාවක් කරද්දි මම ඒ රටවල මේ වගේ වැරදිකාරයො ගත්තහම ඒ වැරදිකාරයන්ගෙන් වැඩ ගන්නවා.අපි කරන්නේ වැරදිකාරයො හිරේට යොමු කරලා අපේ බදු මුදල්වලින් පෝෂණය කරනවා.ඒ නිසා ගරු සභාපතිතුමනි මමත් යෝජනාවක් විදිහට කරන්න ඕනා සභාව තුල හිරකාරයො ගෙනල්ලා අපේ කර්මාන්තපුරවලට දාලා මේ මිනිස්සුන්ගෙන් යම් මුදලක් උත්පාදනය කරන්න

ඕනා.අපිට 2000ක් හම්බුණා නම් හිරකාරයාට 1000ක් දෙනවා.ඒකෙන් 500ක් හිරකාරයාගේ ගිණුමට යනවා 500ක් රජයට එකතු කර ගන්නවා.මේ වැඩපිළිවෙලෙත් අපේ රටේ ක්‍රියාත්මක කරන්න අනුර කුමාර දිසානායක මැතිතුමාගේ අවධානයට යොමු වෙන්න මේ සභා වාර්තාවට එක් කරන්න කියලා මං ඉල්ලීමක් කරනවා.

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

මේ මාතෘකාව පිළිබඳ කතා කිරීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම ගත්තොත් කුඩු,අයිස්,හයිස්,හෙරෝයින්,ගංජා,කසිප්පු,විවිධ වර්ගයේ මත්ද්‍රව්‍ය අපේ රට වෙලාගෙන ඉන්නවා. එතකොට අපි දන්නවා ඉස්සර පාතාලයත්,දේශපාලකයත් එක්ක අත්වැල් බැදගෙන තමයි තිබුණේ. ඉතිං අක්මුල් විහිදිලා තියෙන ව්‍යවසනයක් ඉතා ඉක්මනින් අවසන් කරන්න ඕනි නිසා තමයි ජනාධිපතිතුමා ඉවත්වනු කියා වැඩසටහන ආරම්භ කරේ මීට මාස කිහිපයකට ඉහතදී මේ වෙනකොට විශාල ප්‍රමාණයෙන් කුඩු ජාවාරමේ ඉන්න අය අත්අඩංගුවට අරන් තියෙනවා.බන්ධනාගාර පිරෙන්නේ ඒකයි. දේශපාලන අතපෙවීම් නතර කරලා තියෙනවා.පෙරේදා මහජන ආරක්ෂක කමිටුව,පොලිස් කමිටුව සියලු දෙනාම එකතු වෙලා සාකච්ජා කලා ගම්වල මේ තත්ත්වය නැති කරන්න නීති සංශෝධනයක් වෙන්න ඕන. මිනිස්සු මේ ව්‍යවසනයෙන් ගලවා ගන්න නීති විතරක් මදි .ආකල්ප ටික වෙනස් කරන්න ඕන. මහා පරිවර්තනයක් කරන්න ඕන. තමන්ගෙන පටන් ගන්න ඕන. අපි ඒ ආදර්ශය දෙමු. ඒ හින්දාවැඩි කාලයක් යන්න කලින් මේ මත්ද්‍රව්‍ය උවදුර තුරන් කරන්න. බොහොම හොඳ යෝජනාවක් එල්ලුම් ගහ තිරණය කරනවට වඩා හොඳයි මරන්න එල්ලන්න වෙන සාධකය නතර කිරීම. ඒක අපි ආදර්ශයෙන් නැති කරමු.

**ඒ අනුව ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා විසින් ඉදිරිපත් කරන ලද මෙම පුණ්‍යභූමිය තුල නැවත වතාවක් සාමය ස්ථාපිත කර බියෙන් සැකෙන් තොරව ජීවත් වීම සඳහා මෙම මිනීමරු පාතාලය විනාශකර දැමීමටත් මත්ද්‍රව්‍යය ප්‍රවාහනය විනාශ කර දැමීමටත් නැවතත් වතාවක් එල්ලුම්ගස ක්‍රියාත්මක කල යුතු යයි පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට මෙම යෝජනාව ඉදිරිපත් කරමින් මධ්‍යම රජයෙන් ඉල්ලා සිටිම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් සභා සම්මත කරන ලදී.**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.සමරසිංහ කීර්ති බංඩාර හේරත් මහතා ප.ව.12.38 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එච්. මාලක අරුණ කුමාර මහතා ප.ව.12.38 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන මහතා ප.ව.12.38 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී නිමල්කා කොටඹගේ මහත්මිය ප.ව.12.38 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

**(ඉ) IV.** <u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක **6.(ඉ). IV** දරණ යෝජනාව</u>

මා විසින් යෝජනා කරන 6.(ඉ). **IV** දරණ යෝජනාව අංගමුව සායන මධ්‍යස්ථානයේ පවත්වාගෙන යන පඩුවස්නුවර නැගෙනහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ කුරු/කුපු/3445 හා 2026.06.15 දිනැති තක්සේරු වාර්තාව අනුව රු.15,000.00(පහලොස්දහසක) මාසික කුලිය මත ඉදිරි වර්ෂ තුනක කාලයක් සඳහා ගිවිසුම් ගත වීම සුදුසු බව යෝජනා කරනවා

<u>ගරු මන්ත්‍රී ජේ.එම්. දිලිප් ජයසිංහ මහතා - (ජා.ජ.බ)</u>

සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් ඉදිරිපත් කරන ලද අංගමුව සායන මධ්‍යස්ථානයේ පවත්වාගෙන යන පඩුවස්නුවර නැගෙනහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ කුරු/කුපු/3445 හා 2026.06.15 දිනැති තක්සේරු වාර්තාව අනුව රු.15,000.00(පහලොස්දහසක) මාසික කුලිය මත ඉදිරි වර්ෂ තුනක කාලයක් සඳහා ගිවිසුම් ගත වීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

**(ඉ) V.** <u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක **6.(ඉ). V** දරණ යෝජනාව</u>

මා විසින් යෝජනා කරන 6.(ඉ). **V** දරණ යෝජනාව 6-607-01-x හා 6-607-03-ix වැය ශිර්ෂය යටතේ විශ්ව ළමා දින වැඩසටහන පැවැත්වීම සඳහා 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් රු.450,000.00 ක මුදලක් වැය දැරීමට යෝජනා කරමි.

<u>**ලෝක ළමා දින සැමරුම් වැඩසටහන - 2026.**</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ මූලිකත්වයෙන් ලෝක ළමා දිනයට සමගාමීව ලියාපදිංචි පෙර පාසල් 76 ක දරුවන් දහසක පමණ සහභාගීත්වයෙන්, ඔවුන්ගේ දැනුම , ආකල්ප ,කුසලතා සංවර්ධනය සඳහා සෞන්දර්යාත්මක වැඩසටහනක් පැවැත්වීම හා දරුවන් සඳහා ඉගෙනුම් උපකරණ කට්ටලයක් ලබාදීම.

අරමුණු-

- බල ප්‍රදේශයේ පාසල් අධ්‍යාපනයට ඇතුලත්වීමට සුදුසුකම් ලැබූ දරුවන්ගේ කුසලතා ඉහල නැංවීම සඳහා අධ්‍යාපන උපකරණ ලබාදීම.
- දැනුම,ආකල්ප,කුසලතා වලින් යුතු මානව හිතවාදී දරු පිරිසක් සමාජයට දායාද කිරීම.

ක්‍රියාත්මක කරන ක්‍රම වේදය-

- 2026 වසරේ පෙර පාසල් අධ්‍යාපනය ලබන දරුවන්ගේ සංඛ්‍යා ලේඛන අනුව ලබන වසරේ පාසල් අධ්‍යාපනයට ඇතුලත් වන දරුවන් හදුනාගැනීම.
- ඇස්තමේන්තුවට අදාලව දරුවන් දහසක් (1000 ක්) සදහා අධ්‍යාපන උපකරණ ලබාදීම.

අරමුදල් ප්‍රභවය - සභා අරමුදල්
දිනය - 2026.10.02
ස්ථානය - හෙට්ටිපොල සතිපොළ භූමිය

**<u>ලෝක ළමා දින සැමරුම් වැඩසටහන - 2025</u>**

ඇස්තමේන්තුව -

| අ/අ | වැඩ විස්තරය | අවශ්‍ය භෞතික හා මානව සම්පත් | ප්‍රමාණය | ඒකකය ක මිල රු: | දළ වියදම රු : |
|---|---|---|---|---|---|
| 01 | පෙර පාසල් වලින් හදුනාගත් ලබන වසරේ පාසල් අධ්‍යාපනයට ඇතුලත් වන දරුවන් දහසක් (1000 ක්) වෙත අධ්‍යාපන උපකරණ ලබාදීම | (එක් දරුවෙකු සදහා ලබාදෙන උපකරණ)<br>පැන්සල් පෙට්ටි (පර්ස්)<br>Pencil 01<br>Eraser 01<br>Cutter 01 | <br><br>1000<br>1000<br>1000<br>1000 | <br><br>215.00<br>40.00<br>25.00<br>40.00 | <br><br>215,000.00<br>40,000.00<br>25,000.00<br>40,000.00 |
| 02 | ලෝක ලමා දිනයට සමගාමීව පෙර පාසල් වලින් හදුනාගත් ලබන වසරේ පාසල් අධ්‍යාපනයට ඇතුලත් වන දරුවන් දහසක් (1000 ක්) සඳහා ප්‍රසාංගික වැඩසටහනක් පැවැත්වීම | සම්පත්දායකත්වය<br>01 .නාට්‍ය ශිල්පීන් 04 සඳහා 3500/- බැගින්<br>02.සංගීත ශිල්පීන්<br>සර්පිනා වාදනය සඳහා<br>තබ්ලා වාදනය සඳහා<br>03. අංගරචනය (වෙස් ගැන්වීම) | | | 14,000.00<br>4,500.00<br>4,500.00<br>8,000.00 |
| 03 | ශබ්ද විකාශන යන්ත්‍ර හා ආලෝකකරණය | | | | 35,000.00 |
| 04 | වේදිකා සැරසිලි | | | | 15,000.00 |
| 05 | එලිමහන් වේදිකාව සඳහා | | | | 25,000.00 |
| 06 | ශිල්පීන් 07 ක් සඳහා සංග්‍රහ වියදම් | උදේ ආහාර (ඉදි ආප්ප පාර්සල්)<br>රෝල්ස්<br>තේ<br>මාළු කෑම පාර්සල් | 07<br>07<br>07<br>07 | 250.00<br>90.00<br>40.00<br>500.00 | 1750.00<br>630.00<br>280.00<br>3500.00 |
| 07 | වෙනත් (අවශ්‍ය වුවහොත් පමණි) | | | | 17,840.00 |
| 08 | එකතුව | | | | 450,000.00 |

**<u>ගරු මන්ත්‍රීනී ඊ.ජ්. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය - (ජා.ජ.බ)</u>**

සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් ඉදිරිපත් කරන 6-607-01-x හා 6-607-03-ix වැය ශිර්ෂය යටතේ විශ්ව ළමා දින වැඩසටහන පැවැත්වීම සඳහා 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඒ) වගන්තිය**

**ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් රු.450,000.00 ක මුදලක් වැය දැරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම් ටී.එම්.තස්ලිම් මහතා ප.ව.12.39 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.අශෝක හේරත් මහතා ප.ව.12.39 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ජී.රංජිත් නවරත්න මහතා ප.ව.12.39 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්. විරාජ් මලින්ද ඩයස් මහතා ප.ව.12.39 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

**<u>(ඉ) VI. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය විසින් කරනු ලබන අංක 6.(ඉ).VIදරණ යෝජනාව</u>**

ඔබතුමිය යෝජනාව ඉදිරිපත් කරන්න.

**<u>ගරු මන්ත්‍රීනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි. බණ්ඩාරකොස්වත්ත හුනුගම පුස්තකාලයේ පුහුණු පාඨමාලා සහ අනිකුත් වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් උඩුමහලක් තැනීම සුදුසු බව යෝජනා කරනවා..

**<u>ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මහතා - (ශ්‍රී.ල.පො.පෙ)</u>**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා

**<u>ගරු මන්ත්‍රීනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)</u>**

බණ්ඩාරකොස්වත්ත පුස්තකාලය කියන්නේ පාඨක සංඛයාව 900ක් පමණ සිටින පුස්තකාලයක් දෙවෙනි වන්නේ හෙට්ටිපොල මහජන පුස්තකාලයට පමණයි. පුස්තකාලය වටා පරිශ්‍රය පර්චස් 2,3 වගේ ප්‍රමාණයක් තියෙන්නේ. මේ පුස්තකාලය වැඩමුළු රාශියක් මේ වසරෙත් පැවැත්තුවා ප්‍රජා සංවර්ධන වැඩමුළු, දරුවන්ගේ රචනා තරඟ වැනි විවිධ වැඩමුළු .මේ වැඩමුළු පවත්වන්න මේ පුස්තකාලය ඇතුලේ ඉඩක් නැ .වැඩමුළු පවත්වන වෙලාවට පාඨකයන්ට අවහිරතාවයක් ඇති වෙනවා මේ දින වල මැහුම් පුහුණු පාඨමාලාවක් පැවැත්වෙනවා. භූමිය ඉඩ මදි නිසා උඩුමහලක් තැනීම තමයි මම යෝජනා කරන්නේ . ප්‍රදේශයේ ක්‍රියාත්මක වන පුහුණු වැඩමුළුවලට වෙනත් ස්ථානයක් නොමැති විම නිසා මේ උඩුමහලක් තැනිම ඉතාමත් සුදුසු යැයි කියා මම කියා සිටිනවා.වගේම තමයි අපේ හුණුගම පුස්තකාලයේ අවට වටපිටාව මාන කැලෙන් වටවුන වනාන්තරයක්වගේ තමයි. වසරකට කීප වතාවක් මේ මාන කැලේ සුද්ද කරනවා . ඒත් දැන් සභාවෙන් ඒ කටයුතු සිද්ද වෙලා නැ. සභාවෙන් ඒ වට පිටාව සුද්ද කිරිමේ අවශතාවක් පවතිනවා.ඒ වගේම එතන අසල කොහොඹ ගසක් තියනවා.ඒ කොළ වැටිලා වැහි පිලී පිරිලා වහලය තෙමෙනවා.ඒ වගේම තමා වැසිකිලියෙ දොර කැඩිලා තියනවා.තවම දොර සවි කරලත් නැ.

ඒ වගේම මම කතා කරන්නෙ බණ්ඩාරකොස්වත්ත කොට්ඨාශෙ ගැන.වසමෙ ඔබතුමාලගෙ පාක්ෂිකයකුගෙ මළ ගෙයක් වුනා.හොඳට ආලෝකය තියන තැනක.එතනට තාවකාලිකව විදී පහනක් සවි කලා.මේ සභාවෙ පස් වතාවකට වඩා කියලා තියනවා පන්සලේ ලයිට් දෙක ඇතුළු ලයිට් පහක් ගැන.අද වෙනකම් හදලා නැ.අපේ යෝජනා දුන්නට ක්‍රියාත්මක වුනේ නැ.ඒ ගැන කණගාටුව ප්‍රකාශ කරනවා.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

මන්ත්‍රිතුමිය අදාල යෝජනාව ගැන පමණක් කථා කරන්න

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.සමරසිංහ කීර්ති බංඩාර හේරත් මහතා ප.ව.12.40 ට පමණ ගරු සභාවට පැමිණියා .
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පි.එම්. කුමාරසේන මහතා ප.ව.12.40 ට පමණ ගරු සභාවට පැමිණියා .
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.අශෝක හේරත් මහතා ප.ව.12.42ට පමණ ගරු සභාවට පැමිණියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී නිමල්කා කොටඹගේ මහත්මිය ප.ව.12.42ට පමණ ගරු සභාවට පැමිණියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්. විරාජ් මලින්ද ඩයස් මහතා ප.ව.12.42 ට පමණ ගරු සභාවට පැමිණියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එච්. මාලක අරුණ කුමාර මහතා ප.ව.12.45ට පමණ ගරු සභාවට පැමිණියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ජී.රංජිත් නවරත්න මහතා ප.ව.12.45ට පමණ ගරු සභාවට පැමිණියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.එම්.උපුල් නිශාන්ත මහතා ප.ව.12.45 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා

**<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>**

සභාපතිතුමා නිශාන්ති මන්ත්‍රිතුමිය බොහොම කාලෝචිත යෝජනාවක් ගෙනාවා. ඒ යෝජනාවට ගේන අතර එතුමිය පසු විපරමක් කළා මෙන්න මේ යෝජනා ක්‍රියාත්මක වුනේ නැ කියලා .එතුමිය ගෙනාවේ බණ්ඩාරකොස්වත්ත පුස්තකාලය තවත් දෙමහල් කරලා ඒක හදන්න කියන එක. මම ඉල්ලීමක් කරනවා ඔබතුමාගෙන් බණ්ඩාරකොස්වත්ත,කනෝගම, කිතරම්මුල්ල,බරම්පොල ,හිඳව,මුනමල්දෙණිය,පුස්තකාලය මේවා

සේරම පරිත්‍යාගශීලීන් පරිත්‍යාග කරපු ඉඩම් වල මේවා හැදුවේ. ගෙනාපු යෝජනාවට මං ඌණ පූර්ණයක් ගේනවා උඩුමහල හදන්න පුලුවන් අත්තිවාරම් උඩ නෙමේ මේක හදලා තියෙන්නේ හැබැයි තාක්ෂනික නිලධාරීන් දාලා දෙමහල් ගොඩනැගිල්ලක් බවට පත් කලොත් මෙ කියපු පහසුකම් ගොඩනගන්න පුලුවන්. පුස්තකාල වල නව තාක්ෂණයත් එක්කලා අළුත් වැඩියා කරන්න කියලා ඌණ පුරණයක් ගේනවා මොකද දැන් පුස්තකාල වලට පාඨකයො යන්නේ හරි අඩුවෙන්ගෙදරදීම නව තාක්ෂණය එක්ක දැනුම ලබා ගන්නවා. කිතරම්මුල්ල,හිදව පුස්තකාල අලුත් වැඩියා කරන්න කමිටු වල අනුමත කලා ගරු සභාපතිතුමාගෙන් මං ඉල්ලීම් කරනවා මේවා අධික්ෂණය සඳහා කණ්ඩායමක් පත් කරන්න කියලා.වාහනය දීලා යවන්න මාසයකට එක වතාවක් හරි. පෙර පාසල් වලට එහෙම යවන්න. ඒ නිසා එතුමිය ගෙනාපු යෝජනාවට තමා මං මේ ඌණ පුරණය ගෙනාවෙ පුස්තකාල පද්ධතිය පිළිබඳව සැලකිලිමත් වෙන්න කියලා ඉල්ලිමක් කරනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.එම් උපුල් නිශාන්ත මහතා ප.ව.12.50ට පමණ ගරු සභාවට පැමිණියා
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම් තස්ලීම් මහතා ප.ව.12.52ට පමණ ගරු සභාවට පැමිණියා

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

හුණුගම පුස්තකාලයේ මං ගිය සතියෙත් වැඩමුළුවකට සම්බන්ධ වුනා . ඉඩකඩ මදි පර්චස් 2 යි ගානක භූමියක තමයි මේ ගොඩනැගිල්ල හදලා තියෙන්නේ උඩුමහලක් හදන්න තරම් පාදම සවිමත් නෑ.ඒ නිසා දෙමහල් ගොඩනැගිල්ලක් හදන්න ඉඩකඩ නෑ. ඒ නිසා සුදුසු ඉඩමක,මේ වෙනකොට පුස්තකාල කමිටුව විසින් තීරණය කරලා තියෙනවා. තාක්ෂණය සඳහා හොඳ වැඩසටහන් නිර්මාණය කරලා හොඳ පාඨකාගාර වගේම ශ්‍රවණාගාර පහසුකම් සහිත පුස්තකාලයක් ඔය ප්‍රදේශයේම ගොඩනැගිල්ල විශාල කරන්න . ඉදිරියට සාකච්ඡා කරලා මේ පිළිබඳ සොයා බලලා ඉදිරියේදි වැඩපිළිවෙලක් හදා ගමු කියලා මම අදහස් කරන්නේ.

**ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය විසින් ඉදිරිපත් කරන බණ්ඩාරකොස්වත්ත හුණුගම පුස්තකාලයේ පුහුණු පාඨමාලා සහ අනිකුත් වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් උඩුමහලක් තැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

**<u>(ඉ) VII. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.ඩී.මනෝකුමාර එදිරිසිංහ මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).VIIදරණ යෝජනාව</u>**

ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

**<u>ගරු මන්ත්‍රී එම්.ඩී. මනෝ කුමාර එදිරිසිංහ මහතා - ( ස.ජ.බ)</u>**

පසුදිනක ඉල්ලා අස්වූ මුදල් කමිටුවේ විපක්ෂ මන්ත්‍රීවරුන් තිදෙනා වෙනුවෙන් නැවත වතාවක් නව මන්ත්‍රීවරු හා මන්ත්‍රීවරියන් තිදෙනා මුදල් කමිටුව සඳහා පත් කිරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු මන්ත්‍රීනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)

ගරු මන්ත්‍රීනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - (ස.ජ.බ)

ගරු මන්ත්‍රී ආර්.ඩී.එම්. ජයන්ත දිසානායක මහතා - (ස.ජ.බ)

**<u>ගරු මන්ත්‍රීනී ඩබ්.ටී.එම්. චාන්දනී දීපිකා රත්නායක මහත්මිය - ( ස.ජ.බ)</u>**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.ඩී.මනෝකුමාර එදිරිසිංහ මහතා විසින් ඉදිරිපත් කරන පසුදිනක ඉල්ලා අස්වූ මුදල් කමිටුවේ මන්ත්‍රීවරියන් තිදෙනා වෙනුවෙන් නැවත වතාවක් පහත සඳහන් නව මන්ත්‍රීවරු හා මන්ත්‍රීවරියන් තිදෙනා මුදල් කමිටුව සඳහා පත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**ගරු මන්ත්‍රීනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)**

**ගරු මන්ත්‍රීනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)**

**ගරු මන්ත්‍රී ආර්.ඩී.එම්. ජයන්ත දිසානායක මහතා - ( ස.ජ.බ)**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.ඩී.ඉෂාන් මධුශංක පිරීස් මහතා ප.ව.12.42 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

**<u>(ඉ) VIII. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).VIIIදරණ යෝජනාව</u>**

මා විසින් යෝජනා කරන 6.(ඉ). **VIII** දරණ යෝජනාව 607-03-i වැය ශිර්ෂය යටතේ රු.500,000.00 ක මුදලක් වෛද්‍යආධාර සඳහා වෙන් කර ඇති බැවින් පහත නම් සඳහන් අය සඳහා ආධාර ලබා දීමට 1987 ප්‍රාදේශීය සභා

පනතේ අංක 132(ඔ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් වැය දැරීමට යෝජනා කරමි.

1. හලාවත නගර සභාවේ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ජුඩ්.චච්නි මහතා - හෘද රෝගය-තීරණය කරණ ලද මුදලක්
2. වාරියපොල ප්‍රාදේශීය සභාවේ සංවර්ධන නිලධාරී එස්. එන්.එස්.බී.කමලාවති මහත්මිය- හෘද රෝගය තීරණය කරණ ලද මුදලක්
3. හිදියාමුල්ල මූණමල්දෙණිය පදිංචි පී.ජී.ගුණවතී මහත්මිය - ස්නායු ආබධ-රු10,000.00

**ගරු මන්ත්‍රී එම්.ඒ.මංජුල ප්‍රසන්න මංජුල මල්ලව ආරච්චි මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව අනුව පිට සභාවල අය සඳහා රු.10,000.00 ක් මුදලක් ලබා දීම සුදුසු බව කියමින් එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව හලාවත නගර සභාවේ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ජුඩ්.චච්නි මහතා හෘද රෝගය වෙනුවෙන් රු.10,000.00 ක මුදලක් වාරියපොල ප්‍රාදේශීය සභාවේ සංවර්ධන නිලධාරී එස්. එන්. එස්. බී.කමලාවති මහත්මිය හෘද රෝගය.10,000.00 ක මුදලක් ද, හිදියාමුල්ල මූණමල්දෙණිය පදිංචි පී.ජී.ගුණවතී මහත්මිය ස්නායු ආබාධරු.10,000.00ක මුදලක්ද , 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඔ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් වැය දැරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත සභා සම්මත කරන ලදී .**

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

**(ඉ) IX. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මාපා ආශෝක හේරත් මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). IX දරණ යෝජනාව**

ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී එම්. අශෝක හේරත් මහතා- (ජා.ජ.බ)**

ප්‍රාදේශිය සභාවට අයත් මාර්ගවල දෙපස පිරිසිදු කිරීම සඳහා ජලය බැස යෑම සඳහා කානු පද්ධතිය යථාවත් කිරීම සුදුසු බව යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී නිමල්කා කොටඹගේ මහත්මිය - (ජා.ජ.බ)**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එම්. අශෝක හේරත් මහතා- (ජා.ජ.බ)**

සභාවට අයත් පාරවල් විශාල ප්‍රමාණයක් තියෙනවා . ඒ වගේම පාරවල් දෙපස මාන ගොල්ලක් හැදිලා පාරටම ඇවිල්ලා තියෙනවා. වැහි දවසක යද්දි ප්‍රාදේශිය සභා පාරවල් තරමක පටු පාරවල් තියෙන්නේ .වැහි දවස් වලට මේ මාන පාරට පාත් වෙලා වියනක් යටින් යනවා වගේ තමයි යන්න වෙන්නෙ .පාර දෙපැත්තේ අඩුම වශයෙන් අඩි 4,5ක්වත් සුද්ද කරගන්න පුලුවන් නම් සහ පාර තියෙන්නේ දෙපැත්තේ ඉඩම් වලට පහතින් ගොඩාක් දුරට. එතකොට වතුවල තියෙන වතුරත් පාරට ඇවිල්ලා පාර හැරිලා ගිහින් තියෙනවා .ඒක නිසා කාණු පද්ධතියත් පිරිසිදු කරගෙන ජලය බැස යාමට නිවරැදිව සකස් කර ගන්න පුළුවන් නම් ඒක වටිනවා .අනිත් එක තමයි රාත්‍රි කාලයේ ගමන් කිරිමේදි බයිසිකල් එහෙම යද්දි වල් සතුන් ඉත්තැවන් ,වල් ඌරන් වගේ පාරට පැමිණිලා අනතුරු සිද්ද වෙනවා . පසුගිය සතියේ අපි ප්‍රදේශිය ලේකම් කාර්යාලය, සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලය ,ප්‍රාදේශිය සභාව එක්ක සම්බන්ධ වෙලා ඩෙංගු වැඩසටහනක් කළා. ඒකෙදිත් අපිට පෙනුනා කාණු වල නිවැරදිව වතුර බහින්නේ නැතිව තැන් තැන් වල හිටලා ඒවායෙත් ඩෙංගු කීටයෝ හිටියා. ඒ නිසා නිවැරදි කාණු පද්ධතියක් සහ දෙපස පිරිසිදු කරලා දුන්නොත් අනතුරු වලක්වා ගන්න පුළුවන් කියන අදහස මගේ තියෙනවා ඒක තමයි මගේ යොජනාව

- ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී ආර්.ඩී.එම්. ජයන්ත දිසානායක මහතා ප.ව.13.00 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී ඩබ්.ජී.අජිත් ලක්ෂ්මන් මහතා ප.ව.13.00 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

**ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)**

ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි.එතුමාට ස්තුතිවන්ත වෙනවා ඒ යෝජනාව ගෙන ඒම සම්බන්ධව.මාන පිලිබඳව කතා කරද්දි මාන කැළේ බොහොම වසංගතයක් වෙලා තියෙන්නෙ.මාන කැලේ ගලවලා අයින් කරත් නැවත එනවා. පහුගිය කාලේ තෙල් ගැහුවා.නමුත් මෙක විනාශ කරන්න බැ.සභාවක් විදිහට වැඩ පිලිවෙලක් අවශ්‍ය වෙනවා.එනිසා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා සභාවක් විදිහට අපි ඔක්කොම එකතු වෙලා යම් වැඩපිලිවෙලක් හදමු මාන විනාශ කරන්න.

- ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී ඩබ්.ජී.අජිත් ලක්ෂ්මන් මහතා ප.ව.13.04 ට පමණ ගරු සභාවට පැමිණියා.
- ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී ආර්.ඩී.එම්. ජයන්ත දිසානායක මහතා ප.ව.13.06 ට පමණ ගරු සභාවට පැමිණියා

**ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)**

පසුගිය කාල පරිච්ඡේද පුරාවටම පාර කැපුවට කාණු පද්ධතිය අලුත්වැඩියා වුනේ නෑ. මං ඉල්ලීමක් කරනවා පාර හදන්න දැන් අලුත් මැෂින් තියනවා කාණු කපාගෙන යන්න පුළුවන්. කොච්චර පාර කැපුවත් වැඩක් නෑ කාණු

පද්ධතිය කපන්නේ නැත්නම්. මාස දෙකෙන් පාර ආයෙත් තිබ්බ තත්වෙටම පත් වෙනවා. ඒ නිසා මාර්ග හදන්න කලින් කාණු පද්ධතිය හදන්න.

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

පාරවල් ඉක්මනට කැඩෙන්නේ කාණු පද්ධතිය නැති නිසා තමයි. පසුගිය කාලයේ අපි බොහෝ පාරවල්වල කාණු පද්ධතිය හදලා තමයි පාර හැදුවේ. ඒ විතරක් නෙවෙයි JCB යන්ත්‍රය යොදලා කාණු පද්ධතිය හදන වැඩේ ඉස්සරහට යන්න ඕන. ඊළගට අර මාන කැලේ සම්බන්ධයෙන් උප සභාපති තුමා කිව්වේ රු.25.00 ට ගන්නවා කියලා.ඒ නිසා පශු සම්පත් අමාත්‍යාංශයෙන් ක්‍රියාත්මක වෙමින් ඉන්නවා සත්ව ආහාර වලට මේක යොදාගන්න. දැනට අපි හොයලා බැලුවා ඉන්දියාවේ නිෂ්පාදනය කරනවා සයිඩ්ප්ලැශර් එකක්. මම අන්තර්ජාලයට ගිහින් බැලුවා. ඒ නිසා අපි පළාත් පාලන දෙපාර්තමේන්තුවත් එක්ක සාකච්ඡා කරලා මැෂින් දෙකක් තුනක් ගන්න තීරණය කරලා තියනවා. හේතුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තිබුණ ට්‍රැක්ටර් මේ වෙන කොට අපි තුනක් ලබා ගෙන තියනවා.

**ඒ අනුව ප්‍රාදේශීය සභා මන්ත්‍රි මාපා ආශෝක හේරත් මහතා විසින් ඉදිරිපත් කරන ප්‍රාදේශිය සභාවට අයත් මාර්ගවල දෙපස පිරිසිදු කිරීම සඳහා ජලය බැස යෑම සඳහා කානු පද්ධතිය යථාවත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

**(ඉ) <u>X. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.එම්.නන්දසිරි මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). X දරණ යෝජනාව</u>**

ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න

**<u>ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)</u>**

අනුක්කනේ හන්දියේ සිට දාස කඩේ දක්වා මාර්ගය අළුත්වැඩියා කිරීම සුදුසු බව යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී එම්. කේ.ආර්. හුසේයින් මහතා - ( ස.ජ.බ)</u>**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)</u>**

ගරු සභාපති තුමනි, මේ මාර්ගය තාර දමා සකස්කරලා තියනවා. නමුත් මේ වන කොට තැන් තැන්වල වලවල් ගැහිලා. මං හිතනවා මේක හැකි ඉක්මනින් අළුත්වැඩියා කිරීමට අවශ්‍ය කරුණු සිදු කරන්න ඕන. ඔබ තුමා දන්නවා නිකපිටිය පාර ගත්තම ලොකු වලවල් ප්‍රමාණයක් හැදිලා තියනවා. ඒ වළවල් අළුත්වැඩියා කරන්න ලොකු වියදමක් දරන්න වෙලා තියනවා. ඡන්දෙන් පත්වෙච්ච මහජන නියෝජිතයා විදියට ඔබතුමාට ගෞරවනීය ස්තූතිය පුද කරනවා ඒ පාරට ලක්ෂ 70 ක් දාලා තියනවානම්.ඒ වගේම අනුක්කනේ හංදියේ ඉදලා දැන් චූටි චූටි වලවල් තියෙන්නේ.දැන්ම ඕක අළුත්වැඩියා කළොත් සාමාන්‍ය මුදලකින් කරන්න පුළුවන්. හැබැයි නොකර හිටියොත් ඔය පාරටත් ලොකු මුදලක් යොදන්න වෙන මට්ටමට වලවල් හැදෙනවා. මොකද ඒ තරම් වාහන ගමනාගමනය කරන ප්‍රධාන මාර්ගයක් විදියට තියෙන්නේ. ඔබතුමාගෙන් නිහතමානීව ඉල්ලා සිටිනවා මෙම මාර්ගය අළුත්වැඩියා කර දෙන්න කියලා.

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

එතුමාගේ යෝජනාව මමත් ස්ථිර කරනවා. අපි මේ වෙනුවෙන් වෙනමම නඩත්තු ඒකකයක් ආරම්භ කරනවා. මම මේක මීට කලිනුත් කිවුවා. අපි සෙකන්ඩ් කෝඩ් දාන්න ඕන පාරවල් තෝරාගෙන සෙකන්ඩ් කෝඩ් දාලා . චූටි වලවල් හැදිලා තියන පාරවල් ප්‍රිමික්ස් දාලා විශාල වලවල් හැදිලා තියෙන පාරවල් වල ABC දාලා තලලා ප්‍රිමික්ස් කරන්න වැඩපිළිවෙල අපි හදලා තියෙන්නේ. දැනට ගැටළුවකට තියෙන්නේ තාර හොයාගන්න බෑ. ලෝක යුද්ධයත් එක්ක තාර හැංගිලා මිල වැඩිවෙලා. ඒ නිසා ඒ හැංගිච්ච තාර ටිකත් අපි හොයාගන්න උත්සාහ කරනවා.

**ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.එම්.නන්දසිරි මහතා විසින් ඉදිරිපත් කරන ලද අනුක්කනේ හන්දියේ සිට දාස කඩේ දක්වා මාර්ගය අළුත්වැඩියා කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

**(ඉ) <u>XI. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එච්.එම්.නිශ්ශංක රම්‍ය කුමාර හේරත් මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XI දරණ යෝජනාව</u>**

ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න

**<u>ගරු මන්ත්‍රී එච්.එම්. නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා - (ශ්‍රී.ල.පො.පෙ)</u>**

2026 මන්ත්‍රී යෝජනා යටතේ මන්ත්‍රීවරයෙක් වෙනුවෙන් ලබාදෙන රු.ලක්ෂ 5 ක මුදල යටතේ මකුල්වැව ග්‍රාම නිලධාරී කාර්යාලය අසල මකුල්වැව පොල්කුඹුර දක්වා ඇති මාර්ගය රන්බන්ඩා මහතාගේ නිවස අසල සිට ඉදිරියට තාර දමා සංවර්ධනය කිරීම සුදුසු බව යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එච්.එම්. නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා - (ශ්‍රී.ල.පො.පෙ)**

ගරු සභාපතිතුමනි, පසුගිය අයවැය යෝජනාව පරාජය වුවත් යෝජනාව සම්මත වූවා සේ සලකා කටයුතු කරගෙන යන මොහොතක ගරු රංජි මන්ත්‍රී තුමාගේ යෝජනාවක් යටතේ මන්ත්‍රීවරු 38 දෙනා වෙනුවෙන් රු. ලක්ෂ පහක් මාර්ග සංවර්ධනය සඳහා ලබාදෙන ලෙස යෝජනාවක් ඉදිරිපත් වෙලා තියනවා. ඒ යෝජනාව යටතේ තමා මං මේ මකුල්වැව පොල්කුඹුර දක්වා ඇති මාර්ගය රංබණ්ඩා මහතාගේ නිවස අසල සිට සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා සිටින්නේ. මේ මාර්ගය විතරක් නොවෙයි .මේ මන්ත්‍රීවරු 38 දෙනාටමත් ඒ අවස්ථාව ලබා දෙනවා නම් හොඳයි. විශේෂයෙන්ම මතක් කරා කෝටි 6 කට අධික අමතර ආදායමක් ලැබිලා තියනවා කියලා ප්‍රාදේශීය සභාවට. ඉතින් ඒවත් මහජනතාවගේ මුදල්. ඉතින් මහජනතාවගේ මුදල් මහජනතාව වෙනුවෙන්ම ඔවුන්ගේ සංවර්ධන අවශ්‍යතාවයන් වෙනුවෙන්ම යොදන්න කියන ඉල්ලීම කරනවා. බොහොම ස්තූතියි.

**ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.නිශ්ශංක රම්‍ය කුමාර හේරත් විසින් ඉදිරිපත් කරන 2026 මන්ත්‍රී යෝජනා යටතේ මන්ත්‍රීවරයෙක් වෙනුවෙන් ලබාදෙන රු.ලක්ෂ 5 ක මුදල යටතේ මකුල්වැව ග්‍රාම නිලධාරී කාර්යාලය අසල මකුල්වැව පොල්කුඹුර දක්වා ඇති මාර්ගය රන්බන්ඩා මහතාගේ නිවස අසල සිට ඉදිරියට තාර දමා සංවර්ධනය කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී**

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

**(ඉ) XII. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එන්.දිල්හානි මහත්මිය විසින් කරනු ලබන අංක 6.(ඉ). XII දරණ යෝජනාව**

ඔබතුමිය යෝජනාව ඉදිරිපත් කරන්න

**ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - ( ස.ජ.බ)**

ගල්ලැහැපිටිය පාතමුල්ල මාර්ගයේ කහටගහ පිටිය වෙල්යාය අලස වු පෙට්ටි බොක්කුව අබලන් තත්වයේ පවතින අතර එය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බව යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - ( ස.ජ.බ)**

ගරු සභාපතිතුමා ගල්ලැහැපිටිය පාතමුල්ල මාර්ගයේ පිවිසුම මේ වන විට අබලන් තත්වයේ තියනවා. ලක්ෂ 30 ක ප්‍රතිපාදන මුදලක් මේ සඳහා වෙන් කරලා තියනවා. ඒ සඳහා ස්තූතිවන්ත වෙනවා. ඒ කාරණාව ඒ අයුරින් සිද්ධ වෙයි කියලා බලාපොරොත්තු වෙනවා.ඒ වගේම සභාපතිතුමනි, ගල්ලැහැපිටිය පාතමුල්ල ප්‍රධාන මාර්ගය මං හිතන්නේ අක්කර 10 ට වැඩි වතු ගණනාවක් තියන විශේෂයෙන්ම ව්‍යාපාරිකයෝ ඉන්න, වාරියපොල ප්‍රදේශයට විකල්ප මාර්ගයක් හැටියට භාවිතා කරන ගල්ලැහැපිටිය පාතමුල්ල ප්‍රධාන මාර්ගයේ කහටගහපිටිය වෙල්යාය අසල තියෙන්නේ මේ බෝක්කුව ස්ථානීය පරීක්ෂණයක් කලොත් වසර 70 කට වැඩියෙ පැරණි බෝක්කුවක් තමයි මේ වෙනකොට තියෙන්නේ.මේ වෙනකොට කම්බි කූරු පවා පැදිලා ඉතාම අබලන් තත්වයේ පවතිනවා.මම හිතන්නේ මන්ත්‍රීතුමාටත් ඒ පිළිබඳ අවබෝධයක් ඇති කියලා මම විශ්වාස කරනවා. ගරු සභාපති තුමනි,මට හිතෙන්නේ 2027 අයවැයෙන් හෝ මධ්‍යම ආණ්ඩුව හරහා ලැබෙන ප්‍රතිපාදනයකින් හෝ මේ බෝක්කුව කඩිනමින් පිළිසකර කර දෙනවා නම් ඉතාමත් අගයකොට සලකනවා.මොකද විශාල පිරිසක් ව්‍යාපාරිකයෝ වගේම තමාගේ වෘතිවල ජීවත්වන පිරිසක් මෙම මාර්ගය ප්‍රයෝජනයට ගන්නවා. විශාල පිරිසක් හා විශාල වාහන ප්‍රමාණයක් ඒ මාර්ගයේ ගමන් කරනවා. 2027 අයවැයෙන් හෝ මධ්‍යම රජයේ මුදලකින් හෝ විශාල මුදලක් යයි. මේකට තාක්ෂණ නිලධාරීන් යොදවලා ස්ථානීය පරීක්ෂණයක් කරලා ඔබතුමත් සහභාගි වනවානම් හොඳයි මේකට. මොකද වැව් 5 - 6ක වතුර මේ බෝක්කුව හරහා ගලාගෙන ගිහිල්ලා වෙල්යායට යන්නේ. ඒ නිසා විශේෂ අවධානය යොමු කරලා ගල්ලැහැපිටිය පාතමුල්ල මාර්ගයේ කහටගහපිටිය වෙල් යාය අසල තියෙන මේ අබලන් පෙට්ටි බෝක්කුව යථාතත්වයට පත් කරලා දෙන මෙන් බොහොම ගෞරවනීය ඉල්ලීම කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී.අජිත් ලක්ෂ්මන් මහතා -(ජා.ජ.බ)**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ. එම්. නන්දසිරි මහතා ප.ව13.19 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය ප.ව.13.19 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි.ගරු මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කළ මේ යෝජනාව ගැන මගේ අවංක ස්තූතිය පුද කරනවා. එතුමිය කිව්වා වගේම මේක අවු. 70 ක්වෙන්න පුළුවන් ඒක ඉදිකරලා. මෙතන බෝක්කුව බොහොම පටුයි. මේ සම්බන්ධව මම මේ මාර්ගය පරීක්ෂා කිරීමට පැමිණි අවස්ථාවක පළාත් සභාවේ තාක්ෂණ නිලධාරී කෝණාර මහතා සහ අපේ සභාවේ ඉන්න තාක්ෂණ නිලධාරී හැමෝම ගියා. මාර්ගය නිරීක්ෂණයෙන් අනතුරුව මම මේ බෝක්කුව ගැනත් කිවුවා. නමුත් මේ බෝක්කුව විශාල මුදලක් යන ව්‍යාපෘතියක්. ඒක නිසා සභාවේ ප්‍රතිපාදන වලින් කරන්න පුළුවන්ද බැරිද කියන එක මම දන්නේ නෑ. මධ්‍යම ආණ්ඩුවෙන් එන ප්‍රතිපාදන මුදලක් සම්බන්ධ කරගෙන මේක ඉදිරියේ දී කරමුයි කියන යෝජනාව එතුමලා මට දැනුම්දුන්නා. ඉතින් මම නැවත වතාවක් එතුමියට ස්තූතිවන්ත වෙමින් ඔබතුමාගේ කාරුණික අවධානයට යොමු කරවමින් මේක ප්‍රතිසංස්කරනය කිරීමට ඉතාමත් කඩිනමින් කරදෙන මෙන් ඉල්ලා සිටිනවා.

**ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එන්.දිල්හානි මහත්මිය_විසින් ඉදිරිපත් කරන ගල්ලැහැපිටිය පාතමුල්ල මාර්ගයේ කහටගහ පිටිය වෙල්යාය අලස වු පෙට්ටි බොක්කුව අබලන් තත්වයේ පවතින අතර එය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී**

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

**<u>(ඉ) XIII . ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XIIIදරණ යෝජනාව</u>**

මීළඟට මා විසින් යෝජනා කරන පරිපූරක ඇස්තමේන්තුව අංක 01 යෝජනාව

2026 වර්ෂයේ ඇස්තමේන්තුගත කරන ලද මුද්දර ගාස්තු ආදායම රු.45,000,000.00 ක් වන අතර 2026.06.30 දිනට ලද ආදායම රු.77,681,587.14 ක් වේ. මේ අනුව වැඩිපුර ලද මුද්දර ගාස්තු ආදායම රු.32,681,587.14 ක් පහත පරිදි පරිපූරක ඇස්තමේන්තු අනුමත කිරීම සුදුසු බව යෝජනා කරනවා.

**පරිපූරක ඇස්තමේන්තු අංක 01**

රු. 6,470,000.00 ක මුදලක් පහත වැය ශීර්ෂයන් සඳහා වෙන් කරන ලදී

| වැය ශිර්ෂය | වැය විස්තරය | අතිරේක ඇස්තමේන්තුව රු. | වියදම් දැරීමට සිදුවන අවශ්‍යතාවය |
|---|---|---|---|
| 1-107-9-X-i | කාර්ය මණ්ඩල පුහුණු (බාහිර/අභ්‍යන්තර) | 500,000.00 | සේවක අභිප්‍රේරණ වැඩසටහන |
| 2-205-06-ii | ඩෙංගු/ඒඩ්ස්/මී උණ රෝග/බෝවන හා බෝ නොවන ආදී රෝග මර්දන වැඩසටහන් | 50,000.00 | රෝග මර්ධන වැඩසටහන් පැවැත්වීම |
| 2-203-9 | වෙනත් ගබඩා ද්‍රව්‍ය | 100,000.00 | ආයුර්වේද මධ්‍යස්ථානයට අවශ්‍ය භාණ්ඩ ලබා ගැනීම |
| 2-204-01-i | සියඹලාගස්වැටිය වැව භූ දර්ශන ව්‍යාපෘතිය භූමි අලංකරණය | 100,000.00 | සියඹලාගස්වැටිය වැව භූ දර්ශන ව්‍යාපෘතිය භූමි අලංකරණ කටයුතු |
| 2-209-09-ii | විශේෂ ව්‍යාපෘති සඳහා | 2,000,000.00 | පාසල් සඳහා කසල බඳුන් ලබා දීම |
| 3-304-01-i | බස් නැවතුම්පොළ හා වෙළඳ සංකීර්ණය නඩත්තු කටයුතු | 920,000.00 | නව වෙළඳ සංකීර්ණයේ වහලය අලුත්වැඩියා කිරීම |
| 3-304-7-i | මෝටර් ග්‍රේඩරය, බැකෝ ලෝඩර් යන්ත්‍රය යොදා මාර්ග නඩත්තුව | 1,000,000.00 | මෝටර් ග්‍රේඩරය සඳහා කුලී ගෙවීම |
| 3-305-7 | මුද්‍රණය කිරීමේ සේවා | 1,500,000.00 | නව ව්‍යාපෘති සඳහා පුවත්පත් දැන්වීම් පල කිරීම |

| | | | |
|---|---|---|---|
| 6-604-2 | යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියාව හා නඩත්තු | 300,000.00 | පුස්තකාල යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියාව |

| ලැබීම් විස්තරය | | | | | වියදම් විස්තරය | | |
|---|---|---|---|---|---|---|---|
| ආදායම් ශීර්ෂය | අය විස්තරය | මුල් ඇස්තමේන්තු මුදල රු. | අතිරික්තය රු. | අතිරික්තය ලැබුනු ආකාරය | වැය ශිර්ෂය | වැය විස්තරය | මුල් ඇස්තමේන්තු මුදල රු. |
| 3-63-i | මුද්‍දර ගාස්තු | 45,000,000.00 | 32,681,587.00 | මුද්දර ගාස්තු ආදායම් වැඩිපුර ලැබීම් | 1-107-9-X-i | කාර්ය මණ්ඩල පුහුණු (බාහිර/අභ්‍යන්තර) | 200,000.00 |
| | | | | | 2-205-06-ii | ඩෙංගු/ඒඩ්ස්/මී උණ රෝග/බෝවන හා බෝ නොවන ආදී රෝග මර්දන වැඩසටහන් | 50,000.00 |
| | | | | | 2-203-9 | වෙනත් ගබඩා ද්‍රව්‍ය | 800,000.00 |
| | | | | | 2-204-01-i | සියඹලාගස්වැටිය වැව භූ දර්ශන ව්‍යාපෘතිය භූමි අලංකරණය | 20,000.00 |
| | | | | | 2-209-09-ii | විශේෂ ව්‍යාපෘති සඳහා | 200,000.00 |
| | | | | | 3-304-01-i | බස් නැවතුම්පොළ හා වෙළඳ සංකීර්ණය නඩත්තු කටයුතු | 200,000.00 |
| | | | | | 3-304-7-i | මෝටර් ග්‍රේඩරය, බැකෝ ලෝඩර් යන්ත්‍රය යොදා මාර්ග නඩත්තුව | 3,000,000.00 |
| | | | | | 3-305-7 | මුද්‍රණය කිරීමේ සේවා | 200,000.00 |
| | | | | | 6-604-2 | යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියාව හා නඩත්තු | 5,000.00 |

**ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ පරිපූරක ඇස්තමේන්තු 01 යෝජනාව පිලිගැනීම සුදුසු බවට මා විසින් ස්ථිර කරනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ. එම්. නන්දසිරි මහතා ප.ව.13.20 ට පමණ ගරු සභාවට පැමිණියා.

**ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)**

ගරු සභාපතිතුමා මේ පරිපූරක ඇස්තමේන්තුවේ 209 ලක්ෂ 2ක් වෙන් කරනවා පාසල් සඳහා කසල බඳුන් ලබා දීම.ඇස්තමේන්තු කරනවා. ලක්ෂ 20ක්.මං දැනගන්න කැමතියි. කසල අපහරණය කිරීම ප්‍රාදේශීය සභාවක වගකීමතමයි නමුත් .දැන් අධ්‍යාපන අමාත්‍යාංශයක් තියෙද්දි පාසල් සඳහා කසල බඳුන් ලබා දෙන්න ඇයි මේ මුදල වෙන් කරලා තියෙන්නේ

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

නොදිරන කසල ඉවත් කිරීමේ වැඩසටහන යටතේ අපිට දැනුම් දීලා තියෙනවා. සියලුම රාජ්‍ය ආයතන අසල කසල බඳුන් තියන ලෙසට.අපි මේක සවිකරන්නෙ පාසල ඇතුලෙ නෙවේ.මේක සවිකරන්නෙ පාසල ඉදිරිපිට හට් එකක් ගහලා කූඩුවක් ගහලා කූඩුව ඇතුලෙ තමයි කසල බඳුන් සවි කරන්නෙ.පාසලේ අයට පුලුවන් කසල වෙන් කරලා දාන්න පුරුදු කරන්න.කසල වෙන් කරලා දාන්න පුරුදු වෙලා නෑ.ඒ නිසා පූර්වාදර්ශයක් ලෙස පාසල ඉදිරිපිට තමයි ස්ථානගත කරන්නේ.මේ පාසල් 10ක් ඉල්ලීම් කරලා තියෙනවා. කසළ බඳුන් දෙන්න කියලා.ඒ අනුව තමයි මේ මුදල වෙන් කලේ.

<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>

ඊළඟට ගරු සභාපතිතුමනි. 200,000ක් වෙන් කරලා තියෙනවා. නව වෙළඳ සංකීර්ණයේ වහලය අලුත්වැඩියා කිරීමට.දැන් මීට කලින් අලුත්වැඩියා 2ක් හරි 3ක් හරි කරා.ඊළඟට අතිරේක ඇස්තමේන්තුවක් දානවා 920,000ක.

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

ගරු මන්ත්‍රීතුමා ඇත්තටම ගත්තොත් මේ ගොඩනැගිල්ලෙ මොනවාහරි ප්‍රශ්නයක් එනවා හැමදාම. ඒ නිසා මේ ගොඩනැගිල්ල ඉදිකිරීමේ තියෙන දොෂ,පසුව සිදු කරපු ප්‍රතිසංස්කරණවල දොෂ විශාල වශයෙන් බලපාලා තියෙනවා.එක්කෝ මේ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් අපි පරීක්ෂණයක් කරන්න ඕන.ඒ හින්දා තවත් මේකෙ හදන්න දේවල් තියෙනවා.හොදම දේ තමයි ඉංජිනේරුවෙක් ගෙන්නලා පරීක්ෂා කරලා මේක සම්පූර්ණයෙන් පසුවිපරමක් කරන එක.ඒක ලබන අවුරුද්දෙ කරනවා.දැන් තියෙන ප්‍රශ්න විසදගන්න ඕනා හින්දා තමයි මේ මුදල වෙන් කරලා තියෙන්නේ.

- ප්‍රාදේශීය සභා ගරු උපසභාපති බන්දුල සමරවික්‍රම මහතා ප.ව.13.23ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත්මහතා ප.ව.13.23ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය පෙ.ව.13.23 ට පමණ ගරුසභාවට පැමිණියා
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ඒ.රංජිත් නවරත්න මහතා ප.ව.13.23 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා ප.ව.13.23 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා
- ප්‍රාදේශීය සභා ගරු උපසභාපති බන්දුල සමරවික්‍රම මහතා ප.ව.13.25 ට පමණ ගරු සභාවට පැමිණියා

**ඒ අනුව ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් ඉදිරිපත් කරන ලද පරිපූරක ඇස්තමේන්තුව අංක 01 පිලිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

**(ඉ) <u>XIV . ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XIVදරණ යෝජනාව</u>**

මීළඟට මා විසින් ඉදිරිපත් කරන අංක 6.(ඉ). XIVදරණ යෝජනාව. 2026.06.11.දින.ජේ.එම්.බී.සේනාරත්න මහතා විසින් ල.දු.034419යටතේ රු.14000.00 ක මුදලක් ඉ/වීරකොඩියාන වීරකොඩියාන එච්.එස්.ජයසුන්දර මහතාගේ මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා ගෙවා ඇත.එම ආදාහනය සිදු නොකෙරූ හෙයින් එම මුදල ආපසු ලබා ගැනීමට ජේ.එම්.බී.සේනාරත්න මහතා කළ ඉල්ලීම මුදල් කමිටු තීරණ අංක 06 යටතේ 2026 .06.24 දින නිර්දේශ වූ අතර ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත එම මුදල ආදායමින් ආපසු ගෙවීමට යෝජනා කරනවා.

ආදාහනය කරනවා කිව්වට මිනිය වළලලා.ඒ නිසා මේ මුදල ආපසු ඉල්ලනවා

<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් ඉදිරිපත් කරන 2026.06.11.දින.ජේ.එම්.බී.සේනාරත්න මහතා විසින් ල.දු.034419යටතේ රු.14000.00 ක මුදලක් ඉ/වීරකොඩියාන හා වීරකොඩියාන එච්.එස්.ජයසුන්දර මහතාගේ මෘත ශරීරය ආදාහනාය කිරීම සඳහා ගෙවා ඇත.එම ආදාහනය සිදු නොකෙරූ හෙයින් එම මුදල ආපසු ලබා ගැනීමට ජේ.එම්.බී.සේනාරත්න මහතා කළ ඉල්ලීම මුදල් කමිටු තීරණ අංක 06 යටතේ 2026 .06.24 දින නිර්දේශ වූ අතර ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත එම මුදල ආදායමින් ආපසු ගෙවීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය ප.ව.13.29 ට පමණ ගරු සභාවට පැමිණියා

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

**(ඉ) <u>XVI . ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XVIදරණ යෝජනාව.</u>**

මීළඟට මා විසින් ඉදිරිපත් කරන අංක 6.(ඉ). XVIදරණ විශේෂ යෝජනාව. දිඨිවා සුළි කුණාටුවෙන් හානියට පත් පළාත් පාලන මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම -2026 පළමු අදියර යටතේ ඇමුණුමෙහි සඳහන් දෙවන වරට පලාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අනුමත වී ඇති මාර්ග 22 ටෙන්ඩර් ගතව සිදු කිරීම සුදුසු බව යෝජනා කරනවා.

**දිට්වා සුළි කුණාටුවෙන් හානියට පත් පළාත් පාලන මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම -2026 පළමු අදියර (2)**
**පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව**

| අනු අංකය | මාර්ගයේ නම | ක්‍රියාකාරකම | ඇස්තමේන්තු වටිනාකම |
|---|---|---|---|
| 1 | අඹගොල්ල ගමමැද සිට පන් අමුණ දක්වා මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම සංවර්ධනය කිරීම | කොන්ක්‍රීට් | 3,000,000.00 |
| 2 | කණපොතුහැර කණුකැටිය මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම | කොන්ක්‍රීට් | 2,000,000.00 |
| 3 | රදලියගොඩ පිංවැව මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම | කොන්ක්‍රීට් | 3,000,000.00 |
| 4 | බැද්දේගම බෝගහ අසල සිට ලේනපැලැස්ස දක්වා මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම | කොන්ක්‍රීට් | 3,000,000.00 |
| 5 | දමුණුව සුසාන භූමි මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම | කොන්ක්‍රීට් | 2,000,000.00 |
| 6 | දොරටියාගෙදර වැව අසල සිට කරත්තමන්කඩ දක්වා මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම | කොන්ක්‍රීට් | 2,000,000.00 |
| 7 | කඩහැර හන්දියේ සිට කඩහැර ගම දක්වා දිවෙන මාර්ගයේ සමන් මහතාගේ ගරාජ් එක අසල සිට නිලමේ මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම. | කොන්ක්‍රීට් | 3,000,000.00 |
| 8 | ඇපලදෙණිය ජයමාවත අතුරු මාර්ගය (කිරිඅඹගහමුල මාර්ගය) කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම | කොන්ක්‍රීට් | 3,000,000.00 |
| 9 | අකරවත්ත වෙල මැද මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම | කොන්ක්‍රීට් | 2,000,000.00 |
| 10 | ගොන්නව අඹගහලන්ද විහාරස්ථානය අසල සිය අක්කර 70 හරහා පිදිවිල්ල සුසාන භූමිය දක්වා මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | තාර | 3,000,000.00 |
| 11 | ඩබ්.ජී.බී.ඒම් ගුණපාල මහතාගේ නිවස අසල සිට නින්දවෙල විහාරස්ථානය දක්වා මාර්ගය කොන්ක්‍රීට් සංවර්ධනය කිරීම | කොන්ක්‍රීට් | 3,000,000.00 |
| 12 | දුනුපොත මංගල මහතාගේ නිවස අසල සිට රත්නටුව දක්වා මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | තාර | 3,047,000.00 |
| 13 | කොළමුණුඔය සිට දිග්ගලගෙදර දක්වා මණ්ඩපොල මාර්ගය තාර දමා සංවර්ධනය | තාර | 4,000,000.00 |
| 14 | රත්මල්ල කටගමුව ගද මැද මාර්ගය තාර දමා සංවර්ධනය | තාර | 4,000,000.00 |
| 15 | රත්මල්ල දුනුපොත ගම මැද මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | තාර | 4,000,000.00 |
| 16 | කොළඹගම රනෝරාව වසම අඹකනුවැව සිට කරඹේ මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම | කොන්ක්‍රීට් | 4,000,000.00 |
| 17 | කොළඹගම පන්සල පිටුපස සිට පාලිත මහතාගේ වී මෝල දක්වා මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම | කොන්ක්‍රීට් | 4,000,000.00 |
| 18 | කොළඹගම කටුමුළුව ඔය ගාව වත්ත මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | තාර | 4,000,000.00 |

| | | | |
|---|---|---|---|
| 19 | මණ්ඩපොල පිවිතුරගම ප්‍රජාශාලාව අසල සිට රඹෑව දක්වා මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | තාර | 4,000,000.00 |
| 20 | තිස්සව ගම මැද මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | තාර | 4,000,000.00 |
| 21 | මැදගම -කිවුල්පිටිය මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | තාර | 5,000,000.00 |
| 22 | මොරගොල්ල කෝරලේවැව වැකන්ද මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | තාර | 5,000,000.00 |
| | **එකතුව** | | **74,047,000.00** |

**<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

**ඒ අනුව ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් ඉදිරිපත් කරන ලද දියීවා සුළි කුනාටුවෙන් හානියට පත් පළාත් පාලන මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම -2026 පළමු අදියර යටතේ ඇමුණුමෙහි සඳහන් දෙවන වරට පලාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අනුමත වී ඇති මාර්ග 22 ටෙන්ඩර් ගතව සිදු කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී**

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

**<u>(ඉ) XVII . ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XVIIදරණ යෝජනාව</u>**

මීළඟට මා විසින් යෝජනා කරන පරිපූරක ඇස්තමේන්තුව අංක 02 යෝජනාව පිලිගැනීම සුදුසු බවට යෝජනා කරනවා.

මෙහිදී පළමු පරිපූරක ඇස්තමේන්තුවෙහි ඉතිරි වූ මුදල් රු. 26,211,587.00 ක මුදල පහත වැය ශීර්ෂයන් සඳහා වෙන් කරන ලදී.

| වැය ශිර්ෂය | වැය විස්තරය | අතිරේක ඇස්තමේන්තුව | වියදම් දැරීමට සිදුවන අවශ්‍යතාවය |
|---|---|---|---|
| | | රු. | |
| 1-103-01 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | 500,000.00 | කාර්යාලයට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම |
| 1-104-02 | යන්ත්‍ර සූත්‍ර උපකරණ අලුත්වැඩියා කිරීම සහ නඩත්තු | 200,000.00 | කාර්යාලීය යන්ත උපකරණ අලුත්වැඩියා කිරීම |
| 1-109-2 | යන්ත්‍ර හා උපකරණ | 700,000.00 | කාර්යාලයට අවශ්‍ය යන්ත්‍රෝපකරණ ලබා ගැනීම |
| 1-109-4 | ලී බඩු හා සවිකිරීම් | 10,000,000.00 | කාර්යාල ගොඩනැගිල්ල වායුසමීකරණය කිරීම, CCTV කැමරා පද්ධතිය සවි කිරීම,සභා ගර්භයේ අමුත්තන් සඳහා වෙන් වූ පුටු ලබා ගැනීම, කාර්යාලය සඳහා අවශ්‍ය අල්මාරි සහ ලී බඩු ලබා ගැනීම |
| 304-1-1 | බස් නැවතුම්පොල හා වෙළඳ සංකීර්ණ නඩත්තු කටයුතු | 500,000.00 | බස් නැවතුම්පොල හා වෙළඳ සංකීර්ණ නඩත්තු කටයුතු |
| 3-304-07-ii | තාර දැමූ මාර්ග අලුත්වැඩියාව | 3,681,587.00 | තාර දැමූ මාර්ග අලුත්වැඩියා කිරීම |
| 3-307-7-iii | හානි රක්ෂණ | 260,000.00 | බහු කාර්ය ගොඩනැගිල්ලේ ගිණි රක්ෂණය ලබා ගැනීම |

| | | | |
|---|---|---|---|
| 3-309-07-ii | ශ්‍රමදාන පදනම මත බෝක්කු ඉදි කිරීම | 1,500,000.00 | කාණු කැට සහ ස්ලැබ් කැට ලබා ගැනීම |
| 309 - 07-iii | නව බෝක්කු සහ පාලම් ඉදිකිරීම | 1,850,000.00 | කඩවලගෙදර ගොමුගොමුව ii අතුරු මාර්ගයේ පෙට්ටි බෝක්කුව ඉදි කිරීම |
| 4-409-09-i | නව ජල සම්බන්ධතා | 200,000.00 | නව ජල මෝටරයක් ලබා ගැනීම සඳහා |
| 5-501-02 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 500,000.00 | අතිකාල සහ නිවාඩු දින වැටුප් ගෙවීම |
| 5-502-01 | ගමන් වියදම් | 150,000.00 | ගමන් වියදම් ගෙවීම |
| 6-607-01-XII | පෙර පාසල් පුහුණු | 20,000.00 | පෙර පාසල් පුහුණු වැඩසටහන් පැවැත්වීම |
| 6-607-03-IV | විවිධ ආගමික අධ්‍යාපන කටයුතු | 50,000.00 | විවිධ ආගමික අධ්‍යාපන කටයුතු |
| 6-607-03-VII | ආබාධිත්පුද්ගලයන් සඳහා ස්වයං රැකියා වැඩසටහන් | 100,000.00 | ආබාධිත පුද්ගලයන් සඳහා ස්වයං රැකියා වැඩසටහන් |
| 6-604-01 | ඉඩම් හා ගොඩනැගිලි අලුත්වැඩියාව හා නඩත්තු | 2,000,000.00 | ප්‍රජා ශාලාවේ වේදිකාව ඉදි කිරීම |
| 6-609-09 | ක්‍රීඩා පිටි සංවර්ධනය | 4,000,000.00 | ක්‍රීඩා පිටියෙහි විදුලි ආලෝක පද්ධතියක් සවි කිරීම |

| ලැබීම් විස්තරය | | | | | වියදම් විස්තරය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම ශීර්ෂය | අය විස්තරය | මුල් ඇස්තමේන්තු මුදල රු. | අතිරික්තය රු. | අතිරික්තය ලැබුනු ආකාරය | වැය ශිර්ෂය | වැය විස්තරය | මුල් ඇස්තමේන්තු මුදල රු. | අතිරේක ඇස්තමේන්තුව රු. | වියදම් දැරීමට සිදුවන අවශ්‍යතාවය |
| 3-63-i | මුද්දර ගාස්තු | 45,000,000.00 | 26,211,587.00 | මුද්දර ගාස්තු ආදායම වැඩිපුර ලැබීම් | 1-103-01 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | 1,800,000.00 | 500,000.00 | කාර්යාලයට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම |
| | | | | | 1-104-02 | යන්ත්‍ර සූත්‍ර උපකරණ අලුත්වැඩියා කිරීම සහ නඩත්තු | 200,000.00 | 200,000.00 | කාර්යාලීය යන්ත්‍ර උපකරණ අලුත්වැඩියා කිරීම |
| | | | | | 1-109-2 | යන්ත්‍ර හා උපකරණ | 500,000.00 | 700,000.00 | කාර්යාලයට අවශ්‍ය යන්ත්‍රෝපකරණ ලබා ගැනීම |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 1-109-4 | ලී බඩු හා සවිකිරීම් | 300,000.00 | 10,000,000.00 | කාර්යාල ගොඩනැගිල්ල වායුසමීකරණය කිරීම, CCTV කැමරා පද්ධතිය සවි කිරීම,සභා ගර්භයේ අමුත්තන් සඳහා වෙන් වූ පුටු ලබා ගැනීම, කාර්යාලය සඳහා අවශ්‍ය අල්මාරි සහ ලී බඩු ලබා ගැනීම |
| | | | | | 304-1-1 | බස් නැවතුම්පොල හා වෙළඳ සංකීර්ණ නඩත්තු කටයුතු | 200,000.00 | 500,000.00 | බස් නැවතුම්පොල හා වෙළඳ සංකීර්ණ නඩත්තු කටයුතු |
| | | | | | 3-304-07-ii | තාර දැමූ මාර්ග අලුත්වැඩියාව | 7,000,000.00 | 3,681,587.00 | තාර දැමූ මාර්ග අලුත්වැඩියා කිරීම |
| | | | | | 3-307-7-iii | හානි රක්ෂණ | 30,000.00 | 260,000.00 | බහු කාර්ය ගොඩනැගිල්ලේ ගිණි රක්ෂණය ලබා ගැනීම |
| | | | | | 3-309-07-ii | ශ්‍රමදාන පදනම මත බෝක්කු ඉදි කිරීම | 1,500,000.00 | 1,500,000.00 | කාණු කැට සහ ස්ලැබ් කැට ලබා ගැනීම |
| | | | | | 309 - 07-iii | නව බෝක්කු සහ පාලම් ඉදිකිරීම | 1,000,000.00 | 1,850,000.00 | කඩවලගෙදර ගොමුගොමුව ii අතුරු මාර්ගයේ පෙට්ටි බෝක්කුව ඉදි කිරීම |
| | | | | | 4-409-09-i | නව ජල සම්බන්ධතා | 200,000.00 | 200,000.00 | නව ජල මෝටරයක් ලබා ගැනීම සඳහා |
| | | | | | 5-501-02 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 800,000.00 | 500,000.00 | අතිකාල සහ නිවාඩු දින වැටුප් ගෙවීම |
| | | | | | 5-502-01 | ගමන් වියදම් | 150,000.00 | 150,000.00 | ගමන් වියදම් ගෙවීම |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 6-607-01-XII | පෙර පාසල් පුහුණු | 10,000.00 | 20,000.00 | පෙර පාසල් පුහුණු වැඩසටහන් පැවැත්වීම |
| | | | | | 6-607-03-IV | විවිධ ආගමික අධ්‍යාපන කටයුතු | 100,000.00 | 50,000.00 | විවිධ ආගමික අධ්‍යාපන කටයුතු |
| | | | | | 6-607-03-VII | ආබාධිත් පුද්ගලය න් සඳහා ස්වයං රැකියා වැඩසටහ න් | 50,000.00 | 100,000.00 | ආබාධිත් පුද්ගලයන් සඳහා ස්වයං රැකියා වැඩසටහන් |
| | | | | | 6-604-01 | ඉඩම් හා ගොඩනැ ගිලි අලුත්වැඩි යාව හා නඩත්තු | 300,000.00 | 2,000,000.00 | ප්‍රජා ශාලාවේ වේදිකාව ඉදි කිරීම |
| | | | | | 6-609-09 | ක්‍රීඩා පිටි සංවර්ධන ය | 500,000.00 | 4,000,000.00 | ක්‍රීඩා පිටියෙහි විදුලි ආලෝක පද්ධතියක් සවි කිරීම |

<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ පරිපූරක ඇස්තමේන්තු -02 යෝජනාව පිලිගැනීම සුදුසු බවට මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>

පොල්කුඹුර පාලම පාරේ තියන මැද පාලම හදන්න ඒ කාලේ ලක්ෂ 10ක් දැම්මා .හැබැයි බැරුව ගියා .දැන් සැහෙන්න මුදලක් යයි. මේ පරිපූරක ඇස්තමෙන්තුවට මුදලක් වෙන් කරලා දාගත්තොත් කවුරුත් විරුද්ධ නෑ . මේ පාර සහ පාලම අලුතින් හදන්න මේක නම් සයිකලයක් නෙමේ පයිනේ යන්නවත් බෑ . ඒ පාරේ වඩුමුන්න කොටස අයින් වුනාම ඒ පාරේ යන්නම බෑ. මේ ගැන සැලකිලිමත් වෙලා ගිරාතලාන කෝරලය වෙනුවෙන් මං හිතන්නේ වැඩිපුර මුදල් ටිකක් වැය කරන්න කියලා ඒක බොහොම කාලෝචිතයි.

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

මන්ත්‍රිතුමා ඒ පොල්කුඹුර පාරේ බෝක්කුව පාලම් හා බොක්කු ව්‍යාපෘතිය යටතේ යෝජනාව ඇවිත් ඒ යෝජනාව අරගෙන තියෙන්නේ අපිට ඒක ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙයි.

**ඒ අනුව ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් ඉදිරිපත් කරන ලද පරිපූරක ඇස්තමේන්තුව අංක 02 පිලිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

සභාවේ ඉදිරි කටයුතු කිරීම සඳහා ගරු උපසභාපති බන්දුල සමරවික්‍රම මහතාට මූලාසනේ භාර දීම සඳහා යෝජනා සම්මත කරගන්න.

<u>ගරු මන්ත්‍රී එච්.එම්.සමරසිංහ කිර්ති බංඩාර හේරත් මහතා - (ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. මෙතැන් සිට මුලාසනයේ වැඩ කටයුතු කිරිමට උප සභාපතිතුමාට මුලාසනය භාර දිමට සුදුසුයි කියා මා යොජනා කරනවා.

<u>ගරු මන්ත්‍රී නිමල්කා කොටඹගේ මහත්මිය - (ජා.ජ.බ)</u>

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා ප. ව13.40 ට පමණ ගරු සභාවෙන් පිටව ගියා.**

**ගරු උපසභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජ.ජ.බ)**

**(ඉ) XVIII . ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XVIII දරණ යෝජනාව**

ඔබතුමා යෝජනාව සභාවට ඉදිරිපත් කරන්න

**ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා- (ස.ජ.බ)**

පහුගිය 05,06 දින දෙකේ මීගමුව බන්ධනාගාරය තුල සිදු වූ අවසනාවන්ත සිදුවී මෙන් මිය ගිය බන්ධනාගාර නිලධාරින් හා රටේ පුරවැසියන් වන රුදවියන් වෙනුවෙන් ශෝකය පල කිරීම වෙනුවෙන් ඉදිරිපත් කරන යෝජනාව මම සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - ( ස.ජ.බ)**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා ප.ව.13.43 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ආර්.එම්.නිලන්ති විජේසිංහ මහත්මිය ප.ව.13.43ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

**ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා - ( ස.ජ.බ)**

ගරු උපසභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි. සභාවක් හැටියට මං තීන්දු කලා ශ්‍රී ලාංකික ජනතා වෙනුවෙන් අපිටත් ඒ ඛේදවාචකය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීම අපේ මනුස්සකම කියන හැඟීම මත තමයි ඒ යෝජනාව ගෙනාවේ. මං විතරක් නෙමේ මුළු ලංකාවෙම මිනිස්සු දුක් හෝ සුසුම් හෙලුවා මේ ඛේදවාචකය පිළිබඳව. මෙ සිද්ධිය වලක්වා නොගත්ත එක පිළිබඳ සියළු දෙනා ඇඟිල්ල දික් කරන්නේ රජයට.මමත් ඒ කතාව තමයි කියන්නේ.අධිකරණ ඇමති වරයාට සමතයකට පත් කරන්න බැහැ කියන්නේ එතුමාගේ නොහැකියාව. ඒකට හේතුවක් හැටියට තමයි අපේ රටේ හොඳ නිලධාරීන් රුදවියන් හැටියට හිටියත් ඒත් මහජනතාව වද හංසා පමුණුවලා බොහොම අමානුෂික විදිහට මිනිමැරුම් කිහිපයක් සිද්ධ වුනා.අද දරුවන්ට දෙමාපියන් අහිමි වුනා, දෙමාපියන්ට දරුවන් අහිමි වුනා.අද මුළු මහත් ශ්‍රී ලංකාවම සෝ සුසුම් හෙලනවා මේ වෙච්ච ඛේදවාචකයට.අද මේ වගේ ඛේදවාචකයට මුහුණ දෙන්න වුනේ ඇත්ත වශයෙන්ම ඔබතුමාලගෙ රජයේ තියන අකාරුණිකකම, නොදැනුවත්කම, නොහැකියාව නිසා. අපේ ආදරණීය බන්ධනාගාර නිලධාරීන් ඒ වගේම අපේ රුදවියන් ඒ සියළුදෙනා වෙනුවෙන් මගේ පෞද්ගලික ශෝකය සහ පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවේ ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් මගේ ශෝකය ප්‍රකාශ කරනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා ප.ව.13.46 ට පමණ ගරු සභාවට පැමිණියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ආර්.එම්.නිලන්ති විජේසිංහ මහත්මිය ප.ව.13.49ට පමණ ගරු සභාවට පැමිණියා.

**ගරු මන්ත්‍රී ඒ.පී. තරංග චම්පික අලහකෝන් මහතා - (ශ්‍රී.ල.පො.පෙ)**

අපි මාධ්‍යයෙන් දැකපු විදිහටත්, අපිට දැනුන විදිහටත් එතන ලොකු ලොකු අඩුපාඩුකම් සිද්ධ වෙලා තියනවා කියලා අපිට දැනෙනවා.අධිකරණ ඇමතිතුමා පොලොවෙ පය ගහලා නැති මනුස්සයෙක් විදිහට තමයි අපිට පේන්නෙ.ගැටුමක් ඇති වුනා.ඇතිවෙලා දෙන්නෙක් මිය ගියා.අධිකරණ ඇමතිතුමා විදිහටත්, බන්ධනාගාර නිලධාරින් විදිහටත් දැනගන්න ඕන අනිවාර්යයෙන්ම ප්‍රතිප්‍රහාරයක් සිද්ධ වෙන බව.මේ සිද්ධියට වගකීම භාරගන්නවා කිව්වා අධිකරණ ඇමතිතුමා.වගකීම භාරගත්තට ඒ නිලධාරීන්ගේ ජීවිතේ ආයේ එන්නෙ නෑ නෙ. මින් ඉදිරියට මේ වගේ දේවල් සිද්ධ නොවෙන්න වැඩ කරන්න රටේ ජනාධිපතිටත් ඇමතිමණ්ඩලයටත් හැකියාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

- ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා ප.ව.13.55 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා ප.ව.13.57 ට පමණ ගරු සභාවට පැමිණියා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා (ස.ජ.බ.)**

මියගිය බන්ධනාගාර නිලධාරීන්ට හා රුදවියන්ට මුලින්ම ශෝකය පල කරනවා.ඇත්තටම මේක වෙච්ච ආකාරය පිළිබඳ රුදවියො එලියට ඇවිල්ලා සඳහන් කරනවා අපි දැක්කා.අරගලය ගෙනාවෙත් ඔබතුමාලා අනිත් අය රාජ සම්පත් විදිනවා.අපිට මුකුත් නෑ.ඒ නිසා තමයි අරගලය ගෙනල්ලා ඔබතුමාලට ආණ්ඩුව ආවෙ. ඔක්කොම සමානාත්මතාවයෙන් විසඳනවා කියලා තමයි කිව්වෙ.මෙතන මේ බන්ධනාගාරය තුල මේ වගේ දෙයක් ඇති වෙන්නට හේතු වුනේ අර විෂමතාවය.ඒක එදත් තිබුනා. ඔබතුමාලා ආවා කියලා වෙනසක් වෙලා නෑ.චාමින්ද දසනායක මහතා ගෙන ආ යෝජනාව මියගිය නිලධාරීන් හා රුදවියො කියන්නෙත් අපේ මිනිස්සුනෙ මිය යාම පිලිබඳ මගේ ශෝකය ප්‍රකාශ කරනවා.

**ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)**

ගරු උප සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි.මුලින්ම ස්තුතිවන්ත වෙනවා චාමින්ද දසනායක මන්ත්‍රිතමාට පහුගිය දිනවල මරණයට පත්වුන බන්ධනාගාර නිලධාරීන් වගේම රැඳවියන්ට ශෝක ප්‍රකාශයක් පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීම පිළිබඳව.අපි කවුරුත් දන්නවා පහුගිය වකවානුවෙදි මීගමුවෙ බන්ධනාගාරයේ මොන විදිහටද සිද්ධ වුනේ කියලා මාධ්‍ය හරහා කව්රුත් දැක්කා.කෙසේ වෙතත් ඒ බන්ධනාගාර නිලධාරියෙක් ප්‍රකාශ කරන විදිහට නියපොත්තෙන් කඩන්න තිබ්බ එක පොරවෙන් කඩන්න වුනා වගේ දෙයක් තමයි ප්‍රකාශ වෙන්නෙ.අපි කණගාටුවෙනවා රටේ ආරක්ෂක බන්ධනාගාර ඇමතිවරයා හැටියට මේ සිද්ධ වුන ව්‍යවසනය වලක්වගන්න බැරි වුන එක ගැන.මේ ව්‍යවසනයේ වගකීම ඇමතිතුමාට කලින් භාරගන්න ඕන රටේ ජනාධිපතිතුමා.මේ වෙනකොට බන්ධනාගාර නිලධාරීන් 10 දෙනෙක් මැරිලා ඉන්නවා.රැඳවියන් 21ක්. සාහාසික විදිහට කෲර වද දීලා බන්ධනාගාර නිලධාරීන් මරලා තියෙන්නෙ.ඒ බන්ධනාගාර නිලධාරීන්ගේ ආදරණීය දෙමව්පියන්ට, බිරින්දෑවරුන්ට, දරුවන්ට පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රිවරයෙක් හැටියට මේ අවස්ථාවේ මගේ ශෝකය ප්‍රකාශ කරනවා.සියළු ඥාතීන්ට .ඒ වගේම රැඳවියන්ට මොන තරාතිරමෙ හිටියත් ඒ අයත් මිනිස්සු ඒ පවුල්වලටත් සියළුදෙනාට මන්ත්‍රිවරයෙක් හැටියට ශෝකය පල කරනවා.

- ගරු මන්ත්‍රී එම්.ටී.එම්. තස්ලිම් මහතා ප.ව.14.03 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩබ්.ටී.එම්. චාන්දනී දීපිකා රත්නායක මහත්මිය ප.ව.14.03 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩබ්.ටී.එම්. චාන්දනී දීපිකා රත්නායක මහත්මිය ප.ව.14.08 ට පමණ ගරු සභාවට පැමිණියා.

**<u>ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා - (ජා.ජ.බ)</u>**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එච්. මාලක අරුණ කුමාර මහතා ප.ව.14.09 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා ප.ව.14.09 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

ගරු උපසභාපතිතුමාගෙන් අවසරයි. දැන් මෙතුමන්ලා දිගින් දිගටම මෙය රජයේ වගකීම පැහැර හැරීමක් වශයෙන් දැන් චෝදනාව එල්ල කරමින් පවතිනවා.ඇත්ත වශයෙන්ම ඉස්සරත් මේ දේවල් වෙලා තියනවා.වැලිකඩ බන්ධනාගාරයේ 21 ක් දෙනෙක් මරන්නෙ රෑ ගිහින්.මේ අවුරුදු එකහමාර ඇතුලෙ මේ සමාජය අපිට හෝදන්න බැනෙ.අධිකරණ ඇමතිතුමා මේ අවස්ථාවෙදී වගකීම පිලිගන්නෙ මේක විසඳලා මින් ඉදිරියට මෙහෙම නොවෙන්න කාරණා ඉදිරිපත් කරන්න.අද 200 කට වැඩි පිරිසකට මරණ දණ්ඩනය නියම වෙනවා. බණ්ධනාගාරයේ දෙපිරිසක් මරාගත්ත එකට ඒ නිලධාරීන්, රැඳවියන් සම්බන්ධයෙන් මානුෂිය වශයෙන් අපිත් ශෝකයට පත් වෙනවා.මේ වගේ දේවල් රටවල් වල නොවිය යුතු දේවල්.මේ දෙගොල්ලොම මිනිස්සු.ජීවත් වීමේ අයිතිය තියනවා.දිගින් දිගටම දොස් පැවරීම නෙමේ අපි බලමු මේක රටක් වශයෙන් නිවැරදි කරගෙන ඉදිරියට යන්න.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එච්. මාලක අරුණ කුමාර මහතා ප.ව.14.13ට පමණ ගරු සභාවට පැමිණියා
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම් තස්ලිම් මහතාප.ව.14.13 ට පමණ ගරු සභාවට පැමිණියා
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා ප.ව.14.13ට පමණ ගරු සභාවට පැමිණියා

**<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සි.පි.රංජිත් අබේපාල මහතා ප.ව.14.16 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සි.පි.රංජිත් අබේපාල මහතා ප.ව.14.18 ට පමණ ගරු සභාවට පැමිණියා

ගරු සභාපතිතුමනි, මම විශ්වාස කරනවා මේ අවස්ථාවේදී ඔබතුමා මූලාසනේ ඉන්නවා දැකීම සතුටට කරුණක්.මම ඔබතුමාට සුභපැතුම් එක් කරනවා ඔය පුටුවෙ වාඩිවීමට ලැබීම පිළිබඳව.මං පර්සි මන්ත්‍රිතුමාට ස්තුතිවන්ත වෙනවා රැඳවියන් පිරිසකුත් නිලධාරීන් අටදෙනෙකුත් එක්කලා 29 ක් බොහොම ඛේදනීය, ම්ලේච්ඡ විදිහට ඝාතනය කිරීම පිලිබඳ අවැසි කරුණුත්, ස්වාමියා අහිමි වෙනවා බිරිඳට, දසමාසයක් කුසේ තියාගන හදපු අම්මට දරුව අහිමි වීම පිලිබඳව මේ සභාවේ ශෝකය ප්‍රකාශ කරන්න යෝජනාව ගෙනාපු එක පිලිබඳව.ඔබතුමාලගෙ පොහොසත් රටක්, ලස්සන හෙටක් කියන පොතේ 209 පිටුවෙ තියනවා බන්ධනාගාරය හදන්න ඕන විදිහ.මේ ඛේදනීය තත්වය වලක්වන්න පුළුවන් කමක් තිබුනා.මේකට වගකියන්න ඕන ආණ්ඩුව කියලා අපි පැහැදිලිව කියනවා. මේ රටේ පුරවැසියො විදිහට හදවතට එකඟව කතා කරන්න.සමස්ථයක් හැටියට යම් යම් නායකයින්ගේ යම් යම් වැරදි තීරණ නිසා අහිංසක නිලධාරීන් අට දෙනෙක් අමු අමුවේ මරලා දැම්මා.ඒ නිසා අද විවිධ ප්‍රදේශවල තමන්ගෙ අහිංසක දූ දරුවො අනාතෙට පත් වෙමින් තමන්ගෙ ආදරණීය පවුල අසරණ භාවයට පත් වෙමින් තමන්ගෙ අම්මා තාත්තට කඳුළු වේදනාව උරුම කරමින් සමු ගන්න සිදු වුන නිලධාරීන් අට දෙනාටත්,චිරස්ථනීය විදිහට මේ ඛේදවාචකය ආරම්භ කරපු ඒ නායකයොත් ඇතුළුව මියගිය සිවිල් සිරකරුවන් නැත්තම් රැඳවියන්ටත් ඒ පවුල්වලටත් ශෝකය පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සභාපති, උපසභාපති,මන්ත්‍රිමණ්ඩලය ඇතුළු සියළුම නිලධාරී මඩුල්ල වෙනුවෙන් ඒ සියළු දෙනාට ශෝකය ප්‍රකාශ කරමින් සමු ගන්නවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.අශෝක හේරත්මහතා ප.ව.14.19 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.අශෝක හේරත්මහතා ප.ව.14.22 ට පමණ ගරු සභාවට පැමිණියා

**<u>ගරු මන්ත්‍රී ඩබ්.ජී. අජිත් ලක්ෂ්මන් මහතා - (ජා.ජ.බ)</u>**

උප සභාපති ඇතුළු මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි. ප්‍රථමයෙන් ස්තූතිවන්ත වෙනවා මේ මන්ත්‍රීතුමාට මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධව. මියගිය බන්ධනාගාර නිළධාරීන් සහ රැඳවියන්ට මගේ ශෝකය ප්‍රකාශ කරනවා .සමහරවිට බන්ධනාගාර කොමසාරිස් හිතන්න ඇති ඔහුට මේ දේ පාලනය කරන්න පුලුවන් කියලා . ඒ සඳහා උත්සාහ කරන්න ඇති . ඒ නිසා එතනින් ඉදිරියට ගෙනියන්න නැතිව ඇති මුලින් මේ ප්‍රශ්නය.ඕනෑම ආයතනයක එහෙමයි තමන්ගෙ ප්‍රශ්න පිටට දෙන්න කලින් තමන් විසඳන්න උත්සාහ කරනවනෙ. මෙතනදීත් එහෙමයි වෙන්න ඇත්තෙ.ආණ්ඩුව අලුත් වුනාට මේ හැමතැනම ඉන්න නිළධාරින් පරණයි.බන්ධනාගාර නිළධාරින් ඒ රාජකාරිය හරියට ඉෂ්ට කරා නම් මේ දේ සිද්ධ නොවෙන්න තිබ්බා . අන්තිමට මේ සිද්ධිය වුනා . දැන් විපක්ෂය එකතු වෙලා මේක ආණ්ඩුවෙ නොහැකියාවක් කියන මතය ජනගත කරන්න උත්සාහ කරනවා. මේකේ වැරැද්දක් ආණ්ඩු පක්ෂෙත් ඇති, විපක්ෂෙත් ඇති, නිලධාරින්ගෙත් ඇති. අපි මේක එකම තැනකට ලඝු කරන්නේ නැතිව ඒක සාධාරණ විදිහට හිතලා මතලා කතා කරමු. අවසාන වශයෙන්ද මිය ගිය සැමට ශෝකය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**<u>ගරු මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා - (සර්ව ජන බලය)</u>**

ගරු සභාපතිතුමනි බන්ධනාගාරයේ මෙතුමා ගෙනාපු යෝජනාවට මං මුලින්ම කියනවා මියගිය දෙපාර්ශවයටම මගේ ශෝකයත් ප්‍රකාශ කරනවා . මුලින්ම සමහර ආයතන හඳලා තියෙන්නේ එක් වරක් ගිය කෙනෙකුට එම තැනට නැවත එන එක වලක්වන්න වැඩ කටයුතු කරගන්න. බන්ධනාගාරයත් එහෙම තැනක්. මෙතනදි මේ අවස්ථාවේ අවාසනාවන්ත සිද්ධිය සිදු වෙන්න හේතු පාදක වෙන්න කරුනු ඇත්තටම එම ආයතන පාලනය කිරිමට අපොහොසත් වීම. ඔවුන්ට ඒක පරිපාලනය කර ගන්න බැරිවුන නිසා මේ දේ සිද්ධ වුනා. අපි දැන් තීරණය කළයුත්තේ මේවාට මොනවද කල යුත්තේ කියලා තමයි . නමුත් ඒක කතා කරන්න මේක අවස්ථාව නෙමෙයි. පක්ෂයක් හැටියට මගේ පක්ෂය වෙනුවෙනුත් දෙපාර්ෂවයටම සියලුම ඥාතිනටත් සියලු දෙනාටත් මගේ ශෝකය මේ අවස්ථාවෙදි ප්‍රකාශ කරනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්. විරාජ් මලින්ද ඩයස් මහතා ප.ව.14.30 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.එම්. දිලිප් ජයසිංහ මහතා ප.ව.14.30 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.සමරසිංහ කිර්ති බංඩාර හේරත් මහතා ප.ව.14.30 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්. විරාජ් මලින්ද ඩයස් මහතා ප.ව.14.31 ට පමණ ගරු සභාවට පැමිණියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එච්. මාලක අරුණ කුමාර මහතා ප.ව.14.32ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

**<u>ගරු මන්ත්‍රීනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)</u>**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්.ජී. අජිත් ලක්ෂ්මන් මහතා ප.ව.14.34 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.එම්. දිලිප් ජයසිංහ මහතා ප.ව.14.34 ට පමණ ගරු සභාවට පැමිණියා
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී නිමල්කා කොටඹගේ මහත්මිය ප.ව.14.34 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.සමරසිංහ කිර්ති බංඩාර හේරත් මහතා ප.ව.14.35 ට පමණ ගරු සභාවට පැමිණියා.

සභාපතිතුමාගෙන් අවසරයි. පළමුවෙන්ම ඔබතුමා ඔය ආසනේ වාඩිවෙලා ඉන්න එක ගැන සුභපතනවා.ඊළඟට චාමින්ද දසනායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කල යෝජනාවට අනුව පහුගියදා මීගමුව බන්ධනාගාරයේ ජීවිතක්ෂයට පත්වුන නිළධාරින් සහ රැඳවියන් ඒ මරණය සිදුවිම පිළිබඳ ශෝකය ප්‍රකාශ කරනවා. ආණ්ඩුව හැමතිස්සෙම කිව්වෙ අපිට දුන්න නම් අපි කරනවා එක පැන් පහරකින් කරනවා කියලා.දැන් දුන්නා ඒත් කරන්න බෑ. මේ සිද් ධියේ වැරදිකරයො ගොඩක් ඉන්නවා තමයි. රජය ,රජයේ නිළධාරින් , සමාජය ඒ හැමෝගෙම වැරැද්ද තියෙනවා. මෙතන තියෙන එකම චෝදනාව තමයි ඔබ කරන්නම් කියපු දේවල් නොකරපු එක. මම නැවත වතාවක් මියගිය නිළධාරින් සහ රැඳවියන්ගේ පවුල් වලට ශෝකය ප්‍රකාශ කරනවා.

**<u>ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - ( ස.ජ.බ)</u>**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා ප.ව.14.40 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්.ජී. අජිත් ලක්ෂ්මන් මහතා ප.ව.14.41 ට පමණ ගරු සභාවට පැමිණියා

ප්‍රථමයෙන් මම උප සභාපතිතුමාට සුභ පතනවා.සියළු දෙනාගෙන් අවසරයි.විශේෂයෙන් ඔය බන්ධනාගාර නිළධාරින් අතර කුඩා කාලයේ මා ජීවත් වූ ප්‍රදේශයේ නිළධාරියෙක් මිය ගිහිල්ලා තියනවා. බොහොම අහිංසකව ජීවිකාව කරගෙන ගිය පවුලක අහිංසක නිළධාරියෙක් මියගියේ. කුඩා කාලයේ ජිවත් වු ගමේ මං දැන් ජිවත් නොවුනත් මගේ ශෝකය මගේ ගමේ ඒ මියගිය නිළධාරිතුමාට පුද කරනවා .කාන්තාවක් හැටියට බිරින්දෑවරු බොහොම සංවේගයෙන් මේ අවස්ථාවේ ඉන්නවා තම සැමියාගේ වියෝවත් එක්ක . බන්ධනාගාර නිළදාරින් වේවා , බන්ධනාගාර රැඳවියන් වේවා , ඒ සියලු දෙනා මනුස්සයෝ. මේ මහපොළවේ පය ගහලා තමන්ගේ සේවය තමන්ගේ මෙහෙය රට වෙනුවෙන් ජාතිය වෙනුවෙන් ඉෂ්ට සිද්ධ කරපු මොහොතක තමයි හදිස්සියේ මේ

නිළධාරින්ට මේ ශෝචනීය ඉරණමට මුහුණ දෙන්න සිදු වුනේ. විශේෂයෙන්ම පොදු ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරියක් හැටියට මගේ පෞද්ගලික ශෝකය මේ සියලු දෙනාට පුද කරමින් ඔවුන්ට නිවන් සුව ප්‍රර්ථනා කරමින් ඒ වගේම මේ වන කොට ඒ පවුල්වල විශාල පිරිසක් තමන්ගේ ස්වාමියා, දරුවා නැති වෙලා ශෝකයෙන් පසු වෙනවා . ඒ සියලු දෙනාට ශෝකය ප්‍රකාශ කරනවා . මං හිතන්නේ රජයක් විදිහට මීට වැඩියේ වගකිමෙන් කටයුතු කළ යුතුව තිබුන අවස්ථාවක් මේක මේ සිද්ධිය නැවත බන්ධනාගාර තුළ සිදු නොවිය යුතුයි කියා කියමින් මියගිය බන්ධනාගාර නිළධාරින් සහ බන්ධනාගාර රැඳවියන්ගේ පවුල්වලට මගේ ශෝකය ප්‍රකාශ කරමින් නිහඬ වෙනවා.

**<u>ගරු මන්ත්‍රිනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)</u>**

ප්‍රථමයෙන් මියගිය බන්ධනාගාර නිලධාරීන්ට හා මියගිය රැඳවියන්ට මගේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා.ඉතාමත් කනගාටුදායකයි. මේ රජය කටයුතු කරපු ආකාරය.මනාව පාලනය කරගන්න තිබුණ අවස්ථාවක් පැහැර හැරියා. ඒ මියගිය සියලු දෙනාට මගේ ශෝකය ප්‍රකාශ කරමින් නැවතත් ඉදිරියට මේ වගේ දේවල් වළක්වා ගන්න කටයුතු කරන්න කියමින් නිහඬ වෙනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්. කේ.ආර්. හුසේයින් මහතා ප.ව.14.43 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

**<u>ගරු මන්ත්‍රී එම්.ටී.එම්. තස්ලිම් මහතා - (ස.ල.ම.කො)</u>**

එකම මාතෘකාව බොරුවටනෙ. මේ කතා කරන්නේ බොරුවට.එක එක පක්ෂ වලට විනාඩි කීපය බැගින් දුන්නා නම් හරි. බොරුවට මේ කාලය ඇද ඇද යන්නේ.

**<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි. මම මුලින්ම ස්තූතිවන්ත වෙනවා චාමින්ද දසනායක මන්ත්‍රීවරයාට මේ මිනිස්සු කොට්ඨාශෙකට ජන්දෙ දීලා සභාවට එවලා තියෙන්නේ ඒ නිසා කාලය ගැන හිතන්න එපා. ජනතාවගේ ප්‍රශ්න තමයි මෙතනදි අපි කතා කළ යුත්තේ . මේ කතා කරන්නෙ මීගමුව බන්ධනාගාරය ඇති වූ ප්‍රශ්නය සහ එයාලට දැනෙන දේ. ඒ හින්දා ගරු උපසභාපතිතුමනි ඔබතුමාට සුබ පතනවා අද දවසේ මේ පුටුවට එන්න ලැබීම පිළිබඳව.ඔබතුමා ආව නම් මීට වඩා වෙනස් වෙයි කියලා හිතනවා.ඇත්තටම සතුටු වෙනවා මන්ත්‍රීතුමන්ලාට තුමියලාට ඒ කතා කරන්න තියෙන කාලය තුළ කතා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව.බන්ධනාගාර සිද්ධිය ගැන මට කතා කරන්න තියෙන්නේ ඒ අහිංසක දෙමාපියන්ට ආයෙ දරුවො ලැබෙන්නෙත් නෑ.ඒ දරුවන්ට ආයේ පියා ලැබෙන්නෙත් නෑ. ඒ වගකීම අනිවාර්යෙන් රජය භාරගත යුතුයි. මුලින්ම මේ සිද්ධිය ඇතිවුන වෙලාවෙ මේ සිද්ධිය නිරාකරණය කරා නම් කරා නම් මේ ගැටුම ඇතිවෙන්නෙ නෑ. මේ සිද්ධි දකිනකොට අපිට පේන්නේ අනුර කුමාර fail කියලා තමයි අපිට කියන්න වෙන්නේ. ඒ ආදරණීය අපේ නිලධාරීන්ට සහ රැඳවියන්ගේ පවුල්වල සියලු දෙනාට පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන්ගේ ශෝකය ප්‍රකාශ කරනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්. කේ.ආර්. හුසේයින් මහතා ප.ව.14.49 ට පමණ ගරු සභාවට පැමිණියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී. මනෝ කුමාර එදිරිසිංහ මහතා ප.ව.14.50 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී නිමල්කා කොටඹගේ මහත්මිය ප.ව.14.50 ට පමණ ගරු සභාවට පැමිණියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා ප.ව.14.50 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්. විරාජ් මලින්ද ඩයස් මහතා ප.ව.14.51 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මහතා ප.ව.14.51 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

**<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා ප.ව.14.52 ට පමණ ගරු සභාවට පැමිණියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී. මනෝ කුමාර එදිරිසිංහ මහතා ප.ව.14.52 ට පමණ ගරු සභාවට පැමිණියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා ප.ව.14.53 ට පමණ ගරු සභාවට පැමිණියා.

ගරු සභාපතිතුමා ප්‍රමුඛ ගෞරවනීය මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි. ඒ වගේම සියලුම කාර්ය මණ්ඩලයෙන් අවසරයි. අපේ පර්සි ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව සම්බන්ධයෙන් අපි ශෝකය පළ කරනවා මීගමු බන්ධනාගාරයේ ජීවිතක්ෂයට පත් වෙච්ච සහ ඉන් තුවාල ලබලා මේ වන විටත් රෝහල්ගතවෙලා ප්‍රතිකාර ලබන සියලු දෙනාගේ පවුල් වලට අපේ බලවත් සංවේගය සහ කණගාටුව ප්‍රකාශ කරනවා මේ මොහොතේදි. ඒ වගේම ඒ සම්බන්ධව විවාදයේදී මතුවන කාරණා සම්බන්ධයෙන් මම නැගී සිටිමින් නොවුනත් රීති ප්‍රශ්නයක් මතු වෙනවා මන්ත්‍රිතුමා ඒ සංවාදය උණුසුම් තත්වයකට හැරෙව්වා.රීති ප්‍රශ්නයක් මතු කරනවා මෙම යෝජනාවට අදාළ කරුණු පමණද සාකච්ඡා කරන්නෙ කියන කාරණය නිසා. කෙසේ හෝ වේවා අන්තිමට ශෝක යෝජනාව විවේචනාත්මක තත්වයට හැරවිලා තියෙනවා. ගරු අධිකරණ අමාත්‍යවරයාට නියපොත්තෙන් කඩන්න තිබුන දේ විශාල වෙනකම් නියෝගය ලැබුණේ නෑ කියලා.කැරැල්ලක් සිද්ධ වුණාම ඒක මර්ධනය කරන්න තියන ක්‍රමවේදය ඒකට වෙනම අණපනත්තියනවා. අවම බලය භාවිතා කරන්න පුළුවන් ක්‍රමයක් තියෙනවා.ඔය බන්ධනාගාර පිරුණෙ මේ අවුරුදු

2ට නොවෙයි.පිරුණු බන්ධනාගාර මාස 20 හිස් කරන්නත් බැ.අධිකරණ ඇමතිවරයා කියනවා මම මේකේ වගකීම භාර ගන්නවා.වගකීම බාරගනිමින් ඉදිරියට අපි මොනවද කරන්න ඕන කටයුතු සම්බන්ධයෙන් සියල්ල මේ වෙනකොට විමසීම් කටයුතු විමර්ශන කරමින් යනවා.අපි ශෝකය පල කරමු. සංවේගය පල කරමු. නමුත් ශෝකය පළ කිරීමේ සංවේගය පලකිරීමේ යෝජනාව අපි වෙනම කාරණාවලට ලඝු කරන එක කොච්චර සදාචාරාත්මක ද කියලා හිතමු.ඒ කාරණාව සම්බන්ධයෙන් විවේචනාත්මක කාරණා කියනවා මිසක් ඇත්තටම කව්ද හෘද සාක්ෂියට එකඟව කතා කරමින් කවුද ශෝකයේ පළ කළේ ශෝක යෝජනාව ඇතුලෙ.අර මිය ගියපු සියලු දෙනා වෙනුවෙන් ශෝකය පළ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී එච්.එම්. නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා - (ශ්‍රී.ල.පො.පෙ)**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා ප.ව.15.05 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා ප.ව.15.09 ට පමණ ගරු සභාවට පැමිණියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්. විරාජ් මලින්ද ඩයස් මහතා ප.ව.15.09 ට පමණ ගරු සභාවට පැමිණියා.

ගරු වැඩ බලන සභාපතිතුමාගෙන් අවසරයි. මන්ත්‍රී මණ්ඩලයෙන් සහ කාර්ය මණ්ඩලයෙන් අවසරයි.ඇත්තටම නැගිටින්න නෙමෙයි හිටියේ ඒත් අවසානයේ හිතුවා මේ හැම මතු වෙච්ච කාරණා එක්ක අදහසක් පළ කරන්න ඕනි කියලා.විශේෂයෙන්ම මං හිතන්නේ පර්සි මන්ත්‍රීතුමා ගෙනාපු මිය ගිය බන්ධනාගාර නිලධාරීන්ට සහ සිරකරුවන්ට ශෝකය ප්‍රකාශ කිරීමේ යෝජනාව.ජනාධිපතිතුමා ඉවත්වනු කියලා වැඩසටහනක් පටන් ගත්තා.ඒ වැඩසටහනට ආව මන්ත්‍රීතුමියගේ ස්වාමි පුරුෂයත් පහුවදා අහුවෙනවා විදුහල්පතිවරයෙක්.එක එක පක්ෂවලට ඇඟිල්ල දික් කරනකොට අනිත් ඇඟිලි 4 ක් ආපස්සට යොමු වෙනවා කියලා මේ මන්ත්‍රීතුමාලට අමතක වෙලා තියෙන්නේ.හැම පක්ෂෙම ගත්තොත් හිරකරුවෝ හැම පක්ෂය ඇතුලෙ ඉන්නවා. ආණ්ඩුව ඇතුලේ මම දැක්ක දෙයක් තමයි දිගින් දිගටම මේ වැරදි රජයේ නිලධාරීන් පිට පටවලා ආණ්ඩුව අත පිහදාගන්නවා.විශේෂයෙන්ම මේ වර්තමාන ආණ්ඩුව පටන් ගත්ත සෑම ව්‍යාප්තියක්ම අසාර්ථකයි.මේ ඕනෑම ක්‍රියාවක් මැඩ පැවැත්වීමට දක්ෂ හැකියාවක් තියෙන්න ඕන.එහෙම නැතිකම නිසා තමයි මේ දෙන්නගේ මරණින් බේරෙන්න තිබ්බ අවස්ථාව තිහකට ආසන්න පිරිසකගෙ මරණයට හේතු සාධක වුණේ.එහාට මෙහාට බෝලෙ පාස් කරලා වගකීම් වලින් මිදෙන්න බැ.ඒ වගකීම් භාරගන්තා කියලා කිසිම පවුලකට සාධාරණයක් වෙන්නෙ නෑ.ඒ සිරකාරයෝ මනුස්සයෝ කිච්චට ඒ මානුෂීය පැත්ත මේ වෙනකොට නෑ. ඒ හින්දා ඒ සියලු දෙනාට ඔවුන්ගේ ආගමට අනුව නිවන් සුව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී එම්.ඩී. මනෝ කුමාර එදිරිසිංහ මහතා - ( ස.ජ.බ)**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මහතා ප.ව.15.10 ට පමණ ගරු සභාවට පැමිණියා.

පර්සි මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට අනුව එම මියගිය සියලු දෙනාට ශෝකය ප්‍රකාශ කරනවා.මෙතන අපි පක්ෂ කිහිපයක් තියෙනවා .ඒ හැම පක්ෂෙකම අහුවුන කවුරු හරි අපරාධකාරයෙක ඉන්නවා.ඒ නිසා එක එක පක්ෂවලට චෝදනා කිරීම සුදුසු නෑ. මම නැවත වතාවක් මියගිය සියලු දෙනාට ශෝකය ප්‍රකාශ කරනවා.

**ගරු උපසභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජ.ජ.බ)**

තව මේ වගේ යෝජනා දෙකක් තියෙනවා මේ කතා කරපු වචන ඇතුලේ ගන්න යමක් තිබුණා. ඒ ගන්න තියෙන ටික හැමෝම ගන්න.අයින් කරන්න තියෙන ටික අයින් කරන්න.ඊයේ මං දැක්කා මුණමල්දෙණියේ හන්දියේ ටිපර් එකක් පෙරලිලා තිබ්බා.උදේ 7 තමා ටිපර් එක පෙරලිලා තිබ්බේ.මං හිතන්නේ ඒක වැඩ අවසන් කරලා යථා තත්ත්වයට පත් කරන්න හැන්දෑවේ 6 විතර උනා.මම ඔතනින් දහ වතාවකට වඩා එහාට මෙහාට ගියා. ඔය යන හැම වෙලේම අඩුම ගානේ පහළොවක් විස්සක් එතන හිටියා.මොනවා කරන්න ඇද්ද කට්ටිය.විග්‍රහ කර කර හිටියා.අනිත් එක අපිට ජීවිතේ තව බොහොම කෙටි කාලයක් ඉතිරිලාවෙලා තියෙන්නේ.අද ගෙදර ගිහින් ඔබ තමුන්නාන්සේලා සියලු දෙනා කල්පනා කරන්න අපි චූටි කාලේ මැන්නා අවුරුදු වලින් සිංහල අලුත් අවුරුද්ද නිසා. ඉස්කෝලෙ යන කාලයේ අපි කලේමැන්නා මාස වලින්.මාස 3 කට සැරයක් විභාග එනවා.රැකියාවක් කරලා ආදායම් උපයන කොට සතිවලින් කාලය මැන්නා.මොකද සෙනසුරාදට හෝ ඉරිදාට පඩිය හම්බෙන හින්දා.මම හැමෝගෙන්ම දැන් ඉල්ලා සිටිනවා තත්පරේට කාලෙ මනින්න.ගොඩක් වයසට ගිහිල්ලා.අපිත් එක්ක හිටපු ජපානේ ගොඩක් ඉස්සරහට ගිහිල්ලා. අපිට පස්සෙ හිටපු කොරියාව අපිට වඩා ඉස්සරහට ගිහිල්ලා.කොහෙවත් තිබ්බෙ නැති වියෙට්නාමය ගොඩක් ඉස්සරහට ගිහිල්ලා.ඒ හින්දා මේ කතා කරන හැම කතාවක් කොයිතරම් වටිනවද නැද්ද,මේ කාලය, මේ ශ්‍රමය කොච්චර වටිනවද කියලා කල්පනා කරලා බලන්න බොහොම ස්තූතියි.

**ඒ අනුව ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති පහුගිය 05,06 දින දෙකෙහි මීගමුව බන්ධනාගාරය තුල සිදු වූ අවසනාවන්ත සිදුවීමෙන් මිය ගිය බන්ධනාගාර නිලධාරින් හා රටේ පුරවැසියන් වන රැඳවියන් වෙනුවෙන් ශෝකය පල කිරීම වෙනුවෙන් ඉදිරිපත් කරන යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් සභා සම්මත කරන ලදි.**

**(ඉ) XIX . ගරු මන්ත්‍රීනී ඩබ්.ටී.එම්. චාන්දනී දීපිකා රත්නායක මහත්මිය - ( ස.ජ.බ) විසින් කරනු ලබන අංක 6.(ඉ). XIXදරණ යෝජනාව**

ඔබතුමිය යෝජනාව ඉදිරිපත් කරන්න

**<u>ගරු මන්ත්‍රීනී ඩබ්.ටී.එම්. චාන්දනී දීපිකා රත්නායක මහත්මිය - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය,සියළුම කාර්යමණ්ඩලයෙන් අවසරයි.දැනට මගේ කොට්ඨාශය තුල අක්‍රියව ඇති වීදි පහන් නැවත සක්‍රිය නොකිරීම හා අත්‍යවශ්‍ය ස්ථාන කීහියපකට නව වීදී පහන් සවි නොකිරීම සම්බන්ධ කරුනු විමසීමේ යෝජනාව මා විසින් සභාවට ඉදිරිපත් කරනවා.

**<u>ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා- (ස.ජ.බ)</u>**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**<u>ගරු මන්ත්‍රීනී ඩබ්.ටී.එම්. චාන්දනී දීපිකා රත්නායක මහත්මිය</u>**

ආදරණීය මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මා ගෙනාපු යෝජනාව මේ වීදි ලාම්පු අලුත්වැඩියාව සම්බන්ධයෙන්.මාගේ කොට්ඨාශයේ ඇත්තටම අපි මහජනතාවගේ නියෝජිතයො වශයෙන් කටයුතු කරද්දී ජනතාවට වීදි ලාම්පුවක් තමයි හදල දෙන්නේ.එච්චර ලොකු ප්‍රතිපාදනයක් නොවුණත් පහසුවෙන් මන්ත්‍රීවරයෙකුට කරන්න පුළුවන් වැඩක්.නමුත් මාගේ මන්ත්‍රී ධූරයට අවුරුද්දයි මාස ගානක් වෙලා තියෙනවා.මගේ කොට්ඨාශයට එක විදි ලාම්පුවක්වත් ජනතාවට ලබා දෙන්න නොහැකි වෙලා තියෙනවා. ඒ වගේම කොට්ඨාශය තුළ තියන අලුත් වැඩියා කිරීම් වුනත් තාමත් මාස ගානකින් සිදුවෙලා නෑ. ඒක මම මේ සභාවට කියන්නේ ඇත්තටම කලකිරීමකින් හා මාගේ යුතුකමක් හැටියට. අසරණ වන තැන් අප්‍රමාණයි.අපි මහජන නියෝජිතයෝ වශයෙන් සහභාගී වන පින්කම් ගෙවල්, මරණ ගෙවල් ,මඟුල් ගෙවල් ,මේ හැම අවස්ථාවකදීම මට විශාල වශයෙන් ඉල්ලීම් කරන්නේ මේ මගේ කොට්ඨාශයේ වීදි ලාම්පුවක් දාලා දෙන්න.මා ඉන්න අකුරණ ප්‍රදේශය තුළ කැළෑ පරිසරයක් තියෙනවා.ඇල්ල පහු කරලා පන්සල ගාවට යනකම් කිලෝමීටර් 1/2 පමණ ඝන අන්ධකාරයක් තියෙනවා. මමත් දැන් හත විතර වෙනවා ගෙදර යනකොට ඇත්තටම මේ ළඟදි මගේ කොට්ඨාශයේ පන්සල පහු කරලා යද්දි වංගු සහිත අකුරණ වැව ගාව මෙතනදි මගේ ගමේම දරුවෝ දෙන්නක් ඇක්සිඩන්ට් උනා. ඉතින් ඒ නිසා මම මේ ගරු සභාවෙන් මේ අනතුර වළක්වා ගැනීමට ටිකක් මේ වීදි ලාම්පු අවශ්‍ය බව ඒ වගේම හොර සතුරෝ වැඩියෙන් පවතින කාලයක මගේ ගෙවල් ළඟ මේ ළඟදී ගුරු මහත්මියකගේ චේන් එකක් කඩා ගත්තා.එම ප්‍රදේශයේ කාන්තාවෝ මෝටර් සයිකල් වලින් තමයි ගමන් කරන්නේ. ඒ නිසා මේ යනකොට ගම තුළ හා ඒ අවට පරිසරය තුළ තියෙන අත්දැකීම් සමඟ මම ඉතාම අවශ්‍යතාවයක් හැටියට කියනවා අලුත් වීදි ලාම්පුවක් මේ මන්ත්‍රීවරයෙකුට වෙන් කරන්න.මන්ත්‍රීවරු 38ටම ඒ අවශ්‍යතාවය තියෙනවා වීදි ලාම්පු එකක් දෙකක් හෝ මන්ත්‍රීවරයෙකුට ලබා දීලා අලුත් වැඩියා කරලා ගම් වල තියෙන පාරවල් වල මාන සහිත ප්‍රදේශ පිලිසකර කරලා දීලා පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවට අයිති ප්‍රදේශ .මාගේ මේ යෝජනාව මේ සභාව තුළ වැඩක් විය යුතු යෝජනාවක් බව පිළිගනිමින් කොයිතරම් ඉල්ලීම් කරත් මේ සභාව තුළ මට කිසිම සහයෝගයක් දුන්නේ නෑ.මළ ගෙදරට වතුර බවුසරයක් ඉල්ලන කොට ඒ සැනින් ඒක යැව්වා .ඒකට ස්තුතිවන්ත වෙනවා.මෝටර්ග්‍රේඩරය වරක් හෝ දෙපාරක් ළබා ගත්තා .අනිත් එක තමයි මේ සභාව තුළ කාන්තාවක් කතා කරනකොට ඒවට වෙනත් අර්ථකතන දෙමින් හරිම අශෝභන හිනාවක් තියෙනවා .මම නම් ඒක පිළිගන්න කැමතිම නෑ .ඒ නිසා වැදගත් විදිහට මේ සභාව තුළ හැසිරෙමු කියලත් ඉල්ලීමින් මම නිහඬ වෙනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා ප.ව.15.15 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජී.පී. තරංග චම්පික අලහකෝන් මහතා ප.ව.15.15 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්. එම්. උපුල් නිශාන්ත මහතා ප.ව.15.19 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්. එම්. උපුල් නිශාන්ත මහතා ප.ව.15.23 ට පමණ ගරු සභාවට පැමිණියා.

**<u>ගරු මන්ත්‍රීනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)</u>**

ගරු උප සභාපති තුමනි මට හරිම කණගාටුවක් ඇතිවුණා .සභාවේ මන්ත්‍රීවරියක් කොයිතරම් අසරණද කියලා වීදි ලාම්පුවක් අලුත් වැඩියා කරගන්න බැරි තත්ත්වයක් අද අපේ සභාවේ මන්ත්‍රීවරුන්ට තියෙන්නෙ. වාට් එකක් හදලා දුන්නා අහවල් දවසේ එනවා කියල.ඒක නමට විතරයි.ඔබතුමාවත් මේකට මැදිහත් වෙලා මේ වීදි ලාම්පු ගැන මේ සභාවේ කතා කරන එක නවත්වන්න ක්‍රමයක් හදන්න.

**<u>ගරු මන්ත්‍රී ආර්.ඩී.එම්. ජයන්ත දිසානායක මහතා - ( ස.ජ.බ)</u>**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජී.පී.ඩී.ඉෂාන් මධුශංක පිරිස් මහතා ප.ව.15.23 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

නව සභාපතිතුමාට සුභපතනවා මුලින්ම මම දීප්ති මන්ත්‍රීතුමිය කරපු කතාවට තමයි ඇදන්නේ .අපේ කොට්ඨාශෙ දැන් මාස දෙකකට කලින් වීදි පහන් අලුත් වැඩියා කළා. අලුත් වැඩියා කලේ ඒ ගොල්ලන්ගේ ගෙවල් බලබලා. මගේ ගේ ඉස්සරහ වීදී පහන දාන්නේ නැතිව එහා පැත්තෙ වීදි පහන දාලා ගිහිල්ලා.මං මේ සභාවට කියන්න එහෙම කරන්න එපා. ඒ වීදි පහන් දාලා තියෙන්නේ අවශ්‍ය තැන්වලට. රෙපෙයාර් කරනවානම් හැම එකක්ම රෙපෙයාර් කරන්න නැත්නම් ඕක නවත්තල දාන්න

**<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>**

ගරු උප සභාපතිතුමා ඔබතුමා මේකට මැදිහත් වෙන්න. මේ අදෝනාව හැමදාම ඇහෙනවනේ.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.ඩී.ඉෂාන් මධුශංක පිරිස් මහතා ප.ව.15.27 ට පමණ ගරු සභාවට පැමිණියා

**<u>ගරු උපසභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජ.ජ.බ)</u>**

අපේ දීප්ති මන්ත්‍රීතුමිය බොහොම අසරණ වෙලා කියල කිව්වා. එහෙම එකක් නෑ. ඊළඟට එතුමිය මතු කළා කාන්තා මන්ත්‍රීවරියෝ කතා කරද්දි අවඥා සහගතව හිනාවෙනවා කියලා. ඉතින් මං වගකීමෙන් කියනවා අපේ මන්ත්‍රී කණ්ඩායම එහෙම කරන්නෙ නෑ.මේ වීදි ලාම්පු ප්‍රශ්නය වෙනුවෙන් කාලය නාස්තිකරන එක අපරාධයක් ශ්‍රමය නාස්තිකරන එක අපරාධයක්. වීදි ලාම්පු අලුත් වැඩියා කරන එකේ ප්‍රශ්න ටිකක් තියෙනවා තමයි .ඒක නිසා අලුතෙන් තාක්ෂණික ඇප් එකක් හදලා තියෙනවා.ඒක අත්හදා බලමින් ඉන්නවා. එතකොට ගේ ඉස්සරහ කෙනා තමයි වීදි ලාම්පුව පත්තු වෙන්නේ නැත්නම් තාක්ෂණික විදිහට දැනුම් දෙන්නේ. ඒක google එකෙන් ඔටෝ මැප් එක අදිනවා. හදන්න යන කෙනා මැප් එක අනුව ගිහින් තමයි හදන්නේ. මාස දෙකක් ඇතුළත මේ ඇප් එක හදනව. මාස දෙකක් යනකොට මේ ප්‍රශ්නෙ විසදෙනවා. අනිවාර්යයි. තාක්ෂණික ක්‍රම අපි භාවිතා කළේ නැත්නම් කාර්යක්ෂමතාවය අපේ බින්දුවයි.මාස දෙකක් යනකොට මේ ප්‍රශ්නෙ විසදෙනවා.

**ඒ අනුව ගරු මන්ත්‍රීනී ඩබ්.ටී.එම්. චාන්දනී දීපිකා රත්නායක මහත්මිය ගරු සභාවට ඉදිරිපත් කර ඇති දැනට මගේ කොට්ඨාශය තුල අක්‍රියව ඇති වීදි පහන් නැවත සක්‍රිය නොකිරීම හා අත්‍යවශ්‍ය ස්ථාන කීහියපකට නව වීදී පහන් සවි නොකිරීම සම්බන්ධ කරුනු විමසීමේ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**(ඉ) <u>XX . ගරු මන්ත්‍රී එම්.ඩී. මනෝ කුමාර එදිරිසිංහ මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XXදරණ යෝජනාව</u>**

ඔබතුමා යෝජනාව සභාවට ඉදිරිපත් කරන්න

**<u>ගරු මන්ත්‍රී එම්.ඩී. මනෝ කුමාර එදිරිසිංහ මහතා - ( ස.ජ.බ)</u>**

දිලීප පිරිස් ජනාධිපති නිතිඥයා විසින් රණවිරුවන් අපහාසයට ලක් කිරීම හා ඒ වගේම සමස්ථ රණවිරුවන් ඇගයිමේ යෝජනාව මා සභාවට ඉදිරිපත් කරනවා.

**<u>ගරු මන්ත්‍රී සී.පී. රංජිත් අබේපාල මහතා - (ස්වාධීන)</u>**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**<u>ගරු මන්ත්‍රී එම්.ඩී. මනෝ කුමාර එදිරිසිංහ මහතා - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් හා කාර්ය මණ්ඩලයෙන් අවසරයි. මං මේ යෝජනාව කරන්න තීරණය කලෙ පසුගිය කාලයේ ගරු සභාපතිතුමනි දිගින් දිගටම රණවිරුවා අමතක වී යන මොහොතක නැවතත් ඊයේ පෙරේදා රණවිරුවා මතක් කෙරුවා තහඩු එල්ලගෙන එනවා කියලා.මං හිතන්නේ ජනාධිපති නීතිඥ දිලීප පිරිස් මහත්තයා රණවිරුවාගේ තහඩු කැලි කිව්වා පදක්කම්ලට. මං මේ ගරු සභාවට කියන්න ඕනා මේ පදක්කම් ජාත්‍යන්තර වශයෙන් එන පදක්කම් තමන්ගේ දක්ෂතාවය අනුව තමයි මේවා එන්නේ. මොකද රණ ශූර,රණවික්‍රම, වීර වික්‍රම හසලක ගාමිණී අලිමංකඩ බේර ගත්තේ ඩෝසරේට බෝම්බයක් ගහලා.ඒ නිසා තමයි වීර වික්‍රම පදක්කම හම්බුනේ. මේ පදක්කම් කවදාවත් නිකන් හම්බවෙන්නෑ. යුධ හමුදාවට බැඳෙන්න කොන්දක් තියෙන්න ඕනා.තව කතාවක් කියල තිබ්බා යුධ හමුදාවේ සොල්දාදුවො පඩි ගන්නවා කියලා.පඩිය ගන්නවා තමයි පඩිය ගන්නත් මේ යුද්දෙට යන්න ඕනා.යුද්දෙට යන්නත් එසේ මෙසේ කෙනෙකුට බෑ දක්ෂ කෙනෙක් වෙන්න ඕනා. ගාම්භීරත්වයක් තියෙන්න ඕනා. ඒ නිසා තමයි මම මේ යෝජනාව දැම්මේ.දිලීප පිරිස් මහතා කියපු ඒ කතාවට මගේ දැඩි විරෝධතාවය ප්‍රකාශ කරනවා.ඔබේ පක්ෂෙත් නියෝජනය කරන රණවිරුවෝ කීප දෙනෙක් ඉන්නවා. මේක ආණ්ඩුවටමයි කියන්න වෙන්නේ.කොටි ඩයස් පෝරාව සතුටු කරන්න ඉදිරියේදී මේකට දෙන මුදල් ටික ගන්න.අර්චුනා මන්ත්‍රීතුමා කියල තිබ්බා මගේ තාත්තා LTTE .ඒත් සිංහලයෙක් වෙලා ඉපදෙන්නේ නැතිව දෙමළ වෙලා ඉපදුනු එක ගැන සතුටු වෙනවා කියලා හේතුව සිංහලයා විසින් තමන්ගේ රට බේරාදුන් රණවිරුවාටම එක වතාවක් නොවේ දෙතුන් වතාවක් මේ කරපු කිසිදු කතාවකදී කිසිදු වචනයක් ප්‍රකාශ කළේ නෑ රණවිරුවෝ සම්බන්ධව. මොකද ඇස් ඉස් දන් දීලා ඇවිත් ඉන්න රණවිරුවෝ.මට මතක් වෙනවා අපේ හිටපු සභාපතිතුමා දකිනකොට මේ පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව වෙනුවෙන් උපහාර උළෙලක් තියලා ලාංඡනයක් දුන්නෙ සභාපතිතුමා. වෙන කිසිම සභාපතිවරයෙක් රණවිරුවන්ට සමරු ඵලකයක් දුන්නේ නෑ.මගේ සහෝදරයා අපි දෙන්නා අලිමංකඩ ප්‍රදේශයේ සේවය කරන වෙලාවේ.අපේ ගෙදර තවත් ඒ සමරු ඵලකය තියෙනවා. මම එතුමාට ස්තූතිවන්ත වෙනවා.අපේ මාලිමාවේ සභාපතිවරයට මතක් කරනවා රණවිරුවෝ ගොනල්ලා අගය කිරීමක් කරන්න කියලා. දිලීප පීරිස් විසින් කළ ප්‍රකාශයට මන්ත්‍රීවරු සියලු දෙනා විරෝධතාව ප්‍රකාශ කරන්න ඕන.

**<u>ගරු මන්ත්‍රී ඩී.ඩී.එස්.පද්මලාල් මහතා - (සර්ව ජන බලය)</u>**

ඔය සිදුවීම සිදුවන දවසේ වේදනාකාරී හැඟීමක් තමයි දැනුනේ. 1986 ඉඳන් 2010 වෙනකම් මං හමුදාවෙ හිටියේ .මං අනුකම්පා කරනවා දිලීප පීරිස් නීතිඥවරයාට.මේ ත්‍රිවිධ හමුදාවෙ පොලිසියෙ ඔක්කෝටම පදක්කම් ලැබිලා තියෙනවා. සහ වෙනත් හැකියාවනුත් තියෙනවා පදක්කම් ලැබෙන්න යම් කැපවීමක් කළාට පස්සේ ඒ පදක්කමට ඔහුට කියවෙනවා නම් තහඩු කැලි පැළඳ ගෙන එනවා කියලා හරිම කණගාටුයි ඉතාම නිහීන කතාවක්.මං හිතන්නෙ නෑ ලංකාවේ සිහිබුද්ධියෙන් ඉන්න කෙනෙක් ඒ කතාව අනුමත කරයි කියලා. ඔහුගේ එකම අභිප්‍රාය වුණේ මේක හැල්ලුවට ලක් කරන එක. වැරදිද හරිද කියන එක අධිකරණය තීරණය කරයි. නමුත් පුද්ගලයාගේ නිල ඇඳුම භාවිතා

කරනකොට ඔහුට නින්දා කරන එක වැරදියි. ඒක නීතියක් නොවෙයි රීතියක් පදකමක් කියන්නේ උපයා ගන්න ධනයක් මිසක කවුරුත් ප්‍රධානය කරන දෙයක් නෙමෙයි අදාළ මාතෘකාවට මගේ විරෝධය මා ප්‍රකාශ කරනවා දිලීප පීරිස් කියන නීතිඥවරයාගේ ඒ කතාවට සර්වජන බලය පක්ෂයේ ආසන සංවිධායක පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයා හැටියට දැඩි විරෝධතාවය සහ පිළිකුල මෙයට ප්‍රකාශ කරනවා

**<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>**

තිස් අවුරුදු කාළකන්නි යුද්ධයක ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ රණවිරුවන් හැටියට ජීවිත කැපවීමෙන් තමන්ගේ අවයව දන් දීලා අද නේවාසික ස්ථානවල මානසික පීඩනයෙන් ඉන්නවා.ආදරණීය රණවිරුවන් වෙනුවෙන් දිලීප පීරිස් ජනාධිපති නීතිඥවරයා ස්වේච්ඡාවෙන් සාක්ෂියට පැමිණ ඉතාම තුච්ච අපහාස සක්කිලි විදිහට උත්තරයක් දෙනවා ඔය තහඩු කෑලි පැළඳගෙන ආපු අයට සාක්ෂි දෙන්න මං ඉඩක් දෙන්නේ නෑ. මේකෙන් ඉවත් කරන්න කියලා.මහපොළොව මත තමන්ගේ යුනිෆෝම් එක ඇදලා,යුනිෆෝම් එක බාල්දු කරලා තමන් පලදපු අර විග්‍රහ කරපු ඒ පදක්කම් හැල්ලු කරලා තීන්දු ගන්නකොට නිවැරදි වෙන්න ඕනා.මෙතන ඉන්නවා රණවිරුවෝ.රණවිරුවා අටක් මේ පුටුවල වාඩිවෙලා ඉන්නවා මන්ත්‍රීවරු හැටියට.මං අහනවා ඔබෙන් දිලීප පීරිස් ජනාධිපති නීතිඥවරයා කළ අදහස ඔබ අනුමතකරනවාද? මේ කාලයක් පුරාවට යුනිෆෝම් එක ඇදලා තමන්ගේ රාජකාරිය නීතියට අකුරට ඉෂ්ට කරපු අය විදිහට ඔබ පිළිගන්නවද මේ දිලීප පීරිස් කළ ප්‍රකාශය.මේ වගේ සභාවක මේ වගේ තත්ත්වයක මේ වගේ යෝජනාවක් ගේන්නෙ නැත්නම් අපිත් හිස් මිනිස්සු බවට පත්වෙනවා.ඒ නිසා මං ස්තූතිවන්ත වෙනවා බන්දු මන්ත්‍රීතුමාට මේ යෝජනාව සභාවට ඉදිරිපත් කරන්න කටයුතු කිරීම පිළිබඳව.මං ඉල්ලීමක් කරනවා මේ යෝජනාව පිළිබඳව තීන්දු ගනිද්දී කතා කරද්දී සත්‍ය මහපොළොව මත යථාර්ථයක් කරන්න කියමින් නැවත වතාවක් බන්දු මන්ත්‍රීතුමාට ස්තූතිවන්ත වෙනවා මේ රටේ ජීවත්වෙන ආබාධිත රණවිරුවන්, වෙනුවෙන් මිහිදන් වුන රණවිරුවන් වෙනුවෙන්, සේවය කරන රණවිරුවන් වෙනුවෙන් යෝජනාව මේ සභාවට ගෙන ඒම සම්බන්ධ

**ඒ අනුව ගරු මන්ත්‍රී එම්.ඩී. මනෝ කුමාර එදිරිසිංහ මහතා ගරු සභාවට ඉදිරිපත් කර දිලීප පීරිස් ජනාධිපති නිතිඥයා විසින් රණවිරුවන් අපහාසයට ලක් කිරීම හා ඒ වගේම සමස්ථ රණවිරුවන් ඇගයිමේ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

## (ඊ). කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවෙලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරීම.

### (ඊ).I. 2026.05.27 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.

**<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>**

මේ වාර්තාවෙ 17 පිටුවෙ 109 තියනවා සභාපතිතුමාගේ සම්බන්ධිකරන ලේකම්තුමාගේ ජනවාරි දීමනාව රු.44,000.00.ඊගාවට ආයෙ තවත් තැනක තියනවා. සභාපතිතුමාගේ සම්බන්ධිකරන ලේකම්තුමාගේ දීමනාව රු.22,000.00යි. ඒ මාර්තු මාසෙ දීමනාව.දැන් අපිට දැන ගන්න ඕන මේක මාසිකවද, නැත්තම් මෙයාට මන්ත්‍රීවරුන්ට වඩා පඩි ලැබෙනවද?

**<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)</u>**

ගරු මන්ත්‍රිතුමා ඒ පිලිබඳව සභාපතිතුමා, ලේකම්තුමිය නැති නිසා කරුණු ඊළඟ සභාවෙදි ඉදිරිපත් කරන්නම්.

**<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>**

ඊගාවට බණ්ඩාරකොස්වත්ත උප නගරයේ කානු පද්ධතිය පවිත්‍ර කිරීමට රු.80,000.00. ඉතින් කම්කරුවොත් ඉන්නවා.අවශ්‍ය කරන උපකරණ සියල්ල මේකෙ තියනවා.රු.80,000.00 ක් වියදම් කරනවා මේක සුද්ධ කරන්න.මේ වාර්තාව ලබන සභා වාරයට කල් දාන්න කියලා ඉල්ලීමක් කරනවා.සභාවෙ සලකා බැලුවා කියන්නෙ කාරක සභා වාර්තාවක් සම්මත වුනා සේ සැලකුවා කියන එක තමයි.

### (ඊ). II. 2026.05.27 දින පැවති ප්‍රසම්පාදන කමිටුවේ වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.

### (ඊ).111. 2026.06.30 වන දින පැවති කාර්මික සේවා කමිටුවේ වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.

### (ඊ).IV.2026 ජූනි මස අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.

### (ඊ)V.2026.06.24 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම

**(ඊ)VI.2026.06.24වන දින පැවති ප්‍රසම්පාදන කමිටුව කමිටු වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම**

**(ඊ)VI1. 2026.04.27 දින පැවති ප්‍රසම්පාදන කමිටුවේ වාර්තාව සලකා බැලීම සඳහා නැවත මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)**

මේ 4.27 කියන්නෙ අප්‍රේල් මාසෙ.අප්‍රේල් මාසෙ විරුද්ධ පක්ෂෙ කිසිම කෙනෙක් සහබාගි වුනේ නෑ.එතකොට 4 වෙනි මාසෙ තිබ්බ වාර්තාවක් මේ සභාවට 7 මාසෙ ඉදිරිපත් කරනවා.

**ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)**

මේක මේ ඔබතුමා ගිය වර මිල සදහන් කරලා නෑ කියලා නැවත මිල සඳහන් කරලා සභාවට ඉදිරිපත් කරන්න කියපු වාර්තාව මිල සඳහන් කරලා නැවත ඉදිරිපත් කරලා තියෙන්නෙ.

## (උ) ලැබීම් හා වියදම් පිලිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම පිලිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශිය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම

**(උ) I. 2026 මැයි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 01 සඳහා අනිත් පිට බලන්න**

## පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව

ප්‍රා.ස-14

### මාසික ඒකාබද්ධ වැය සාරාංශය - 2026 මැයි

| අය විෂය අංකය | වැය විෂය නාමයන් | 1 පොදු පරිපාලනය | 2 සෞඛ්‍ය සේවා | 3 භෞතික සැලසුම් මංමාවත් ඉඩම් | 4 ජල සේවා | 5 වෙනත් උපයෝගී සේවා | 6 සුභසාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | වැටුප් හා දීමනා | 3058619.33 | 1441142.41 | 1838479.53 | 73689.38 | 215241.35 | 4823086.76 | 11450258.76 |
| 2 | ගමන් වියදම් | 34890.00 | 6120.00 | 0.00 | 0.00 | 35638.00 | 0.00 | 76648.00 |
| 3 | සැපයුම් හා උපකරණ | 246496.80 | 772404.00 | 64470.00 | 21890.00 | 0.00 | 41030.00 | 1146290.80 |
| 4 | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු | 227655.00 | 351435.00 | 1326950.43 | 0.00 | 0.00 | 0.00 | 1906040.43 |
| 5 | ප්‍රවාහන, සම්බන්ධතා ආවශ්‍යක හා වෙනත් සේවා | 96330.71 | 22425.16 | 13100.00 | 1200.00 | 13416.33 | 9911.63 | 156383.83 |
| 6 | පොළී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 2150.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 274000.00 | 276150.00 |
| 8 | විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 0.00 | 30067.20 | 0.00 | 0.00 | 0.00 | 4000.00 | 34067.20 |
| | **පුනරාවර්ථන වැය එකතුව** | **3666141.84** | **2623593.77** | **3242999.96** | **96779.38** | **264295.68** | **5152028.39** | **15045839.02** |
| | ප්‍රාග්ධන වියදම් | | | | | | | |
| 9 | ප්‍රාග්ධන වැය | 450000.00 | 0.00 | 100000.00 | 0.00 | 0.00 | 0.00 | 550000.00 |
| 10 | ණය ආපසු ගෙවීම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| | **ප්‍රාග්ධන වැය එකතුව** | **450000.00** | **0.00** | **100000.00** | **0.00** | **0.00** | **0.00** | **550000.00** |
| | **පුනරාවර්ථන වැය හා ප්‍රාග්ධක වැය එකතුව** | **4116141.84** | **2623593.77** | **3342999.96** | **96779.38** | **264295.68** | **5152028.39** | **15595839.02** |
| | තැන්පත් | 295978.84 | | | | | | 295978.84 |
| | වැට් | 0.00 | | | | | | 0.00 |
| | ජාතිය ගොඩනැගීමෙ බද්ද | 0.00 | | | | | | 0.00 |
| | මුද්දර බද්ද | 0.00 | | | | | | 0.00 |
| | සේවක ණය | 737495.00 | | | | | | 737495.00 |
| | අත්තිකාරම් | 29694.21 | | | | | | 29694.21 |
| | ණයහිමි | 4835334.56 | | | | | | 4835334.56 |
| | සමුච්චිත අරමුදල | 0.00 | | | | | | 0.00 |
| | ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| | අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| | මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| | සේවක ඇප ආයෝජන | 6050.57 | | | | | | 6050.57 |
| | වෙනත් | 0.00 | | | | | | 0.00 |
| | **මුළු එකතුව** | **5904553.18** | | | | | | **21500392.20** |

**(උ) 1I. <u>2026 මැයි ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.</u>**

**උපලේඛන 02 සඳහා අනිත් පිට බලන්න**

| පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව | | | | | | | ප්‍රා.ස-16 |
|---|---|---|---|---|---|---|---|
| **මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය - 2026 මැයි** | | | | | | | |
| අය විෂය නාමයන් | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැළසුම් මංමාවත්/ඉඩම් හා ගොඩනැගිලි | ජල සේවා | වෙනත් උපයෝගී සේවා | සුභ සාධක සේවා | එකතුව |
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 10 වරිපනම් හා බදු | 18370.43 | 77000.00 | 0.00 | 0.00 | 0.00 | 9000.00 | 104370.43 |
| 20 කුලී | 0.00 | 0.00 | 1355785.00 | 0.00 | 2514216.00 | 59800.00 | 3929801.00 |
| 30 බලපත්‍ර ගාස්තු | 20.00 | 337750.00 | 0.00 | 0.00 | 0.00 | 17300.00 | 355070.00 |
| 40 සේවා සඳහා ගාස්තු | 0.00 | 486300.00 | 140220.16 | 0.00 | 0.00 | 2270.00 | 628790.16 |
| 50 වරෙන්තු ගාස්තු හා දඩ | 3272022.00 | 0.00 | 27151.00 | 0.00 | 2382.10 | 2311.00 | 3303866.10 |
| 60 වෙනත් ආදායම් | 178033.73 | 95610.00 | 25798104.70 | 46069.00 | 109998.36 | 2528.95 | 26230344.74 |
| 70වෙනත් ආධාර | 2216754.97 | 648912.00 | 1266026.02 | 42421.93 | 51013.60 | 11079289.83 | 15304418.35 |
| **පුනරාවර්තන ආදායම් එකතුව** | **5685201.13** | **1645572.00** | **28587286.88** | **88490.93** | **2677610.06** | **11172499.78** | **49856660.78** |
| **ප්‍රාග්ධන ආධාර** | | | | | | | |
| 80 මූලධන ලැබීම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | **0.00** |
| **පුනරාවර්තන ආදායම් හා** | | | | | | | |
| **ප්‍රාග්ධන ආදායම්වල එකතුව** | **5685201.13** | **1645572.00** | **28587286.88** | **88490.93** | **2677610.06** | **11172499.78** | **49856660.78** |
| තැන්පත් | 1271901.67 | | | | | | 1271901.67 |
| වැට් | 0.00 | | | | | | 0.00 |
| ජා.ගො.බද්ද | 0.00 | | | | | | 0.00 |
| මුද්දර බදු | 41165.00 | | | | | | 41165.00 |
| සේවක ණය | 996715.00 | | | | | | 996715.00 |
| අත්තිකාරම් | 29950.00 | | | | | | 29950.00 |
| ණය ගැති | 2155859.67 | | | | | | 2155859.67 |
| සමු: අරමුදල | 0.00 | | | | | | 0.00 |
| ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| සේවක ඇප ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| ශීර්ෂ බැර | 24091.26 | | | | | | 24091.26 |
| **මුළු එකතුව** | **4519682.60** | | | | | | **54376343.38** |

**(උ) I11. 2026 මැයි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 03 සඳහා අනිත් පිට බලන්න**

## පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව — ප්‍රා.ස. 07 වාර්තාව - 2026 වර්ෂය — මාසය:-මැයි

| අනු අංකය | අය විෂය | මාසය මුලදී හිඟය 1 | මාසය මුලදී ඉදිරියට ලැබීම් 2 | මාසය තුළ බිල් කිරීම් 3 | ලැබිය යුතු මුළු ආදායම 4 | මාසය තුළ ලද ආදායම 5 | මාසයට අදාල කලින් ලැබූ ආදායම 6 | ඉදිරියට ගෙන යන කලින් ලැබූ ආදායම 7 | මාසය තුළ ලද ආදායමින් ඉදිරියට ලැබූ ආදායම 8 | මාසය තුළ ලද ආදායමින් අය වූ හිඟය 9 | ඉදිරියට ගෙන යන හිඟය 10 | ඉදිරියට ලැබීම් 11 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | (1+3) | | | ( 2-6) | | | 4 - (5+6)+8 | (7+8) |
| 1 | වරිපනම් බදු 1/11 | 0.00 | 151,509.87 | 0.00 | 0.00 | 17,480.43 | 443.28 | 151,066.59 | 0.00 | 0.00 | 0.00 | 151,066.59 |
| 2 | අක්කර බදු 1/12 | 5,953.15 | 17,136.25 | 0.00 | 0.00 | 890.00 | 0.00 | 17,136.25 | 0.00 | 0.00 | -890.00 | 17,136.25 |
| 3 | කඩ කුලී 3/22 | 430,360.00 | 26,750.00 | 1,247,700.00 | 1,596,385.00 | 1,273,465.00 | 17,500.00 | 9,250.00 | 22,950.00 | 15,975.00 | 328,370.00 | 32,200.00 |
| 4 | වත්කම් බදු 5/23 | 1,592,759.00 | 26,475.00 | 1,545,124.50 | 3,137,883.50 | 1,527,976.00 | 7,137.50 | 19,337.50 | 26,400.00 | 0.00 | 1,629,170.00 | 45,737.50 |
| 5 | ජල ගාස්තු 4/62 | 79,784.00 | 11,316.00 | 56,334.00 | 136,118.00 | 30,169.00 | 2,633.00 | 8,683.00 | 2,674.00 | 0.00 | 105,990.00 | 11,357.00 |
| 6 | ව්‍යාපාර බදු 2/16/2 | 0.00 | 0.00 | 75,000.00 | 75,000.00 | 75,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | කර්මාන්ත බදු 2/16/1 | 0.00 | 0.00 | 2,000.00 | 2,000.00 | 2,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 8 | ඇතම් ව්‍යාපාර බදු 2/16/3 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 9 | වෙළඳ බලපත්‍ර 2/31 | 0.00 | 0.00 | 288,000.00 | 288,000.00 | 288,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 10 | විශේෂ බලපත්‍ර ගාස්තු2/31 -II | 0.00 | 0.00 | 1,000.00 | 1,000.00 | 1,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| | එකතුව | **2,108,856.15** | **233,187.12** | **3,215,158.50** | **5,236,386.50** | **3,215,980.43** | **27,713.78** | **205,473.34** | **52,024.00** | **15,975.00** | **2,062,640.00** | **257,497.34** |

**(උ) IV. 2026 ජූලි මාසික ආදායම් පුරෝකථන වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 04 සඳහා අනිත් පිට බලන්න**

# මාසික අදායම් පුරෝකථන වාර්තාව - පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව

මාසය :- 2026 ජුලි

| අනු අකය | ආදායම් ශීර්ෂය | වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව 2026 | | | මාසික ආදායම් පුරෝකථනය | | | අය වී ඇති ආදායම 2026 මැයි | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අය - වැය ලේඛනය අනුව | පරිපූරක මඟින් | එකතුව | පෙර මාසය දක්වා | මාසය තුළ | එකතුව | පෙර මාසය දක්වා | මාසය තුළ | එකතුව |
| | | 1 | 2 | 3 (1+2) | 4 | 5 | 6 (4+5) | 7 | 8 | 9 (7+8) |
| 1 | වරිපණම ( 1/11) | 4,700,000.00 | 0.00 | 4,700,000.00 | 4,022,500.00 | 250,000.00 | 4,272,500.00 | 2,616,783.32 | 17,480.43 | 2,634,263.75 |
| 2 | අක්කර බදු ( 1/12 ) | 30,000.00 | 0.00 | 30,000.00 | 8,000.00 | 2,000.00 | 10,000.00 | 3,200.00 | 890.00 | 4,090.00 |
| 3 | කසල බදු(2/13) | 30,000.00 | 0.00 | 30,000.00 | 12,500.00 | 2,500.00 | 15,000.00 | 0.00 | 0.00 | 0.00 |
| 4 | කර්මාන්ත බදු(2/16/ii) | 60,000.00 | 0.00 | 60,000.00 | 30,000.00 | 5,000.00 | 35,000.00 | 38,000.00 | 2,000.00 | 40,000.00 |
| 5 | ඇතැම් ව්‍යාපාර බදු(2/16/x) | 3,000.00 | 0.00 | 3,000.00 | 3,000.00 | 0.00 | 3,000.00 | 9,000.00 | 0.00 | 9,000.00 |
| 6 | ව්‍යාපාර බදු ( 2/16/i ) | 1,500,000.00 | 0.00 | 1,500,000.00 | 1,245,000.00 | 50,000.00 | 1,295,000.00 | 1,314,600.00 | 75,000.00 | 1,389,600.00 |
| 7 | බලපත්‍ර ගාස්තු ( 2/31/i) | 1,400,000.00 | 0.00 | 1,400,000.00 | 1,200,000.00 | 100,000.00 | 1,300,000.00 | 627,584.30 | 288,000.00 | 915,584.30 |
| 8 | විශේෂ බල:ගාස්තු(2/31/x) | 320,000.00 | 0.00 | 320,000.00 | 320,000.00 | 0.00 | 320,000.00 | 0.00 | 1,000.00 | 1,000.00 |
| 9 | කඩ කුලී ( 3/22 ) | 12,192,000.00 | 0.00 | 12,192,000.00 | 6,096,000.00 | 1,016,000.00 | 7,112,000.00 | 4,355,440.00 | 1,273,465.00 | 5,628,905.00 |
| 10 | ජංගම අලෙවි කුටි ( 3/22-i) | 303,600.00 | 0.00 | 303,600.00 | 151,800.00 | 25,300.00 | 177,100.00 | 132,000.00 | 19,800.00 | 151,800.00 |
| 11 | පූජාභූමි වෙළඳ කුටි(3/22-i | 720,000.00 | 0.00 | 720,000.00 | 360,000.00 | 60,000.00 | 420,000.00 | 0.00 | 0.00 | 0.00 |
| 12 | ත්‍රි රෝද රථ නැවතුම් ගාස්තුව (03/43Xv) | 150,000.00 | 0.00 | 150,000.00 | 75,000.00 | 12,500.00 | 87,500.00 | 55,200.00 | 0.00 | 55,200.00 |
| 13 | ජල ගාස්තු(4/62/i,i) | 680,000.00 | 0.00 | 680,000.00 | 317,502.00 | 52,917.00 | 370,419.00 | 133,315.00 | 30,169.00 | 163,484.00 |
| 14 | සතිපොල බදු (5/22/i/iii/i\ | 11,400,000.00 | 0.00 | 11,400,000.00 | 5,700,000.00 | 950,000.00 | 6,650,000.00 | 3,854,580.00 | 986,240.00 | 4,840,820.00 |
| 15 | බදු කුලී ( 5/23 ) | 20,000,000.00 | 0.00 | 20,000,000.00 | 10,210,000.00 | 1,958,000.00 | 12,168,000.00 | 4,765,682.00 | 1,527,976.00 | 6,293,658.00 |
| 16 | සතිපොල බහු.කාර්.ගොඩ 5/25/1/ii | 50,000.00 | 0.00 | 50,000.00 | 30,000.00 | 0.00 | 30,000.00 | 0.00 | 0.00 | 0.00 |
| 17 | විනෝද බදු ( 6/15 ) | 750,000.00 | 0.00 | 750,000.00 | 375,000.00 | 62,500.00 | 437,500.00 | 106,000.00 | 9,000.00 | 115,000.00 |
| 18 | ප්‍රජා ශාලා/ක්‍රීඩා පි(6/25/ii/ | 100,000.00 | 0.00 | 100,000.00 | 75,000.00 | 6,000.00 | 81,000.00 | 130,500.00 | 5,800.00 | 136,300.00 |
| | එකතුව | **54,388,600.00** | **0.00** | **54,388,600.00** | **30,231,302.00** | **4,552,717.00** | **34,784,019.00** | **18,141,884.62** | **4,236,820.43** | **22,378,705.05** |

**ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)**

මාසික ආදායම් පුරෝකථන වාර්තාවෙ ජූලි. හැබැයි මේකෙ තියනවා. කව්ද දන්නෙ නෑ මේක හැදුවෙ ජූලි කියලා දාලා ආයෙ තැනක තියනවා මැයි කියලා. මැයි ජූලි පැටලෙනවා.මේකෙ කඩකුලි කියන්නෙ මේකෙ ස්ථිර ආදායමක්.ස්ථිර ආදායම්වල 5,628,905.00.මේ අවසාන වාර්තාවෙ තියනවා දෙකෙන් ඒකයි මේකට ලැබිලා තියෙන්නෙ. මම මේකෙ මතු කලේ මේකෙ කළමණාකරණයේ දුර්වලතාවයක් තියනවා කියලා පෙන්වන්න.මේවා මේ යාවත්කාලීනව ප්‍රාදේශිය සභාවට එන ආදායම්. මේ වාර්තාව ලබන සභාවාරයට කල් දාන්න.

**(උ) V. 2026 මැයි මාසික වියදම් පුරෝකථන වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 04 සඳහා අනිත් පිට බලන්න**

# මාසික වියදම් පුරෝකථන වාර්තාව - 2026 මැයි

| අනු අංකය | වැය ශීර්ෂය | වාර්ෂික වියදම් ඇස්තමේන්තුව | | | වියදම් පුරෝකථනය | | | වැය කල මුදල | | | අතිරික්තය/ ඌනතාවය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අයවැය ලේඛනය | වැය ශීර්ෂ මාරු කිරීම / පරිපූරක | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | |
| 1 | වැටුප් දීමනා | 155,557,000.00 | | 155,557,000.00 | 51,807,000.00 | 12,950,000.00 | 64,757,000.00 | 44,420,508.56 | 11,450,258.76 | 55,870,767.32 | 8,886,232.68 |
| 2 | ගමන් වියදම් | 935,000.00 | | 935,000.00 | 225,000.00 | 50,000.00 | 275,000.00 | 223,775.00 | 76,648.00 | 300,423.00 | (25,423.00) |
| 3 | සැපයුම් හා උපකරණ | 18,846,500.00 | | 18,846,500.00 | 5,750,000.00 | 1,500,000.00 | 7,250,000.00 | 3,431,228.00 | 1,146,290.80 | 4,577,518.80 | 2,672,481.20 |
| 4 | ප්‍රාග්ධන වත්කම් අළුත් වැඩියාව හා නඩත්තුව | 26,306,000.00 | | 26,306,000.00 | 2,760,000.00 | 1,000,000.00 | 3,760,000.00 | 3,696,899.68 | 1,906,040.43 | 5,602,940.11 | (1,842,940.11) |
| 5 | ප්‍රවාහන සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා | 7,587,000.00 | | 7,587,000.00 | 1,800,000.00 | 700,000.00 | 2,500,000.00 | 842,088.41 | 156,383.83 | 998,472.24 | 1,501,527.76 |
| 6 | පොලී ගෙවීම් , ලාභාංශ සහ ප්‍රසාද මුදල් | - | | - | | - | - | - | - | - | - |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 8,681,000.00 | | 8,681,000.00 | 1,400,000.00 | 500,000.00 | 1,900,000.00 | 379,532.81 | 276,150.00 | 655,682.81 | 1,244,317.19 |
| 8 | විශ්‍රාම වැටුප් ,විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 532,500.00 | | 532,500.00 | 177,500.00 | 44,375.00 | 221,875.00 | 98,591.75 | 34,067.20 | 132,658.95 | 89,216.05 |
| 9 | උපකරණ වැය | 52,025,000.00 | | 52,025,000.00 | 10,700,000.00 | 4,100,000.00 | 14,800,000.00 | 142,729.78 | 550,000.00 | 692,729.78 | 14,107,270.22 |
| 10 | ණය ආපසු ගෙවීම් | - | | - | | | - | - | | - | - |
| | එකතුව | 270,470,000.00 | - | 270,470,000.00 | 74,619,500.00 | 20,844,375.00 | 95,463,875.00 | 53,235,353.99 | 15,595,839.02 | 68,831,193.01 | 26,632,681.99 |

**<u>ගරු මන්ත්‍රී ආර්. එච්. රංජිත් උපාලි මහතා - (ස්වාධීන)</u>**

ඊළඟට අයවැය ලේඛනයේ පූරෝකථන වාර්තාවට වියදම් වාර්තාවෙ ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුවලට අයවැය ලේඛණයෙන් වෙන් කරලා තියනවා.20,306,000.00. පුරෝකථනය කරනවා 3,696,899.680 ඊළඟට තියනවා 5,602,940.11.මේ සංඛ්‍යා ලේඛණ වැරදියි.මේකෙ අතිරික්තයක් පෙන්නනවා.1,842,940.11.මේකත් ලබන සභාවාරයට කල් දාන්න කියන ඉල්ලීම කරනවා.

**(ඖ). රැස්වීම කැඳවීමේ දැන්වීමේ වෙනත් කාරණා කිසිවක් දක්වා ඇත්නම්, ඒ කරුණු එහි දක්වා ඇති අනුපිළිවෙලට හෝ විශේෂ හේතු නිසා ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන අනුපිළිවෙලට - නැත.**

න්‍යාය පත්‍රානුකූලව ගරු සභාවේ කටයුතු අවසන් වූ බවත්,සභාවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දායක වූ සැමට ස්තූතිය පිරිනමන බවත් ගරු උප සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ප.ව.4.00 ට පමණ ගරු සභාවේ කටයුතු අවසන් කරන ලදී.

2026.07.14 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව ගරු සභාවේ එදින පැමිනි සිටි සභිකයන් විසින් සභා සම්මත කරන ලදි.